

වාර්ෂික වාර්තාව

ஆண்டு அறிக்கை

Annual Report

2022

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය

இலங்கை போக்குவரத்து சபை

Sri Lanka Transport Board

නො.200, කිරුළ පාර, කොළඹ 05

இல. 200 ,கிருல வீதி ,கொழும்பு 05

No .200 , Kirula Road , Colombo 05

වාර්ෂික වාර්තාව

2022

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය

පටුන

1. දැක්ම, මෙහෙවර, අරමුණ

2. හැඳින්වීම

3. සභාපතිතුමාගේ පණිවිඩය

4. කාර්ය සාධනය සහ ප්‍රගති සමාලෝචනය

5. මූල්‍ය වාර්තා

6. විගණකාධිපති වාර්තාව

දැක්ම

කලාපයේ විශිෂ්ඨතම මගී ප්‍රවාහකයා

මෙහෙවර

මහජනතාවට ආරක්ෂිත, විශ්වාසදායී, සුවපහසු මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවයක් සාධාරණ ගාස්තු ක්‍රමයක් යටතේ සේවයට කැපවූ ඵලදායී කාර්ය මණ්ඩලයක්, ආයතනයේ සියළුම සම්පත් උපරිම ප්‍රයෝජනයට ගනිමින් ආර්ථිකමය වශයෙන් තුලනාත්මකව පවත්වාගෙන යාම.

අරමුණු හා පරමාර්ථ

1. ප්‍රාදේශීය කාර්යාල 12 මගින් ඩිපෝවන් සඳහා උපදෙස් දීමත් ප්‍රධාන කාර්යාලය හා සම්බන්ධීකරණය කිරීම මගින් ගුණාත්මක,ප්‍රමාණාත්මක සහ කාර්යක්ෂමව හා ඵලදායී බස් සේවාවක් සැපයීම පිණිස කටයුතු ප්‍රවර්ධනය කිරීම.

2. පාසල් යන ළමයින් සඳහා සතුටුදායක බස් සේවාවක් සැපයීම.

3. මූල්‍යමය ප්‍රතිලාභ නොමැතිවීම හේතුකොටගෙන පෞද්ගලික බස්රථ ධාවකයින් විසින් අතහැරදමා ඇති ආදායම් නොලබන මාර්ගවල බස් සේවා යෙදවීම.

4. පිටකොටුව මධ්‍යම බස් නැවතුම් පොළේ සිට දුර පළාත් වලට දුර ගමන් සේවා සැපයීම.

5. රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ප්‍රවාහන නියෝජිත සම්බන්ධීකරණය කිරීම.

6. උත්සව, විශේෂ අවස්ථා, පාර්ලිමේන්තු/ පළාත් සභා මැතිවරණ ආදිය වැනි අවස්ථාවන් වලදී බස් සේවා සම්බන්ධීකරණය කිරීම.

7. තැපැල් සහ පුවත්පත් ප්‍රවාහනය කිරීම.

8. බස් ධාවනය සම්බන්ධයෙන් ප්‍රාදේශිකයන්, මහා භාණ්ඩාගාරය, ජාතික ප්‍රවාහන කොමිෂන් සභාව, පළාත් සභා අදාල අමාත්‍යාංශ සහ අනෙකුත් අදාල නියෝජිත ආයතන සමඟ සම්බන්ධීකරණය කිරීම.

9. ශ්‍රී ලංගමයේ රියදුරු පුහුණු පාසැල්වලින් මනා පුහුණුව ලැබූ විනයගරුක රියදුරන් සැපයීම.

10. රියදුරන්, කොන්දොස්තරවරුන්, යාන්ත්‍රික ශිල්පීන් සහ අධීක්ෂණ කාර්ය මණ්ඩලය වෙනුවෙන් සම්මන්ත්‍රණ වැඩමුළු පැවැත්වීම.

11. ප්‍රාදේශීය වැඩපොළවලින් නිෂ්පාදනය කරනු ලබන කට්ටල/ උප කට්ටල ඩිපෝවන් වෙත සැපයීම.

12. සිත්ගන්නා සුළු අඩුකල මිල ගණන් වලට වැඩිහිටියන් සහ ශිෂ්‍යයන් සඳහා වාර ප්‍රවේශපත්‍ර ලබාදීම.

13. පළාත් වැඩපොළවල් සඳහා ඉතා වැදගත් අමතර කොටස් නිකුත් කිරීම සඳහා නාරාහේන්පිට ශ්‍රී ලංගම ප්‍රධාන කාර්යාලයේ ගබඩාව පවත්වාගන යාම.

14. ඩිපෝවන් වල බස් ධාවනය සම්බන්ධයෙන් ආරක්ෂක විමර්ශන, හදිසි වැටලීම්, සෝදිසි කිරීම් ආදිය පැවැත්වීම.

හැඳින්වීම

සියලුම ආකාරයේ ප්‍රවාහන මාධ්‍යයන් රටේ ආර්ථික සංවර්ධනය සලකා නිසැකවම අත්‍යාවශ්‍ය වේ. මාර්ගස්ථ මගී ප්‍රවාහනය සම්බන්ධයෙන් එය විශේෂයෙන්ම අත්‍යාවශ්‍යවන්නකි. ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවතින රටක නගර සහ ග්‍රාම සම්බන්ධතාවය පවත්වාගැනීම පිණිස බස් සේවාව වැදගත් මෙහෙයක් ඉටුකරන අතර මුළු මහත් රටේම ඒකාබද්ධතාවය එමගින් ඇතිකරයි.

මාර්ග 1200 කට පමණ සම්පූර්ණයෙන් බස්රථ ධාවනයකරන ලද බස්රථ ධාවකයන් 80 දෙනෙකු පමණ විසින් දිවයින පුරා සපයන ලද බස් සේවා ද ලියාපදිංචි කල බස්රථ 3532 ක් ද 1957.10.31 දින 1957 අංක 48 දරණ මෝටර් රථ ප්‍රවාහන පනත මගින් ජනසතු කරන ලද අතර ඒ අනුව ලංකා ගමනාගමන මණ්ඩලය (ලං.ග.ම) 1958.01.01 දින සිට ක්‍රියාත්මක විය.

එවකට පටන් 1977 වර්ෂය දක්වා මාර්ගස්ථ මගී ප්‍රවාහනය සම්බන්ධයෙන් ලං.ග.ම ඒකාධිකාරිත්වයකින් ක්‍රියාත්මක වූයේය. 1978 අංක 19 දරණ ගමනාගමන මණ්ඩල ව්‍යවස්ථා මගින් ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩලය මගින් සම්බන්ධීකරණය කරනු ලබන ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩල 10ක් පිහිටුවා 1978 දී ලංගම විමධ්‍යගත කරන ලදී.

ප්‍රදේශයේ සහ පළාතේ අවශ්‍යතා පිළිබඳ වැඩි වශයෙන් සංවේදීවීමටත් ප්‍රදේශයේ ප්‍රවාහන ගැටළු සඳහා ක්ෂණික විසඳුම් ලබාදීමටත් කුඩා ඒකකවලට හැකිවන බව අපේක්ෂා කල බැවින්, විමධ්‍යගත කිරීමෙන් මගී ජනතාවගේ අවශ්‍යතා වඩා කාර්යක්ෂම හා ඵලදායී ලෙස ඉටු කිරීමට හැකි වෙතැයි රජය අදහස් කළේය.

කෙසේ වුවද ලං.ග.ම විසින් දරණ ලද පාඩු දිගින් දිගටමවැඩිවීම නිසාත් නිදහස් ආර්ථිකය පිළිබඳ නව සංකල්ප නිසාත් දිගින් දිගටම වැඩිවෙමින් පැවති මගී ඉල්ලුම සපුරාලීමට නොහැකි වීම නිසාත් මගින් ප්‍රවාහය කිරීම සඳහා පෞද්ගලික අංශයට ද අවසර ලබාදෙන ලදී.

රජයේ දැඩි විශ්වාසයකින් පෞද්ගලීකරණය මගින් රාජ්‍ය අංශය ප්‍රතිව්‍යුහගත කිරීමේ කොටසක් වශයෙන් ලං.ග.ම ජනතාකරණය කිරීමට කටයුතු කළේය. 1987 අංක 23 දරණ රජයේ සංස්ථා හෝ රජය සතු ව්‍යාපාර පොදු සමාගම් බවට පත්කිරීමේ පනත යටතේ ලංගම ජනතාකරණය කරන ලදී. ජනතාකරණය සිදු කල අවස්ථාවේදී පැවති ගමනාගමන මණ්ඩලය ඩිපෝ 93ක් වෙන් වෙන් වශයෙන් සීමාසහිත සමාගම් බවට පත්වූ අතර එම සමාගම් පාලනය කිරීම් සඳහා සේවකයන් අතුරෙන් අධ්‍යක්ෂමණ්ඩලයක් තෝරාගන්නා ලදී. එම සමාගම්වල සම්පූර්ණ කොටස් ප්‍රමාණයෙන් අඩක් කාර්ය මණ්ඩලය වෙත බෙදා දෙන ලද අතර ඉතිරි කොටස් මහා භාණ්ඩාගාරය සතුවිය. ජනතාකරණ වැඩසටහන 1990 වර්ෂයේදී ආරම්භකර 1994 වර්ෂයේදී අවසන් කරන ලදී. ජනතාකරණය අවධිමත් ලෙස ක්‍රියාත්මක කල බැවින් අපේක්ෂා කල ප්‍රතිඵල අත් නොවීය.

1991 අංක 37 දරණ ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත සංශෝධනය කිරීමෙන් ඉහත ඩිපෝ ඒකාබද්ධ කර පොකුරු බස් සමාගම් පිහිටුවන ලදී. සේවක අතිරික්තය, විනය බරපතල සේ බිඳවැටීම, අසාධාරණ තරහකාරිත්වය, පාසැල් සේවාවන්, අනාර්ථික සේවාවන් වැනි සමාජමය වගකීම, වෘත්තීමය දැනුමක් ඇති අයගේ භිඟය, අකාර්යක්ෂමතාවය, ධාවනය වැය ඉහල යෑම, දේශපාලන හා වෘත්තීය සමිති අනිසි බලපෑම් හා පැතිරී ගිය දූෂනයන් පොකුරු බස් සමාගම් බිඳවැටීමට හේතු වූ සමහර කරුණු වේ.

මෙම ප්‍රශ්නයට විසඳුමක් වශයෙන් "2005 අංක 27 දරණ ශ්‍රී ලංකා ගමනාගමන පනත" මගින් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය 2005.10.19 පිහිටුවන ලදී.

සභාපතිතුමාගේ පණිවිඩය

2022 වර්ෂය සඳහා වූ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ (ශ්‍රී ලංගම) වාර්ෂික වාර්තාව උත්තරීතර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට ලැබීම පිළිබඳ මා බෙහෙවින් සතුටු වෙමි. සමාලෝචනයට භාජනය වූ කාලසීමාව තුළ මා සභාපති නොවූවත්, 2022 වර්ෂය සඳහා ඉදිරිපත් කරනු ලබන වාර්තාව වෙනුවෙන් පණිවිඩයක් නිකුත් කිරීමට මම බැඳී සිටිමි.

දැනට ධාවනයට යොදවා ගත හැකි බස් රථ 6200 ක් පමණ ශ්‍රී ලගංම බස් රථ ඇණියේ තිබුණ ද 2022 වසර වන විට එය බස් රථ 5200 ක් දක්වා අඩු වී ඇත. එනම්, බස් රථ 1000 කට ආසන්න ප්‍රමාණයක් මධ්‍ය හා මහා පරිමාණ අලුත්වැඩියා හේතුවෙන් හා රියදුරු/ කොන්දොස්තර පුරප්පාඩු හේතුවෙන් ධාවනයෙන් ඉවත් වී ඇත. දැනට ශ්‍රී ලංගම බස්රථ ඇණියේ පවතින බස්රථ ප්‍රමාණයෙන් 50% ක පමණ වසර 10කට වඩා පැරණි බස්රථ වීම හේතුවෙන් නිතර නිතර ආපදාවන්ට ලක්වීම නොවැළැක්විය හැකි හේතුවක් වී ඇත. 2019 වසර වන විට ශ්‍රී ලංගම ලාභ ලබන ආයතනයක් බවට පත්කරගෙන තිබුණ ද 2020 මාර්තු මස සිට ගෝලීයව ව්‍යාප්ත වූ කොවිඩ් වසංගත තත්ත්වයේ දැඩි බලපෑම මෙරට තුළ ද ඇති වූ බැවින් 2020/2021 වසර තුළ පාඩු ලැබූ තත්ත්වයකට පත්ව ඇත. එහෙත් 2022 වසර පිළිබඳ සැළකීමේදී දෛනිකව ධාවනය කළ බස් රථ සංඛ්‍යාවේ සාමාන්‍ය අගය 4288 කි. එම බස් රථ ධාවනය කළ මුළු දුර ප්‍රමාණය මිලියන 346.8 km වන අතර, 2021 වසරට සාපේක්ෂව 39.09% ක වැඩිවීමක් දක්නට ලැබෙන අතර, සංඛ්‍යාත්මකව ධාවනය කළ දුර ප්‍රමාණයේ වැඩිවීම මිලියන 99 km කි.

2022 වර්ෂයේ මුළු පිරිවැටුම රු. මිලියන 66,350.10 වන අතර, මාර්ග ලේඛන ආදායම රු. මිලියන 54,956.78 කි. අනෙකුත් අතිරේක ආදායම් එකතු කළ විට සමස්ත ආදායම රු. මිලියන 70,923.45 ක් වන අතර, වාර්තා වී ඇති සමස්ත වියදම රු. මිලියන 70,439.27 කි. ඒ අනුව, 2022 වර්ෂයේ මෙහෙයුම් ලාභය ලෙස රු. මිලියන 484.21 ක ශුද්ධ ලාභයක් ලබාගැනීමට හැකි වී ඇත. පාසල් සිසුන් සඳහා වාර ප්‍රවේශපත්‍ර නිකුත් කිරීමේදී අයකරනු ලබන ගාස්තුව, ගමන් ගාස්තුවෙන් 7% ක් වන අතර, 93% ක සමාජ සුභ සාධන ප්‍රතිදානය මහා භාණ්ඩාගාරය මගින් ලබාදීම අඛණ්ඩව සිදු වුව ද, 2022 වසර වන විට ජාතික අයවැයෙන් වෙන්කළ ප්‍රතිදාන මුදලෙන් නොලැබුණු මුදල් ප්‍රමාණය රු. මිලියන 7,688.3 කි. එය මූල්‍යමය වශයෙන් මණ්ඩලයේ කාර්යසාධනය හා ප්‍රගතිය පෙන්වීමට සෘජුව බලපා ඇත.

2022 වර්ෂයට අදාළව මහා භාණ්ඩාගාරය විසින් ජාතික අයවැයෙන් බස් රථ පුනරුත්ථාපනය සඳහා වෙන්කළ රු. මිලියන 750 ක ප්‍රතිදානයෙන් වැය කළ හැකි වූ මුදල රු. මිලියන 606 කි. විශේෂයෙන් වෙළඳපොලෙහි අමතර කොටස් හිඟ වීම, යම් යම් සැපයුම් සඳහා ආනයන සීමා පැනවීම, සැපයුම්කරුවන්ට ණයවර ලිපි විවෘත කර ගැනීමට දැඩි බාධාවන් ඇති වීම, ශ්‍රී ලංගම සැපයුම් දාමය බිඳ වැටීමට හේතු විණි. එහෙත්, බස් රථ පුනරුත්ථාපනය සඳහා දරන ලද වියදමෙන් එන්ජින් 234 ක් ද, ගියර් පෙට්ටි 136 ක් ද, බස් බොඩි 150 ක් ද, අලුත්වැඩියා කර තිබෙන අතර, 2023 වසරේ ජනවාරි වන විට තවදුරටත් අලුත්වැඩියා කර ගැනීමට බස්රථ 852 ක් පැවති බවද, පෙන්වා දෙනු කැමැත්තෙමි.

2022 මාර්තු මස සිට රටේ පැවති අරගලකාරී හා ආර්ථික අර්බුදය ද බස් රථ මෙහෙයුම් කටයුතු සඳහා දැඩි බලපෑමක් එල්ල කළ අතර, ඒ හේතුවෙන් සැලකිය යුතු ආදායමක් ශ්‍රී ලංගමට අහිමි වූ අතර, ශ්‍රී ලංගම මගින් සැලසුම් කළ විවිධ සංවර්ධන කටයුතු අවසන් කර ගැනීමේ ඉඩ ප්‍රස්ථාවක් එමගින් ඇහිරිණි. කෙසේ වුව ද, 2023 වර්ෂය ආරම්භ වන විට දිනකට මුදාහැරිය හැකි බස් රථ 5,200 ප්‍රමාණයෙන් බස් රථ 4,800 ක් පමණ ධාවනයකර වීමට සැලසුම් කර ඇති අතර, දෛනික මාර්ග ලේඛන ආදායමේ සාමාන්‍ය අගය රු. 155.00 ක අගයක රඳවා ගැනීමට හැකි වීම, 2023 වසරේ ආදායම් ඉලක්ක සපුරා ගැනීමට සාධනීය ලක්ෂණ පෙන්නුම් කරනු ලබයි. එමෙන්ම ඉන්දියානු ණය ආධාර ක්‍රමය යටතේ ආසන 32 සහිත බස් රථ 500 ක් ලබාගැනීම ද, පුරප්පාඩු වී ඇති රියදුරු තනතුරු 800 ක් හා කොන්දොස්තර තනතුරු 280 ක් සඳහා බඳවා ගැනීම් කිරීමට රජය මගින් ලබා දී ඇති අනුමැතිය 2023 වසරේ ආදායම් ඉලක්ක සපුරා ගැනීම සඳහා හේතු වනු ඇත.

2023 වසර වන විට ශ්‍රී ලංගමට අභියෝග ජය ගැනීම සඳහා මෙන්ම නව ඉලක්ක සපුරාගැනීමේ වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කිරීමට සිදු වී ඇත. ඉන් ප්‍රමුඛ වන්නේ දූෂණ හා අක්‍රමිකතා මුලිනුපුටා දැමීම, විනිවිද භාවයකින් යුත් ප්‍රසම්පාදන ක්‍රියාවලියක් මගින් සැපයුම් දාමය ශක්තිමත් කිරීම, ප්‍රවාහන සේවය නවීකරණය කිරීම සඳහා විශේෂයෙන් සුඛෝපභෝගී සහ විදුලි බස්රථ මෙහෙයුම් ආරම්භ කිරීම, වියදම් පාලනය වැනි කටයුතු ද සිසු සැරිය හා ග්‍රාමීය මගී ප්‍රවාහන සේවා ව්‍යාප්ත කිරීම, සංචාරක හා භාණ්ඩ ප්‍රවාහන සේවා වැනි ආදායම් ප්‍රවර්ධන වැඩසටහන් හඳුන්වා දීම සිදු කළ යුතු ය. තව ද, මහා භාණ්ඩාගාරයත්, ප්‍රවාහන

අමාත්‍යාංශයත්, ශ්‍රී ලංගමත් ඒකාබද්ධව අත්සන් කරන ලද සාමූහික අවබෝධතා ගිවිසුමේ කොන්දේසි ද සපුරාලිය යුතුය. මේ සියලු කරුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සැලසුම් කරනු ලබන, උපාය මාර්ගික ප්‍රවේශයන් කඩිනමින් ආරම්භ කිරීමත්, කාර්යක්ෂමව හා ඵලදායීව ක්‍රියාත්මක කිරීමත් 2023 වර්ෂයේ අභිලාෂයන් වී ඇත. දියුණු වෙමින් පවතින රටවල ප්‍රවාහන ක්ෂේත්‍රයේ සංවර්ධනය දෙස බලන විට ශ්‍රී ලංගම ප්‍රවාහන සේවා නවීකරණය වීම ඉතා මන්දගාමී අයුරින් සිදුවීම සැලකිල්ලට ගෙන අවම වශයෙන් වසර 2030 වන විට යා යුතු ගමන් මග සැලසුම් කොට ක්‍රමිකව ක්‍රියාත්මක කිරීම අත්‍යාවශ්‍ය කරුණක් බවට පත්වී ඇත.

අවසාන වශයෙන් 2022 වසර තුළ ශ්‍රී ලංගම සියලු කටයුතු වෙනුවෙන් උපදෙස් හා මග පෙන්වීම් කළ ප්‍රවාහන විෂය භාර ගරු අමාත්‍යතුමා, රාජ්‍ය අමාත්‍යතුමා, අමාත්‍යාංශවල ලේකම්තුමන්ලාට මෙන්ම මණ්ඩලයේ මෙහෙයවීම හා දැක්ම සාක්ෂාත් කරගැනීම සඳහා කැප වූ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩල සමස්ත කාර්යය මණ්ඩලයට සහ අධ්‍යක්ෂ මණ්ඩලයට මෙන්ම මහා භාණ්ඩාගාරයේ නිලධාරීන්ට ද ඔවුන් විසින් ලබාදී ඇති දායකත්වය වෙනුවෙන් ස්තූතිවන්ත වන අතර, 2023 වසරේදී අපේක්ෂිත ඉලක්ක කරා ළඟාවීමට ඔවුන්ගේ නොමද සහාය ද තවදුරටත් අපේක්ෂා කරමි.

ඉංජි. එස්.එම්.ඩී.එල්.කේ. ද අල්විස්
සභාපති,
ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය.

ධාවන කොට්ඨාශය

01. 2022 වර්ෂය තුල ධාවනයට දිනකට ලබාදුන් සාමාන්‍ය බස්රථ ප්‍රමාණය 4,933ක් වූ අතර දිනකට ධාවනය කරන ලද සාමාන්‍ය බස්රථ ප්‍රමාණය 4,269 ක් පමණ වේ. දිනකට ධාවනය කළ සාමාන්‍ය කිලෝමීටර් ප්‍රමාණය මිලියන 0.96 ක් පමණ වේ. උපයනු ලැබූ සාමාන්‍ය දෛනික මාර්ග ලේඛන ආදායම මිලියන 147 ක් වූ අතර එය කිලෝමීටරයකට රු 153.70 කි.

02. ශ්‍රීලංගම මගින් සපයනු ලබන ප්‍රථම සහ රාත්‍රී ගමන්වාර තරකිරීමත් මගී අවශ්‍යතාවය අනුව එම සේවා වර්ධය කිරීමටත් අවශ්‍ය පියවර ගෙන ඇත.

03. ශ්‍රී ලංගම බස්රථ සේවා සහ දුම්රිය ඒකාබද්ධ සේවය වර්ධනය කිරීම අරමුණ කරගෙන මගී අවශ්‍යතාවය සැලකිල්ලට ගෙන දුම්රිය ස්ථානවල සිට ආරම්භකරන බස් රථ සේවා වර්ධනය කිරීමටත් නව සේවා ආරම්භ කිරීමටත් පියවර ගෙන ඇත.

04. සිසුසැරිය ව්‍යාපෘතිය යටතේ සිසුසැරිය බස්රථ සේවාවන් 741 ක් දක්වා වර්ධනය කිරීමට හැකියාව ලැබී ඇති අතර ඉදිරියටත් සිසුන්ගේ සහ පාසල්වල අවශ්‍යතාවය සහ ඉල්ලීම් සලකා බලා මෙම සේවාව තවදුරටත් පුළුල් කිරීමට අවශ්‍ය විධිවිධාන සකස්කර ඇත.

05. සියළුම බස්රථ සඳහා විද්‍යුත් ටිකට්මැෂින් යොදාගැනීම තුලින් බස්රථ මගින් මගීන්ට සැපයෙන සේවා කාර්යක්ෂමතාවය ඉහල නංවා ගැනීමටත් ඵලදායීතාවය වර්ධනය කරගැනීමටත් හැකියාව ලැබී ඇත.

06. මගී පහසුව උදෙසා අන්තර් ජාලය හරහා ආසන වෙන්කරගැනීමේ පහසුකම් සහිත බස්රථ 550 ක් දක්වා වර්ධනය කර ඇති අතර ආසන වෙන් කිරීමේ කවුළු 31 ආරම්භ කර ඇත. 2023 වර්ෂයේදී තව දුරටත් මෙම සේවා වර්ධනය කිරීමට අපේක්ෂිතයි.

සමාජ ප්‍රතිලාභ සඳහා ශ්‍රී ලංගම දායකත්වය

අළුයම ප්‍රථම හා රාත්‍රී අවසන් ගමන්වාර ධාවනය

අළුයම ප්‍රථම සහ රාත්‍රී අවසන් ගමන්වාර සැපයීම තුලින් රටේ ආර්ථිකයේ ශ්‍රම බලකාය සංචලනයට දායකත්වය සෘජුවම දායක වන නමුත් මෙම සේවාව තුලින් ශ්‍රී ලංගමයට අතීතයේ සිට හිමිව ඇතිතේ කීර්තිනාමය පමණි. නමුත් ශ්‍රී ලංගම සිදු කරනු ලබන තවත් සමාජීය වගකීමක් ලෙස සලකා මෙම සේවාව මගී ජනතාවගේ සුවපහසුව පිණිස අඛණ්ඩවම ක්‍රියාත්මක කෙරේ.

ග්‍රාමීය ප්‍රදේශයන්හි බස්රථ ධාවනය

ග්‍රාමීය ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා ගම සහ නගර යා කිරීමේ ප්‍රබලතම ප්‍රවාහන මාධ්‍ය ලෙස සෘජුව දායකත්වයක් ලබාදෙනු ලබන්නේ ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයයි. මගීන්ගේ අවශ්‍යතා සලකිල්ලට ගනිමින් මෙම සේවා අඛණ්ඩව සැපයීම සඳහා සෑම විටම කටයුතු කරන අතර ඉදිරියේදීද නව බස්රථ මිලදී ගෙන මෙම සේවාව වර්ධනය කිරීමට සැලසුම් සකස්කර ඇත්තේ ග්‍රාමීය ආර්ථිකය ඉහල නැංවීමට ග්‍රාමීය ප්‍රවාහනය විධිමත් කිරීම අත්‍යාවශ්‍ය සාධකයක් වන බැවිනි.

පාසල් සේවා බස්රථ ධාවනය

ශ්‍රී ලංගම විසින් දැයේ හෙට දිනය වෙනුවෙන් පාසල් ළමුන් ප්‍රවාහනය සඳහා විශාල සේවාවක් ඉටු කරනු ලබයි. මගී අවශ්‍යතාවය වැඩි කාලය තුළ ඉහල ලාභයක් ඉපයීමට හැකියාව ඇති අවස්ථා අහිමි කර ගනිමින් දැයේ අනාගත පරපුර නියමිත වේලාවට පාසලට රැගෙන යාම සහ ආපසු නිවෙස් බලා ආරක්ෂිතව ප්‍රවාහනය කිරීම සඳහා ශ්‍රී ලංගම සතු බස්රථ මගින් ප්‍රශස්ථ සේවාවක් සපයනු ලැබේ

ලේකම් කොට්ඨාශය

2022 වර්ෂයේ පැවැත්වූ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්

2022 වර්ෂයෙහි පැවැත් වූ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර ගණන

01 වන රැස්වීම	-	2022/01/20
02 වන රැස්වීම	-	2022/02/23
03 වන රැස්වීම	-	2022/03/25
04 වන රැස්වීම	-	2022/04/08
05 වන රැස්වීම	-	2022/05/05
06 වන රැස්වීම	-	2022/06/02
07 වන රැස්වීම	-	2022/07/22
08 වන රැස්වීම	-	2022/08/19
09 වන රැස්වීම	-	2022/11/02
10 වන රැස්වීම	-	2022/11/16

2022 වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 10 ක් පවත්වා ඇත.

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ඉහත අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පැවැත්වීමට අදාළ කටයුතු

1. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම පැවැත්වෙන දිනය සඳහන් කර සියලුම අධ්‍යක්ෂ මණ්ඩලීය සාමාජිකයන් වෙත හා ශ්‍රී ලංගම කොට්ඨාශ/අංශ ප්‍රධානීන් වෙත නිවේදන නිකුත් කිරීම.

2. අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා භාරගෙන පත්‍රිකා අංක යොදා ලේඛනගත කිරීමෙන් අනතුරුව ගොනු සකසා, අධ්‍යක්ෂ මණ්ඩලීය සාමාජිකයන් වෙත භාරදීම.

3. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලට ඉදිරිපත් කෙරෙන අධ්‍යක්ෂ මණ්ඩලීය පත්‍රිකා පිළිබඳව හා වක්‍ර ලිපි පිළිබඳව සඳහන් කර අධ්‍යක්ෂ මණ්ඩලීය රැස්වීමේ න්‍යාය පත්‍රය සැකසීම.

4. න්‍යාය පත්‍රයට අනුව හා සභාපතිතුමාගේ උපදෙස් මත අධ්‍යක්ෂ මණ්ඩලීය පත්‍රිකා හා වක්‍රලිපි සභාගත කිරීම.

5. ඒ ඒ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවට හා වක්‍ර ලිපියට අදාළව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලබාදෙන තීරණය හා ආනුෂංගික උපදෙස් නිවැරදිව වාර්තා කර අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණ අයිතම අංක අනුව සටහන් කිරීම.

6. එසේ සටහන් කළ අධ්‍යක්ෂ මණ්ඩල තීරණයන් වලට අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලද පසු එම අධ්‍යක්ෂ මණ්ඩල තීරණයන් වල උධෘතයන් එම අධ්‍යක්ෂ මණ්ඩල තීරණයන් ක්‍රියාත්මක කළයුතු ශ්‍රී ලංගම කොට්ඨාශ ප්‍රධානීන්/ අංශ ප්‍රධානීන් වෙත භාරදීම.

7. මෙම සියලුම කටයුතු නිවැරදිව, රහස්‍යභාවයෙන් යුතුව හා විධිමත්ව ඉටු කිරීම.

8. ශ්‍රී ලංගම අධ්‍යක්ෂ මණ්ඩලීය සාමාජිකයන් වෙත හා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලට ආරාධනා ලද කොට්ඨාශ හා අංශ ප්‍රධානීන් වෙත සංග්‍රහ ලබාදීම.

9. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලට සහභාගිවන (ශ්‍රී ලංගම නිලධාරීන් නොවන) අධ්‍යක්ෂ මණ්ඩලීය සාමාජිකයන්ට සහභාගිත්ව දීමනා ගෙවීමේ කටයුතු සිදුකිරීම.

10. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලට සහභාගි වන (ශ්‍රී ලංගම නිලධාරීන් නොවන) අධ්‍යක්ෂ මණ්ඩලීය සාමාජිකයන්ට ප්‍රවාහන දීමනා ගෙවීමේ කටයුතු සිදුකිරීම

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ඉඩකඩම් වලට අදාළ කටයුතු ඉටුකිරීම.

1. රජයට අයත් ඉඩමක් වන ශ්‍රී ලංගම ශාලිකා ක්‍රීඩාංගණය හා උත්සව ශාලාව පිහිටි ඇන්ඩර්සන් ගොල්ෆ් ලින්ක් පිටිය නැමැති ඉඩම, රජයේ ඉඩම් ආඥා පනත යටතේ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය වෙත අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි නිදහස් දීමනා පත්‍රයක් මඟින් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු කිරීමේදී අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව රජය වෙත ගෙවිය යුතුව ඇති 1966 වර්ෂයේ නොදියුණු තක්සේරු වටිනාකම වන රු: 3,271,345/- ක මුදල ශ්‍රී ලංගම අධ්‍යක්ෂ මණ්ඩල තීරණයට අනුව මහජන බැංකුවේ යුනියන් පෙදෙස ශාඛාවේ අංක: 173026 හා 2022/03/31 දිනැති චෙක්පත මඟින් තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් වෙත ගෙවීම් කර ඇත. ඒ සඳහා තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන්අංක:R829515 හා 2022/04/29 දිනැති මුදල් භාර ගැනීමේ කුවිතාන්සිය නිකුත් කර ඇත.

   ඒ අනුව, තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් විසින් ගොනුව සම්පූර්ණ කර ඉඩම් කොමසාරිස් ජෙනරාල් වෙත යවා ඇත. මේ වන විට අදාල දීමනා පත්‍රය ඉඩම් කොමසාරිස් ජනරාල් කාර්යාලයෙන් සැකසීමට ඇත.

2. ශ්‍රී ලංගම ප්‍රධාන කාර්යාලය පිහිටි අංක 200 කිරුළ පාර පරිශ්‍රය සඳහා 2022 වර්ෂය සඳහා කොළඹ මහ නගර සභාව වෙත ගෙවිය යුතු වරිපනම් වන්දි මුදල ලෙස රු: 1,524,600.00ක මුදල චෙක්පත් අංක: 160242 හා 2022/01/07 දිනැති මහජන බැංකු චෙක්පත මඟින් ගෙවීම් සිදු කර ඇත.

3. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය පිහිටි රජයේ ඉඩම සඳහා තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් වෙත ගෙවිය යුතු වාර්ෂික බදු මුදල වන රු: 15,000ක මුදල මහජන බැංකුවේ යුනියන් පෙදෙස ශාඛාවේ චෙක්පත් අංක: 197173 හා 2022/08/17 දිනැති චෙක්පත මඟින් තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් වෙත ගෙවා ඇත. ඒ සඳහා තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අංක R829677 හා 2022/09/23 දිනැති මුදල් භාර ගැනීමේ කුවිතාන්සිපත ලබා දී ඇත.
4. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ඒකල වැඩපළ පිහිටි ඉඩම සඳහා අමාත්‍ය මණ්ඩල තීරණයකට අනුව නිදහස් දීමනාපත්‍රය ලබා දීමට අදාළ කටයුතු ඉඩම් කොමසාරිස් ජෙනරාල් කාර්යාලය මඟින් සිදු වී ඇති අතර,නිදහස් දීමනා පත්‍රය සකසා ඉඩම් අමාත්‍යාංශයෙන් ජනාධිපති ලේකම් කාර්යාලය වෙත යවා ඇති බව දුරකථනය මඟින් ප්‍රගතිය විමසීමේදී දන්වා ඇත.

5. දැරණියගල ඩිපෝව පිහිටි ඉඩම, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව මඟින් විකුණුම්කරයක් මඟින් ලබාගැනීමට අදාළව සියලුම ගෙවීම් සිදුකර ඇති අතර, එම ඉඩමට අදාළ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවෙන් ඔප්පු ලබාගැනීමට කටයුතු කරමින් පවති.

6. ශ්‍රී ලංගම භුක්තිවිඳිමින් සිටින ඉඩම් වල නිරවුල් අයිතිය ලබාගැනීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා සම්බන්ධීකරණය වෙමින් කටයුතු කරනු ලබයි. මේ අනුව, අම්බලන්ගොඩ ශ්‍රී ලංගම ඩිපෝ ඉඩමට අදාළව ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ පැවරුම් සහතිකය ලබා ගැනීම පිණිස අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ප්‍රවාහන හා මහා මාර්ග අමාත්‍යාංශ හා සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය යන අමාත්‍යාංශ මට්ටමින් කටයුතු සිදු වෙමින් පවතී.

7. නාගරික සංවර්ධන අධිකාරියෙන් ශ්‍රී ලංගමට හිමිවිය යුතු මුදල් ලබාගැනීම සඳහා කටයුතු කර ඇත. මෙහිදී මහරගම නගර සංවර්ධනය සඳහා 2004 වර්ෂයේදී නාගරික සංවර්ධන අධිකාරිය විසින් භුක්තිය භාරගත් ඉඩම් කොටස ඇතුලත් (ශ්‍රී ලංගම මහරගම ඩිපෝව ඉදිරිපස පිහිටි) තහනම්කැලේවත්ත නැමැති කොටස් 03කින් යුතු ඉඩම සඳහා ශ්‍රී ලංගමයට හිමිවිය යුතු රුපියල් මිලියන 112ක වන්දි මුදල මහරගම ප්‍රාදේශීය ලේකම් වෙතින් හා නාගරික සංවර්ධන අධිකාරිය වෙතින් අයකර ගැනීමට අදාළව 2022/06/15 දින සංචාරක හා ඉඩම් අමාත්‍යාංශයේදී, අමාත්‍යාංශ මට්ටමින් පැවති සාකච්ඡා වලට අනුව වන්දි ගෙවිය යුතු පාර්ශවය වන නාගරික සංවර්ධන අධිකාරිය හා මහරගම ප්‍රාදේශිය ලේකම් යන පාර්ශව විසින් වගකීම භාරගෙන ඇත. ඒ අනුව, වන්දි ගෙවීම් සඳහා ක්‍රියා මාර්ග ගනිමින් පවතී.

8. ශ්‍රී ලංකා යුධ හමුදා මූලස්ථානය ඉදිකිරීමට අදාලව ශ්‍රී ලංගම තලංගම ඩිපෝ ඉඩමෙන් අක්කර 05ක ප්‍රමාණයක් ලබා ගැනීමට ආරක්ෂක අමාත්‍යාංශ විසින් උත්සහ කළද, ශ්‍රී ලංගම ලේකම් කොට්ඨාශයේ දැඩි කැපවීම මත එම ඩිපෝ ඉඩම ශ්‍රී ලංගම භාරයේ රඳවා ගැනීමට සමත් විය. එසේම මෙම ඩිපෝ ඉඩම අත්කර ගැනීමට අදාල ලේඛන

කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නොතිබුණු බැවින් දැඩි පරිශ්‍රමයක් දරා අදාල ලිපි ගොනුවක් සකස් කර 44 වන වගන්ති යටතේ පැවරුම් සහතිකය ලබා ගැනීමට ඉල්ලුම් කර ඇත.

ඒ අනුව, ජාතික හා ප්‍රාදේශීය මට්ටමේ පරිපාලන සංකීර්ණ ඉදිකිරීම සඳහා අත්කර ගැනීමට ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 (අ) වගන්තිය යටතේ ගැසට් නිවේදනය පළ වී ඇති අක්කර 4.5 (හෙක්ටයාර් 1.9084)ක් පමණ වන තලංගම ඩිපෝ ඉඩමේ අදාල කොටස ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම සඳහා අදාල ගැසට් නිවේදනය පළ කර ඇත. ඒ අනුව තලංගම ඩිපෝව පිහිටි සම්පූර්ණ ඉඩම සඳහා ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ ලබා දෙන 44 වගන්තිය යටතේ වන පැවරුම් සහතිකය ශ්‍රී ලංගමයට ලබා දෙන ලෙසට නැවත වරක් ඉල්ලා ඇත.

9. 2004/12/26 දින සුනාමි රළ පහරින් විනාශයට පත් වූ එවකට පැවති ශ්‍රී ලංගම පෙට්ටිගලවත්ත පැඩපළ පිහිටි ඉඩම 2007 වසරේ දී අමාත්‍ය මණ්ඩල තීරණයකට අනුව ව්‍යක්තීය හා කාර්මික පුහුණු අමාත්‍යවරයාගේ ඉල්ලීමකට අනුව ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය (NIBM) ගාල්ල ශාඛාව පිහිටුවීම සඳහා ලබාගෙන තිබිණි. එම ඉඩමට අදාළව ශ්‍රී ලංගම හිමිකම තහවුරු කරගැනීම සඳහා කරුණු ඉදිරිපත් කිරීමේ දී එම ඉඩම රජයට අයත් ඉඩමක් ද නොඑසේ නම් ශ්‍රී ලංගමයට අයත් ඉඩමක් ද යන්න තහවුරු කරගතයුතුව තිබුණි.

ඒ අනුව 2007 වසරේ සිට අඛණ්ඩව කරුණු ඉදිරිපත් කරමින් මෙම ඉඩම 1957 අංක 48 දරණ මෝටර් ගමනාගමන පනත යටතේ ශ්‍රී ලංගමයට හිමි වී ඇති බව අප විසින් පෙන්වා දීමෙන් අනතුරුව 2022/03/14 දින ඉඩම් අමාත්‍යාංශයේ දී පැවති සාකච්ඡාවේ දී අවසාන වශයෙන් මෙම ඉඩම ශ්‍රී ලංගමයට අයත් බව පෙන්වා දීමෙන් පසුව ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය (NIBM) වෙත ඉඩම පවරා දී ඉඩමේ තක්සේරු වටිනාකම වන රුපියල් මිලියන 35 (රු.35,000,000) ක මුදල ලබාගැනීම සඳහා අවසාන වරට 2022/07/22 දින පැවති ශ්‍රී ලංගම අධ්‍යක්ෂ මණ්ඩල තීරණය ලබාගෙන ඉදිරි කටයුතු සඳහා ශ්‍රී ලංගම නීති කොට්ඨාශය මගින් ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය වෙත සියලු ලේඛන ඉදිරිපත්කර ඇත.

ඒ අනුව පැවරුම් ඔප්පුවක් සකස්කර ශ්‍රී ලංගමයට හිමිවිය යුතු ඉහත සඳහන් රු.35,000,000/- ක මුදල ලබාගැනීමට නියමිතය.

10. තලාතුඔය මුදුනකඩේ පිහිටි ශ්‍රී ලංගම තලාතුඔය ඉඩම 2007 වසරේ දී ශ්‍රී ලංකා නාවික හමුදාව වෙත භුක්තිය භාරදීමෙන් අනතුරුව ශ්‍රී ලංගමයට හිමිවිය යුතු අදාළ දේපළෙහි තක්සේරු වටිනාකම වන රු.33,936,000/- ක මුදල ලබාගැනීම සඳහා අඛණ්ඩව කරුණු ඉදිරිපත් කිරීමෙන් අනතුරුව මේ වන විට ඉඩම් කොමසාරිස් ජෙනරාල් කාර්යාලය වෙත ඉදිරි කටයුතු සඳහා සියලු තොරතුරු ඉදිරිපත් කර ඇත. ඒ අනුව ඉඩම් කොමසාරිස් ජෙනරාල් කාර්යාලයේ උපදෙස් මත ඉදිරි කටයුතු සිදුවෙමින් පවති.

11. ශ්‍රී ලංගම මොණරාගල ඩිපෝව පිහිටි ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු කුමාරවත්ත නමැති ඉඩමේ අක්.05 රූඩ්.01 පර්.17 ක ප්‍රමාණය සම්බන්ධයෙන් ශ්‍රී ලංගම විසින් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත ගෙවිය යුතු මුදල වන පරිහරණ ගාස්තු, තක්සේරු හා සේවා ගාස්තු SSCL 2.5% සහ එකතුකල අගය මත 15% බද්ද යන ගාස්තූන් සඳහා මහජන බැංකු යුනියන් පෙදෙස ශාඛාවේ 2022/11/11 දිනැතිව වෙක්පත් අංක:212488 සහ වෙක්පත් අංක:212487 යන වෙක්පත් දෙක පිළිවෙලින් රු.385,000/- ක් හා රු.285,799.72 ක වටිනාකමින් යුතු වෙක්පත් දෙක මගින් ගෙවීම් කටයුතු සිදුකර ඇති අතර, මෙම ඉඩමේ ඔප්පු ලබාගැනීමේ ඉදිරි කටයුතු සිදුවෙමින් පවතී.

12. 2022/10/10 වන දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීම සඳහා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය භුක්ති විඳින ඉඩම්වල හිමිකම් තහවුරු කරගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතියක් ඉල්ලා අමාත්‍ය මණ්ඩලය වෙත අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් යොමු කරන ලදී. එම අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවට අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දී ඇති අතර එම අමාත්‍ය මණ්ඩල අනුමැතියට අනුව ඉඩම්වල හිමිකම නිරවුල් කරගැනීම සඳහා අවශ්‍ය ඔප්පු දීමනාපත්‍ර ඇතුළු ඉඩම් නිරවුල් කරගැනීමට අවශ්‍ය ලේඛන ලබාගැනීමට කටයුතු කිරීම.

13. මොණරාගල ඩිපෝව සඳහා ඔප්පු ලබාගෙන නොමැති බැවින් ඔප්පු ලබාගැනීම සඳහා 2022/03/03 දිනැති ලිපි යොමු කර, තවද මේ පිළිබඳව ශ්‍රී ලංගම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පත්‍රිකා අංක 55 මගින් කරුණු වාර්තා කර එම තීරණ පරිදි ඔප්පු ලබාගැනීම සඳහා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත 2022/06/06 දිනැතිව ඉල්ලීමක් සිදුකර ඇත.

එසේ තිබිය දී 2022/10/13 දිනැතිව ඉ.ප්‍ර.කො. සභාවේ වන්දි ගාස්තු ගෙවීම සඳහා යොමු කළ ඉල්ලීම සඳහා 2022/11/02 දින පැවති ශ්‍රී ලංගම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත කරුණු ඉදිරිපත් කර එම තීරණ පරිදි දක්වා ඇති 2022/11/03 දිනැති ලිපියට අනුව මුදල් ගෙවීම සඳහා කටයුතු සිදුකරමින් පවතී. එම මුදල් ගෙවා පසුව ඉඩමට අදාළ ඔප්පු ගාස්තු ගෙවා ඔප්පු ලබාගැනීමට පමණක් නියමිතය.

14. ශ්‍රී ලංගම වැල්ලවාය ඩිපෝ ඉඩම මැනුම්කර ඔප්පු හා පිඹුරුපත්කර ඇති අතර, ඒ අනුව පිඹුරුපත ලියාපදිංචි කර ඇත. ඒ අනුව ඉ.ප්‍ර.කොං. කොමිෂන් සභා තීරණයට අනුව ඔප්පු ගාස්තු ගෙවා ඔප්පු ගෙවා ඉදිරි කටයුතු කිරීමට නියමිතය.
15. ශ්‍රී ලංගම කොත්මලේ ඩිපෝ ඉඩම සම්බන්ධයෙන් ශ්‍රී ලංගම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත කරුණු වාර්තාකර ඇති අතර, ඒ අනුව ප්‍රාදේශීය ලේකම්තුමා වෙත ඔප්පු ලබාගැනීම සඳහා ඉල්ලීමක් කර ඒ අනුව මැනුම් කර පිඹුරුපත් සකස්කර ඇත. ඔප්පු ලබාදීම සම්බන්ධ උපදෙස් ලබාගැනීම සඳහා ප්‍රාදේශීය ලේකම් මගින් ඉඩම් අත්පත් කරගැනීමේ නිලධාරියා වෙත ලිපි යොමු කර ඇත. එම උපදෙස් ලබාගෙන ඔප්පු ලබාගැනීමට නියමිතය.

16. නුවරඑළිය ප්‍රාදේශීය කාර්යාලය පිහිටි ඉඩම සඳහා 44 වගන්තිය යටතේ පැවරුම් සහතිකයක් නොමැති බැවින් අදාළ පැවරුම් සහතිකය ලබාගැනීම සම්බන්ධයෙන් සම්පූර්ණ වාර්තාවක් 2022/03/15 දිනැතිව යොමු කර ඇති අතර ඒ අනුව ප්‍රාදේශීය ලේකම් මගින් ඉඩම් අමාත්‍යාංශයේ ලේකම් වෙත ඊට අදාල උපදෙස් ඉල්ලා ලිපි යොමුකර ඇත. එම උපදෙස් අනුව පැවරුම් සහතිකය ලබාගැනීමට කිරීමට නියමිතය.

17. ශ්‍රී ලංගම වලපනේ ඩිපෝ ඉඩම සඳහා 44 වගන්තිය යටතේ පැවරුම් සහතිකය ලබාගැනීම සඳහා ප්‍රාදේශීය ලේකම් වෙත ඉල්ලීමක් සිදුකර ඇති අතර, ඒ සඳහා ප්‍රාදේශීය ලේකම් වෙත වන්දි මුදල් ශ්‍රී ලංගම මගින් ගෙවා අවසන්කර ඇතත්, 10 වන වගන්තිය යටතේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත වන්දි මුදල් ලබාගෙන නොමැති බැවින්, ඒ සම්බන්ධ ගැටලුව විසඳාගැනීම සඳහා ඉඩම් අමාත්‍යාංශයේ ඉඩම් අත්පත් කරගැනීම සඳහා උපදෙස් ලිපියක් යොමු කර ඇත. එම උපදෙස් පරිදි ශ්‍රී ලංගම වෙත හිමිකම තහවුරු කර ලබාගත ගැනීමට නියමිතය.

18. වලපනේ බස් නැවතුම්පළ සම්බන්ධයෙන් හිමිකම ලබාගැනීම සඳහා 2021/12/22 දිනැතිව ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත ඉල්ලීමක් සිදුකර ඇත. එම ඉල්ලීම සඳහා මේ වනතෙක් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව මගින් ප්‍රතිචාර දක්වා නොමැති අතර, ඔප්පු ලබාගැනීම සඳහා ඉදිරි කටයුතු කිරීමට නියමිතය.

19. ගෙලිඔය බස් නැවතුම්පළ සඳහා ප්‍රාදේශීය ලේකම් වෙත යොමුකර ඇති ඉල්ලීම සම්බන්ධයෙන් උපදෙස් ඉල්ලා ඉඩම් කොමසාරිස් වෙත ලිපියක් ප්‍රාදේශීය ලේකම් මගින් යොමුකර ඇත. මෙහි 44 වගන්ති පැවරුම් සහතිකය ලබාගැනීම සඳහා ක්‍රියාකරමින් පවතී.

20. තණමල්විල ඩිපෝව සඳහා පැවරුම් සහතිකය ලබාගැනීමට ප්‍රාදේශීය ලේකම් වෙත ඉල්ලීමක් කර ඇති අතර, හිමිකම ලබාගැනීමට ක්‍රියාකරමින් පවතී.

21. මස්කෙලිය බස් නැවතුම්පළ සඳහා විශේෂ ප්‍රදාන පත්‍රයක් ශ්‍රී ලංගම වෙත ලබාගැනීම සඳහා ඉල්ලීමක් කර ඇත. ඉදිරි කටයුතු සිදු කරමින් පවති.

22. ශ්‍රී ලංගම පාගොඩ පිටකෝට්ටේ බස් නැවතුම්පළ ඉඩම සඳහා පැවරුම් සහතිකය ලබා ගැනීමට ප්‍රාදේශීය ලේකම් වෙත ඉල්ලීම් සිදුකර ඇති අතර, ඒ අනුව ශ්‍රී ලංගම ලිපිගොනුවල කරුණු ඉදිරිපත් කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ඉඩම් ලිපිගොනුව ඉදිරිපත් කර ඇත.

23. ශ්‍රී ලංගම මැදවච්චිය ප්‍රාදේශීය වැඩපළ හා නිල නිවාස සංකීර්ණය සම්බන්ධයෙන් හිමිකම තහවුරු කර ගැනීම සඳහා සහතිකය ලබාගැනීම සඳහා ප්‍රාදේශීය ලේකම් වෙත ඉල්ලීමක් කර ඇත.

24. අම්පාර ඩිපෝ ඉඩම සඳහා හිමිකම ලබාගැනීම සඳහා ප්‍රාදේශීය ලේකම් වෙත ලිපියක් යොමුකර ඇත.

25. මහියංගන නිල නිවාස භූමිය සඳහා හිමිකම ලබාගැනිම සඳහා අවශ්‍ය ලිපි යොමුකර ඇති අතර, ඒ අනුව ප්‍රාදේශීය ලේකම්ගේ ලිපියක් ලැබී ඇත. වැඩිදුර කටයුතු සිදුකළ යුතුය.

26. කුරුණෑගල උතුර ඩිපෝ ඉඩම සඳහා ප්‍රාදේශීය ලේකම් වෙත නීත්‍යානුකූල හිමිකම ලබාදෙන ලෙස ඉල්ලීම් කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය වෙත කරුණු ඉදිරිපත් කර ඇත.

27. මහව බස් නැවතුම්පළ සඳහා පැවරුම් සහතිකය ලබාදෙන ලෙසට ප්‍රාදේශීය ලේකම් වෙත ඉල්ලීම් කර ඇත.

28. කුරුණෑගල දකුණු ඩිපෝ ඉඩම, ඉඩම් කොටස් 03 ක් වන අතර, පළවන කොටස ජනසතුවෙන් ලබාගත් දේපළක් වේ. මෙහි ඉඩම් අත්පත් කරගැනීමේ පනත යටතේ ලබාගෙන ඇති ඉඩම් කොටස් දෙකක් පවතින අතර, එම ඉඩම් කොටස් දෙක සඳහා වෙන වෙනම ප්‍රාදේශීය ලේකම් වෙත 44 වගන්තිය යටතේ පැවරුම් සහතික ලබාදෙන ලෙසට කරුණු සහිතව ඉල්ලීම් සිදුකර ඇත.

29. පුත්තලම ඩිපෝ ඉඩම සඳහා පැවරුම් සහතිකය ලබාදෙන ලෙසට ප්‍රාදේශීය ලේකම් වෙත ඉල්ලීම් සිදුකර ඇත.

30. කළුතර ඩිපෝව පුළුල් කිරීම සඳහා ලබාගෙන ඇති අක්කර 04 ක ඉඩම් කොටස සඳහා 44 වන වගන්තිය යටතේ පැවරුම් සහතිකය ලබාදෙන ලෙසට ප්‍රාදේශීය ලේකම් වෙත ඉල්ලීම්කර ඇත.

31. කළුතර රියදුරු අභ්‍යාස විද්‍යාල භූමිය මැනුම්කර පිඹුරුපත් ලියාපදිංචිකර ඇති අතර, වන්දි මුදල් ගෙවූ බවට තහවුරු වූවත් එය නිශ්චිතවම තහවුරු කිරීම සඳහා රිසිට්පත් නොමැති බැවින් ඔප්පු ලබාදීම ප්‍රමාද වී ඇති බැවින් නැවත ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත ඔප්පු ලබාදෙන ලෙස ඉල්ලීමක් කර ඇත.

32. පානදුර බස් නැවතුම්පළ ඉඩම සඳහා පානදුර උසාවියේ ඇති 2225/P නඩුව සඳහා ශ්‍රී ලංගම වෙනුවෙන් පෙනී සිට සාක්ෂි ලබා දී ශ්‍රී ලංගම අයිතිය තහවුරුකර ඇත.

33. කළුතර බස්නැවතුම්පළ භූමියේ ශ්‍රී ලංගම අයිතිය ඇති ඉඩම් කොටස වත්කම් තක්සේරුවලට යොමුකර ඇත.

34. මොරටුව කටුබැද්ද පිහිටි සියෙරා කන්ස්ට්‍රක්ෂන් ආයතනය සඳහා බදු ලබාදී ඇති භූමිය සඳහා 2016/08/08 දින සිට හිඟ බදු මුදල් ලබා ගැනීම සඳහා ශ්‍රී ලංගම අධ්‍යක්ෂ මණ්ඩලයට කරුණු ඉදිරිපත් කර එම තීරණය පරිදි රු.12,458,333/- ක් බැගින්දැනට වාරික 06 ක් ගෙවීම් කර ඇති අතර, තව වාරික 04 ක් අයකරගත යුතුවේ. තවද තක්සේරු වාර්තාව ලබාගැනීම සඳහා ඉල්ලුම්කර නැවත සිහිකැඳවීම් ද සිදුකර ඇත. නව තක්සේරු වාර්තාවක් කැඳවා එම තක්සේරුවට අනුව මුදල් හා හිඟ මුදල් නැවත අයකර ගැනීමටත් 2022 වර්ෂය සඳහා නව බදු ගිවිසුමකට එළඹීමට අනුමැතිය ලබා දී ඇත.

35. නිවිතිගල සමුපකාරය පිහිටි භූමිය ශ්‍රී ලංගම සතුවන අතර, එම ආයතනයට ලබා දී ඇති බදු ගිවිසුම් ප්‍රකාරව 2015 සිට බදු මුදල් අයකරගෙන නොමැති බැවින් ශ්‍රී ලංගම අධ්‍යක්ෂ මණ්ඩලයට කරුණු ඉදිරිපත්කර එම තීරණය පරිදි මේ වන විට පැරණි තක්සේරුවට අනුව වසර 08ක හිඟ බදු කුලිය රු: 176,000/- ක් අයකරගෙන ඇති අතර, නව තක්සේරු වාර්තාවක් ලබාගැනීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ලිපි යොමුකර ඇත. එම තක්සේරු වාර්තාව අනුව වැඩිවන මුදල නැවත නිවිතිගල සමුපකාර සමිතිය විසින් ගෙවීම් කිරීමට එකඟ වී ඇත.

36. ශ්‍රී ලංගම අක්කරෙයිපත්තුව ඩිපෝ ඉඩම සඳහා බදු පදනම් මත ඔප්පු ලබාදීමට ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට භාර දී අර්ථකතනයක් ලබා දී ඇත. ඒ සඳහා මිලියන 17 ක් ගෙවීම් කරන ලෙස දක්වා ඇත. ඒ අනුව මෙම ඉඩම විකිණීමේ පදනමෙන් ලබාගෙන ඇති ඉඩමක් බව තහවුරු කර ඇති අතර වන්දි මුදල් ගෙවා අවසන්කර ඇත. ඔප්පු ලබා ගැනීමට නියමිතය.

37. හෝමාගම පැරණි ශ්‍රී ලංගම බස් නැවතුම්පළ ඉඩම සම්බන්ධයෙන් බස්නාහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය විසින් හිමිකම් කියාපෑමට ඉදිරිපත්වීමේ දී ඊට අදාළව හෝමාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී පැවති සාකච්ඡාවේ දී ශ්‍රී ලංගම හිමිකම තහවුරුකර බස්නාහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ විසින් ඉදිරිපත් කරන ලද හිමිකම් කියාපෑම වලංගු නොවන බව සනාථකර ඇත. එමෙන්ම ශ්‍රී ලංගම හිමිකමට අදාළව සියලු සාධක හෝමාගම ප්‍රාදේශීය ලේකම් වෙත ලිඛිතව ඉදිරිපත් කර ඇත.

    තවද හෝමාගම පැරණි බස්නැවතුම්පළ බදු ලබා දී ඇති ඉඩම් කොටසේ ගැටලු සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත කරුණු ඉදිරිපත් කර ඇති අතර, එම කරුණු අනුව නැවත ටෙන්ඩර් කිරීම සඳහා ටෙන්ඩර් මණ්ඩල ලේකම් වෙත යොමු කර ඇත.

38. මාලබේ බස් නැවතුම්පළ ඉඩම 1996 දී අමාත්‍ය මණ්ඩල තීරණයකට අනුව බස්නාහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය වෙත පැවරී ඇති බවට එම අධිකාරිය විසින් කඩුවෙල ප්‍රාදේශීය ලේකම් වෙත හිමිකම් ඉදිරිපත් කිරීමේ දී ඊට අදාළව ශ්‍රී ලංගම විසින් කරුණු ඉදිරිපත් කර සියලු ලිඛිත සාධක ඉදිරිපත් කරමින් ඉඩමේ හිමිකම ශ්‍රී ලංගමය සතු බවට කරුණු ඉදිරිපත්කර ඇත.

ශ්‍රී ලංගම භාරයේ පවතින ඉඩම් කොටස් තාවකාලික පදනම් මත බාහිර ආයතන වෙත බදු පදනම් මත ගිවිසුම් ප්‍රකාරව ලබා දීමෙන් ශ්‍රී ලංගමය වෙත මුදල් අයකර ගැනීම.

ශ්‍රී ලංගම භාරයේ පවතින ඉඩම් කොටස් තාවකාලික පදනම් මත බාහිර ආයතන වෙත බදු පදනම් මත ලබා දීමේදී අයවිය යුතු බදු මුදල් අදාල ප්‍රාදේශික වල ඩිපෝ භාරයට ලබාගැනීමට 2022/01/31 දිනැති ශ්‍රී ලංගම සභාපතිතුමන්ගේ ලිපිය අනුව සිදු වන බැවින් බදු මුදල් ලබා ගැනීම සම්බන්ධයෙන් නිශ්චිත තොරතුරු ඉදිරිපත් කළ නොහැක.

01. ශ්‍රී ලංගම නිවිටඹුව බස් නැවතුම්පල භූමියෙන් කොටසක් ඩිල්ෂාන් කොමියුනිකේෂන් ආයතනයේ වාහන රථගාල ලෙස ලබා දීමට අදාලව ශ්‍රී ලංගම අධ්‍යක්ෂ මණ්ඩල තීරණ ප්‍රකාරව වාර්ෂික බදු ගෙවීමේ පදනම් මත මුදාහරින ලදි.

02. ශ්‍රී ලංගම බදුල්ල පස්සර භූමියෙන් කොටසක් QSJV ආයතනය සඳහා 2020/09/24 දින සිට 2021/03/23 දින දක්වා රු: 109,777.50 ක මුදලක් බදු මුදල් වශයෙන් අයකරගෙන ඇති අතර, ඉන් අනතුරුව, ශ්‍රී ලංගම අධ්‍යක්ෂ මණ්ඩලයට යොමු කර ශ්‍රී ලංගම අධ්‍යක්ෂ මණ්ඩල තීරණ ප්‍රකාරව රජයේ තක්සේරු වාර්තාවක් කැදවා ඇති අතර

එම රජයේ තක්සේරු මුදල 2021/03/24 දින සිට 2022/06/31 දින දක්වා රු: 125,000/-කි.2022 වර්ෂයට අදාළව සියලුම බදු මුදල් QSJV ආයතනය මගින් ගෙවීම් ශ්‍රී ලංගම ඌව ප්‍රාදේශීය කාර්යාලයට කර ඇති අතර, 2022/07/01 සිට 2023/06/30 දින දක්වා මාස 06 කට රු.109,770.50 ක් වන පරිදි වසරකට රු.219,541/- ක නව බදු මුදලකට යටත්ව නව බදු ගිවිසුමක් සකස් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා දී ඇත.

03. ශ්‍රී ලංගම ගම්පහ ඩිපෝ භූමියෙන් කොටසක් මොබිටෙල් ආයතනයට හා ටෙලිකොම් ආයතනයේ දුරකථන සන්නිවේදන කුළුණක් සවිකර ගැනීමට අදාලව ශ්‍රී ලංගම අධ්‍යක්ෂ මණ්ඩල තීරණ ප්‍රකාරව මාසික බදු ගෙවීමේ කටයුතු ශ්‍රී ලංගම ගම්පහ ඩිපෝව මඟින් සිදු කරනු ලබයි.

04. ශ්‍රී ලංගම කතරගම විශ්‍රාම ශාලා භූමියෙන් කොටසක් මහජන බැංකුවේ පෙට් යන්ත්‍රයක් සවිකිරීම සම්බන්ධයෙන් ලබා දීමට අදාලව ශ්‍රී ලංගම අධ්‍යක්ෂ මණ්ඩල තීරණ ප්‍රකාරව මාසික බදු ගෙවීමේ පදනම මත මුදාහරින ලදි.

ඒ අනුව, 2022 ජනවාරි මස සිට බදු මුදල් ලෙස රු: 28,000/- බැගින් සෑම මසකම කතරගම ඩිපෝවට ගෙවීම් කර ඇත.

05. ශ්‍රී ලංගම මධ්‍යම බස්රථ කාර්යාල භූමියෙන් කොටසක් හේෂාන් කේටර්ස් ආයතනයට බදු ලබා දීම සම්බන්ධයෙන් ශ්‍රී ලංගම අධ්‍යක්ෂ මණ්ඩල තීරණ ප්‍රකාරව මාසික බදු ගෙවීමේ පදනම මත මුදාහරින ලදි.

ඒ අනුව මසකට රු: 135,000/- බැගින් 2021/12/21 සිට 2022/12/20 දින දක්වා බදු මුදල් ලෙස රු: 1,620,000/- ක් ශ්‍රී ලංගම මූල්‍ය අංශයට ගෙවා ඇත. තවද 2022/12/21 දිනෙන් අදාළ බදු ගිවිසුම කල් ඉකුත්වන බැවින් 2022/11/16 දින පැවති 10 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ පත්‍රිකා අංක 136 ට අදාළව ඉදිරි වර්ෂ 02 සඳහා (2022/12/21 සිට 2024/12/20 දක්වා) බදු පදනම මත රු.135,000/- ක මුදලකට 25% ගාස්තු වැඩිවීමකට යටත්ව රු.168,750/- ක මුදලකට මුදාහරින ලදී.

ආරක්ෂක අංශය

1. දිවයින පුරා පිහිටි ශ්‍රී ලංගමට අයත් සියළුම ආයතනයන් සඳහා ආරක්ෂාව ලබා දීම.
ඒ සඳහා ශ්‍රී ලංගම නිත්‍ය ආරක්ෂක අංශ නිළධාරි පුරප්පාඩු ඇති බැවින් ඒ සඳහා පුද්ගලික ආරක්ෂක කටයුතු සැපයීම් සිදු කරනු ලබන සමාගම් මගින් මිලදී ගැනීම් සිදු කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය හා අධීක්ෂණය කිරීම.(ක්‍රියාත්මක වෙමින් පවතී)

2. සිසිටීවී කැමරා පද්ධතියක් සවිකිරීම තුළින් ආරක්ෂක කටයුතු විධිමත්ව පවත්වාගෙන යාම.

3. සියලුම ලංගම ස්ථානයන් වෙත ගිනි නිවන උපකරණ සැපයීම./ නඩත්තු කිරීම./හා ඒ සම්බන්ධව අධික්ෂණය කිරීම.

4. ශ්‍රී ලංගම ප්‍රධාන කාර්යාලයේ ප්‍රධාන දොරටුව හා ඇමති දොරටුව යන දොරටු 02 නවීකරණය කර එම දොරටු ආවරණය වන පරිදි ආරුක්කු හැඩති වහල සවි කිරීම.

5. ශ්‍රී ලංගම ප්‍රධාන කාර්යාලයේ ආරක්ෂක කාර්යාලයේ නවීකරණ කටයුතු සිදු කිරීම.

6. ශ්‍රී ලංගම ආයතනයන් තුළ ඇති ආරක්ෂක මුර කුටි හා සේවකයින්ගේ විවේකාගාර නවීකරණය සිදු කිරීම.

7. ආරක්ෂක අංශ කාන්තා හා පිරිමි සාමාජිකයින් හට නිළ ඇඳුම් ලබා දීම.(කාන්තා නිල ඇඳුම් ලබා දීම ක්‍රියාත්මකව පවතී)

ක්‍රියාකාරකම්

1. දිවයින පුරා පිහිටා ඇති ශ්‍රී ලංගම ආයතනයන්හි සිදු වන දූෂණ හා අක්‍රමිකතා සම්බන්ධව ලැබෙන ලිඛිත පැමිණිලි හා මගී ජනතාව විසින් සිදු කරනු ලබන පැමිණිලි සම්බන්ධව විමර්ශන කටයුතු සිදු කිරීම.

2. සියළුම ශ්‍රී ලංගම ඩිපෝවන් හා බස්රථ පෙර දැනුම්දීමකින් තොරව හදිසි පරීක්ෂාවට ලක් කර දූෂණ හා අක්‍රමිකතා අවම කිරීම.

3. ශ්‍රී ලංගම ප්‍රධාන කාර්යාලය ඇතුළු සියළු ලංගම සේවකයින් සඳහා නිදහස් ගමන් බලපත්‍ර සැකසීමෙන් පසු නිකුත් කිරීම.

වර්ෂය	නිමකර ඇති විමර්ශන ප්‍රමාණය	හදිසි පරීක්ෂණ කටයුතු ප්‍රමාණය
2022	65	15

2022 වර්ෂයේ විමර්ශන ආරම්භ කර සිදු කරමින් පවතින විමර්ශන 09 ක් ඇත.

අභ්‍යන්තර විගණන කොට්ඨාශය

2022 වර්ෂයේ අභ්‍යන්තර විගණන කොට්ඨාශය මඟින් සිදුකරන ලද කාර්යයන් පිළිබඳ විස්තර

මුදල් අංශය

1. මිලදී ගන්නා බස්රථ සඳහා කල්බදු වාරික ගෙවීම පරීක්ෂාව.
2. සියළුම ගබඩාවන්හී වාර්ෂික සමීක්ෂණ කටයුතු නිසි පරිදි සිදු කිරීම.
3. ප්‍රධාන මුදල් පොත්, දෛනික මුදල් පොත, ගෙවීම් වවුචර්, මුදල් ලැබීම් හා ආදායම් එකතු කිරීම විගණනය.
4. මුදල්, ඉන්ධන භාවිතය (බස්රථ සඳහා ඉන්ධන අතිරික්තතා හා ඌනතා, සංචිත වාහන සඳහා) හා වේතන, විගණනය, සේවකයන් සඳහා ණය ලබාදීම හා අයකර ගැනීම පරීක්ෂාව.

කාර්මික අංශය

1. කල්බදු ක්‍රමය යටතේ හා ඉන්දියානු ණය ක්‍රමය යටතේ බස්රථ මිලදී ගැනීම.
2. බස්රථ සඳහා අවශ්‍ය නව, පෙරසවි ටයර් හා බැටරි මිලදී ගැනීම, අකාලයේ අසාර්ථක වන ටයර් සඳහා ප්‍රතිදාන ලබා ගැනීම පරීක්ෂාව.
3. ස්ථානික මිලදී ගැනීම් පරීක්ෂාව හා අමුද්‍රව්‍ය මිලදී ගැනීම.
4. එන්ජින් කට්ටල් අළුත්වැඩියාව හා ගියර් පෙට්ටි අළුත්වැඩියාව.

පාලන අංශය

1. මානව සම්පත් තොරතුරු පද්ධතිය ක්‍රියාත්මක කිරීම.
2. සේවක බඳවා ගැනීමේ හා උසස්වීමේ පටිපාටිය ක්‍රියාත්මක කිරීම.

පුහුණු අංශය

1. සේවකයින්ගේ සියළුම පුහුණු කටයුතු සිදු කිරීම.
2. කළුතර රියදුරු අභ්‍යාස විද්‍යාලයේ නව නේවාසිකාගාරයක් ඉදි කිරීම පරීක්ෂාව.

ලේකම් අංශය

1. සියළුම වත්කම් කළමනාකරණය.
2. ඉඩම් වල අයිතිය හා පැවැත්ම තහවුරු කිරීම, ගිණුම් වල පෙන්වීම.

<u>නීති අංශය</u>

ශ්‍රී ලං.ග.ම. යේ සියළුම අධිකරණ කටයුතු සිදු කිරීම.

<u>සිවිල් අංශය</u>

ශ්‍රී ලං.ග.ම.යේ ගොඩනැගිලි අළුත්වැඩියා හා නව ඉදිකිරීම් කටයුතු සිදු කිරීම, ඇස්තමේන්තු සකස් කිරීම,අමුද්‍රව්‍ය මිලදී ගැනීම.

<u>සංවර්ධන හා සැළසුම් අංශය</u>

විවිධ වාර්තා සැකසීම හා ඉදිරිපත් කිරීම පරීක්ෂාව.

<u>ආරක්ෂක අංශය</u>

ශ්‍රී ලං.ග.ම. ආරක්ෂක කටයුතු පරීක්ෂාව සිදු කිරීම.

<u>වෙනත්</u>

1. 2018 වර්ෂයේ ක්‍රියාකාරී සැළැස්මේ ක්‍රියාකාරීත්වය.
2. පාරිතෝෂික විගණනය.
3. විනය, අනතුරු හා අලාභ.
4. සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන විශේෂ විගණන කටයුතු සිදු කිරීම.
5. විගණන සාකච්ඡා පැවැත්වීම.
6. විගණන හා කළමනාකරණ රැස්වීම් පැවැත්වීම.
7. සංචාරක නිවාඩු නිකේතන, ශාලිකා ශාලාව හා ක්‍රීඩාංගන කටයුතු.
8. රජයේ විගණන විමසුම් සඳහා පිළිතුර ලබාදීම අධීක්ෂණය කිරීම.

මානව සම්පත් කළමණාකරණ කොට්ඨාශය

මාසිකව රුපියල් 30,000/- ක දීමනාවක් යටතේ හුදෙක් කොන්ත්‍රාත් පදනම මත මාස 06 කාලය සඳහා රියදුරු / කොන්දොස්තර නව පත්වීම් ලබා දීම.

පත්වීමේ ස්වභාවය	සංඛ්‍යාව
	2022
කොන්ත්‍රාත් රියදුරු	11
කොන්ත්‍රාත් කොන්දොස්තර	-
එකතුව	**11**

<u>විධායක ශ්‍රේණියේ පත්වීම් පිළිබඳව විස්තරය</u>

පත්වීමේ ස්වභාවය	සංඛ්‍යාව
	2022
ස්ථීර පත්වීම්	-
ආවරණ පත්වීම් / කාර්යය පැවරුම්	42
උසස්වීම්	-

ආවරණ පත්වීම් ස්ථිර කිරීම	-
ස්ථාන මාරුවීම්	23
කොන්ත්‍රාත් පත්වීම්	-
නව බඳවා ගැනීම්	-
එකතුව	**65**

නැවත පත්වීම් ලබා දීම

පත්වීමේ ස්වභාවය	**සංඛ්‍යාව**
	2022
නැවත පත්වීම්	01
එකතුව	**01**

ප්‍රායෝගික පුහුණුව ලබාදීම

පත්වීමේ ස්වභාවය	**සංඛ්‍යාව**
	2022
පරිගණක අංශයේ පුහුණු	17
ගිණුම් අංශයේ පුහුණු	02
කාර්මික අංශයේ පුහුණු	153
එකතුව	**172**

විධායක නොවන ස්ථාන මාරුවීම්

ස්වභාවය	**සංඛ්‍යාව**
	2022
ස්ථාන මාරුවීම්	425
එකතුව	**425**

විනය අංශය
විනය ලිපිගොනු විස්තරය

පත්වීමේ ස්වභාවය	**සංඛ්‍යාව**
	2022
අවසන් කරන ලද විනය ලිපිගොනු	1850
අවසන් කරන ලද අභියාචනා ලිපිගොනු	238
එකතුව	**2088**

ජංගම පරීක්ෂණ අංශය

2022 ජනවාරි සිට දෙසැම්බර් දක්වා මධ්‍යම ජංගම පරීක්ෂණ අංශයේ වාර්තාව

අනු අංකය	මාසය	කණ්ඩායම් ගණන	පරීක්ෂණ වාර ගණන	පරීක්ෂා කළ බස්රථ ගණන	විෂමාචාර		මගී දඩ ගණන	මුදල	මුළු විනය විභාග ගණන	අවසන් වූ විනය විභාග
					iv	v				
01	ජනවාරි	3	62	805	30	0	0	0	42	26
02	පෙබරවාරි	3	43	610	21	0	0	0	46	24
03	මාර්තු	3	49	659	25	0	0	0	55	40
04	අප්‍රේල්	3	47	803	7	0	0	0	25	17
05	මැයි	3	27	372	7	0	0	0	36	12
06	ජුනි	3	35	462	22	0	0	0	32	28
07	ජූලි	3	34	452	26	0	0	0	31	22
08	අගෝස්තු	3	60	692	29	0	0	0	32	19
09	සැප්තැම්බර්	3	54	789	40	0	0	0	49	26
10	ඔක්තෝබර්	3	36	379	25	0	0	0	32	12
11	නොවැම්බර්	3	56	412	27	0	1	588.00	57	33
12	දෙසැම්බර්	3	55	644	23	0	0	0	42	22
			357	**4855**	**167**	**0**	**1**	**588.00**	**299**	**188**

2022 ජනවාරි සිට දෙසැම්බර් දක්වා දිවයින පුරාපරීක්ෂණ වාර්තාව

මාසය	කණ්ඩායම් ගණන	පරීක්ෂණ වාර ගණන	පරීක්ෂා කළ බස් රථගණන	බරපතලවිෂමාචාර (IV)	සුළු විෂමාචාර(V)	මගී දඩ ගණන	දඩ මුදල (රු)
ජනවාරි	28	391	4,670	69	87	64	33,045.00
පෙබරවාරි	25	374	4674	46	42	67	29,868.00
මාර්තු	25	355	4,290	57	73	112	51,879.00
අප්‍රේල්	43	517	5,651	36	33	52	25,803.00
මැයි	26	416	4,645	23	33	43	20,108.00
ජුනි	27	509	6,101	59	66	105	57,276.00
ජූලි	27	364	4,817	52	37	49	33,280.00
අගෝස්තු	28	569	7,104	71	70	106	61,452.00
සැප්තැම්බර්	40	568	6,976	82	90	131	80,110.00
ඔක්තෝබර්	34	527	6,180	76	50	93	46,871.00
නොවැම්බර්	32	608	7,429	90	68	116	58,148.00
දෙසැම්බර්	35	564	6,592	71	61	108	64,908.00
	370	**5762**	**69129**	**732**	**710**	**1046**	**562,748.00**

❖ **සංවර්ධන හා සැලසුම් අංශය**

සැලසුම් සංවර්ධන අංශයේ ක්‍රියාකාරී සැලසුම - 2022 වර්ෂය සඳහා				
යෝජිත ක්‍රියාකාරකම	භෞතික ඉලක්කය			
	කාර්තුව			
	1	2	3	4
2022 වර්ෂය සඳහා සංවර්ධන හා ක්‍රියාකාරී සැලසුම හා 2023 – 2025 වර්ෂයන් සඳහා සංයුක්ත සැලසුම් සැකසීම.	සකස්කර ඉදිරිපත්කර ඇත.			
ක්‍රියාකාරී සැලසුමට අනුව ජනවාරි සිට දෙසැම්බර් දක්වා ව්‍යාපෘතිවල ප්‍රගති වාර්තා සකස් කිරීම.	සකස්කර ඉදිරිපත්කර ඇත.			
මණ්ඩලයට අදාළ සියලු සංඛ්‍යාත්මක තොරතුරු රැස්කිරීම හා යාවත්කාලීන කිරීම.	සකස්කර ඉදිරිපත්කර ඇත.			
තොරතුරු නිලධාරී ලෙස ඉල්ලා සිටින තොරතුරු අනුමත ආකාරයට ලබාදීම සඳහා ක්‍රියා කිරීම.	වර්ෂය පුරාවට සකස්කර ඉදිරිපත්කර ඇත.			
මාසිකව ලාභාලාභ වාර්තා හා මුදල් ප්‍රවාහ වාර්තා සැකසීම (ප්‍රාදේශීය වැඩපොළ, රියදුරු පුහුණු පාසල්, සංචාරක බංගලා ඇතුලුව)	සකස්කර ඉදිරිපත්කර ඇත.			
ප්‍රාදේශීය වැඩපොළ, රියදුරු පුහුණු පාසල්, සංචාරක බංගලා පිළිබඳ ප්‍රගති වාර්තා සැකසීම.	සකස්කර ඉදිරිපත්කර ඇත.			
විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව සැකසීම හා ඉදිරිපත් කිරීම.	සකස්කර ඉදිරිපත්කර ඇත.			
ප්‍රවාහන අමාත්‍යාංශය හා වෙනත් රාජ්‍ය ආයතන සඳහා ඉල්ලා සිටින විශේෂ වාර්තා සකස්කර ඉදිරිපත් කිරීම.	සකස්කර ඉදිරිපත්කර ඇත.			

ටෙන්ඩර් අංශය

<u>2022-01-01 දින සිට ටෙන්ඩර් මණ්ඩල අංශය විසින් මිළ කැඳවනලදකාර්යය විස්තර පහත සඳහන් පරිදි වේ</u>

අනු අංකය	දිනය	සිදු කරන ලද කාර්යයන්	ටෙන්ඩරය විවෘත කරන දිනය
01	2022-01-06	2022/2023 වර්ෂයන් සඳහා වාහන රක්ෂණය.	2022-01-07
02	2022-01-06	රත්මලාන ඉන්ධන පිරවුම්හල සහ සරප් අංශය රක්ෂණය කිරීම.	2022-01-07
03	2022-01-06	2022 සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම (අන්තර්ජාලය භාවිතා කරමින්)**Online**	2022-01-06
04	2022-01-11	Supply & Delivery of 162 Nos. 295/80R 22.5 New Radial Tubeless Tyres	2022-01-24
05	2022-01-11	ශ්‍රී ලංගමසඳහා අවශ්‍ය දුණුකොළ මිලදි ගැනීම.	2022-01-05
06	2022-01-24	2021 වර්ෂය සඳහා රෙක්සින් මිලදි ගැනීම.	2022-02-02
07	2022-01-25	Supply & Delivery of flaps for SLTB	2022-02-01
08	2022-02-08	ශාලිකා ක්‍රීඩාංගනයේ ඉතිරිව පවතින අලුත්වැඩියා කාර්යයන් සම්බන්ධවයි.	2022-02-09
09	2022-02-08	ශ්‍රීලංගම බස්රථ සඳහා අවශ්‍ය ටයර් නැවත පිරවීම සහ පෙරසවි කිරීම.	2022-02-10
10	2022-01-12	ශ්‍රී ලංගමසඳහා අමතර කොටස් මිලදි ගැනීම. **(**Break Liners)(W-21)	2022-02-21
11	2022-01-12	ශ්‍රී ලංගමසඳහා අමතර කොටස් මිලදි ගැනීම. **(**Battery, Spares & Oil Seals (W-22,W-10,W-36) Break Spares	2022-02-22
12	2022-03-07	ශ්‍රී ලංගමඅම්පාර ටයර් කර්මාන්ත ශාලාව සඳහා යන්ත්‍රෝපකරණ මිලදි	2022-03-03

		ගැනිම.	
13	2022-03-07	**ශ්‍රී ලංගම** අම්පාර ටයර් කර්මාන්ත ශාලාව සඳහා නිෂ්පාදන අමුද්‍රව්‍ය ලබාගැනිම.	2022-03-21
14	2022-03-07	ශ්‍රී ලංගම ප්‍ර/කා සඳහා දින මුදා නිල මුදා සකස් කර ගැනිම.	2022-02-15
15	2022-03-07	2022 වර්ෂයට වාර ප්‍රවේශපත්‍ර මිලදි ගැනිම.	2021-11-19
16	2022-03-07	මගීන් දැනුවත් කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරිම සඳහා අත් පත්‍රිකා මුද්‍රණය කිරිම.	2022-02-28
17	2022-03-08	World Bank Funded Investment Projects – Sanitary Facilities	2022-03-22
18	2022-03-03	ශාලිකා ක්‍රීඩාංගනයේ ශ්‍රම කොන්ත්‍රාත් පදනම යටතේ ලබාදිමට පවතින කාර්යයන් වැසිකිලි අලුත්වැඩියාවමායිම් තාප්පය, පිටත බිත්ති, ගොඩනැගිල්ලේ වහල හා ටෙනිස් ක්‍රීඩා ස්ථානය අසල පින්තාරුව	2022-03-09
19	2022-02-28	ශාලිකා පිටිය පළමු පන්තියේ ක්‍රිකට් පිටියක් ලෙසට සංවර්ධනය කිරිම.	2022-03-22
20	2022-03-15	ශ්‍රීලංගම බස්රථ සඳහා අවශ්‍ය ටයර් නැවත පිරවිම සහ පෙරසවි කිරිම. (අමාත්‍යාංශයේදි විවෘත කිරිම)	2022-04-06
21	2022-03-15	Quotation for the supply & Delivery of Stationary for SLTB	2022-03-21
22	2022-03-21	මාසික තහඩු අවශ්‍යතාවය ලබාගැනිම.	2022-03-29
23	2022-03-25	ඇලුම්නියම් මගින් කාර්යාල වෙන්කිරිම උඩහමුල්ල ඩිපෝව.	2022-03-28
24	2022-03-25	ශාලිකා උත්සව ශාලාව හා ශාලිකා ක්‍රීඩාංගණයේ ඉතිරිව පවතින අලුත්වැඩියා කාර්යයන් සිදුකර ගැනිම.	2022-03-28
25	2022-03-28	ශාලිකා ක්‍රීඩාංගණයේ කඩා වැටී තිබූ මායිම් තාප්පයෙහි ඉතිරිව ඇති අලුත්වැඩියා කාර්යයන්	2022-03-29
26	2022-04-01	World Bank Funded Sanitary Facilities Projects –	2022-04-04
	2022-04-25	Quotation for the supply & Delivery of Stationary for SLTB-2022-19-I 02 වාරය	2022-04-25
27	2022-05-06	**මානව සම්පත් කළමණාකරණ කොට්ඨාශය හා ප්‍රවාහන කොට්ඨාශය** වෙත මේස පුටු ලබාගැනිම**.**	2022-05-06
28	2022-04-28	Supply of Identity card Printing Raw Materials for SLTB	2022-05-12
29	2022-05-24	World Bank Funded Sanitary Facilities Projects –	2022-06-09
30	2022-05-20	**ශ්‍රීලංගම බස්රථ සඳහා අවශ්‍ය ටිකට් රෝල් 100,000 ක් මිලදි ගැනිම.**	2022-05-28
31	2022-05-20	**ශ්‍රී ලංගම සඳහා අවශ්‍ය අමතර කොටස් මිලදි ගැනිම.** Bearing (W-23)	2022-04-12
32	2022-05-30	295x80 R 22.5 නව ටයර් **100 ක් මිලදි ගැනිම.**	2022-06-01
33	2022-05-30	**ශ්‍රී ලංගම බස්රථ සඳහා අවශ්‍ය ටියුබ් මිලදි ගැනිම.**	2022-06-01
34	2022-05-30	**ශ්‍රී ලංගම සඳහා අවශ්‍ය කරපටි මිලදි ගැනිම.**	2022-06-01
35	2022-06-06	Quotation for the supply & Delivery of toners for SLTB Head office & Regional office	2022-06-15
36	2022-06-07	**ටිකට් මැෂින් සඳහා අවශ්‍ය ටිකට් රෝල් මිළදි ගැනිම.**	2022-06-08
37	2022-06-09	**ශ්‍රී ලංගම සඳහා ගිනි නිවීමේ උපකරණ ලබාගැනිම**	2022-06-16
38	2022-06-09	Park & Ride ව්‍යාපෘතිය යටතේ බස්රථ **12** ක් කුලී පදනම මත මිළදි ගැනිම**.**	2022-06-13

39	2022-06-09	**ශ්‍රී ලංගම සඳහා ලේලන්ඩ් සිලින්ඩර් හෙඩ් මිළදී ගැනීම(W-05)**	2022-06-22
40	2022-06-10	**ලෝක බැංකු ආධාර යටතේ ශ්‍රී ලංගම ඩිපෝවන් වල (Shopping) ක්‍රමය යටතේ ගොඩකවෙල,ඇඹිලිපිටිය ඩිපෝවන් වල වැසිකිලි පද්ධති සෑදීම සඳහා මිළගණන් කැඳවීම.**	2022-06-13
41	2022-06-10	**ශ්‍රී ලංගම ආයතනයන් සඳහා අවශ්‍ය පුද්ගලික ආරක්ෂක සේවාවන් පවත්වාගෙන යාම.**	2022-06-23
42	2022-06-10	**295** x 80 R 22.5 **නව ටයර 800 ක් මිලදී ගැනීම.**	2022-06-17
43	2022-06-21	මුලතිව් ඩිපෝවේ ඉන්ධන ටැංකිය ස්ථාපිත කිරීම සඳහා මිළගණන් කැඳවීම.	2022-06-23
44	2022-06-27	ශ්‍රීලංගම බස්රථ සඳහා අවශ්‍ය ටිකට් රෝල් මිලදී ගැනීම.	2022-06-28
45	2022-07-06	ශ්‍රීලංගම බස්රථ සඳහා අවශ්‍ය ටිකට් රෝල් මිලදී ගැනීම.	2022-07-08
46	2022-07-20	අම්පාර ටයර් කර්මාන්ත ශාලාව සඳහා මාසික අමුද්‍රව්‍ය මිලදී ගැනීම.	2022-07-21
47	2022-07-20	ශ්‍රීලංගම බස්රථ සඳහා අවශ්‍ය ලේලන්ඩ් වර්ගයේ සිලින්ඩර් බ්ලොක් මිලදී ගැනීම.	2022-07-12
48	2022-07-20	ශ්‍රීලංගම බස්රථ සඳහා අවශ්‍ය ටාටා වර්ගයේ සිලින්ඩර් බ්ලොක් සහ සිලින්ඩර් හෙඩ් මිලදී ගැනීම.	2022-07-11
49	2022-07-20	ශ්‍රීලංගම බස්රථ සඳහා විදුලි අමතර කොටස් මිලදී ගැනීම.	2022-07-29
50	2022-08-08	ශ්‍රීලංගම බස්රථ සඳහා අවශ්‍ය ටිකට් රෝල් මිලදී ගැනීම. (මාස 02ක අවශ්‍යතාවය)	2022-08-10
51	2022-08-08	ශ්‍රීලංගම බස්රථ සඳහා අවශ්‍ය ටිකට් රෝල් මිලදී ගැනීම. (මාස 06ක අවශ්‍යතාවය)	2022-08-16
52	2022-08-18	අම්පාර ටයර් කර්මාන්ත ශාලාව සඳහා මාසික අමුද්‍රව්‍ය මිලදී ගැනීම.	2022-08-22
53	2022-08-16	ශ්‍රීලංගම බස්රථ සඳහා අවශ්‍ය කරපටි මිලදී ගැනීම.	2022-08-19
54	2022-09-01	ශ්‍රීලංගම බස්රථ සඳහා අවශ්‍ය 295/80**R 22.5** ටයර් 200 ක් පෙරසවි කිරීම.	2022-09-05
55	2022-09-08	අම්පාර ටයර් කර්මාන්ත ශාලාව සඳහා මාසික අමුද්‍රව්‍ය මිලදී ගැනීම.	2022-09-13
56	2022-09-15	Supply & delivery of Stationary for SLTB	2022-09-26
57	2022-09-20	ලෝක බැංකු ආධාර යටතේ ශ්‍රීලංගම ඩිපෝවන්වල **Shopping** ක්‍රමය යටතේ බලංගොඩ, මොණරාගල, මහියංගනය සහ ත්‍රිකුණාමලය යන ඩිපෝවන්හි වැසිකිළි පද්ධති සෑදීම සඳහා මිලගණන් කැඳවීම.	2022-09-23
58	2022-09-26	අම්පාර ටයර් කර්මාන්ත ශාලාව සඳහා දින 10 ක අවශ්‍යතාවය මිලදී ගැනීම.	2022-09-28
59	2022-10-04	ප්‍රධාන කාර්යාලීය ආපනශාලාව පවත්වාගෙන යාම.	2022-10-18
60	2022-10-17	ශ්‍රීලංගම සඳහා ඇලුමිනියම් හා සින්ක් කෝටඩ් තහඩු මිලදී ගැනීම - 2023 වර්ෂය (ගේජ් 12, ගේජ් 16,ගේජ් 20) මිලදී ගැනීම.	2022-11-08
61	2022-10-17	2022 වර්ෂයේ ඉදිරි මාස 04 ක් සඳහා අවශ්‍ය තහඩු මිලදී ගැනීම.	2022-10-31
62	2022-10-17	2023 වර්ෂය සඳහා ගේජ් 18 ඇලුමිනියම් තහඩු අවශ්‍යතාවය මිලදී ගැනීම.	2022-11-08
63	2022-10-18	ශ්‍රී ලංගම බස්රථ අවශ්‍ය 1000 R 20 1000 R 22.5 **12** R 22.5 **යන ටයර් ප්‍රසම්පාදනය කිරීම.**	2022-11-09
64	2022-10-18	ශ්‍රී ලංගම බස්රථ සඳහා දුණුකොළ මිලදී ගැනීම.	2022-11-09
65	2022-10-19	2023 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම. (බස්රථ සඳහා, සාමාන්‍ය, සිවිල්, සැහැල්ලු වාහන) Online	2022-11-20
66	2022-11-02	ශ්‍රීලංගම අම්පාර ටයර් කම්හලේ බෆින් කුඩු විකිණීම සඳහා මිලගණන් කැඳවීම.	2022-11-09

67	2022-11-09	2023 වර්ෂය සඳහා ටෝනර් මිළ කැඳවීම.	2022-11-28
68	2022-11-15	2023 වර්ෂය සඳහා ලිපිද්‍රව්‍ය මිළ කැඳවීම.	2022-11-28
69	2022-11-22	2023 වර්ෂය සඳහා වාරප්‍රවේශපත්‍ර මුද්‍රණය කිරීම.	2022-12-06
70	2022-11-30	අම්පාර ටයර් කම්හල සඳහා අවශ්‍ය මාසික අමුද්‍රව්‍ය මිලදී ගැනීම.	2022-10-14
71	2022-11-30	අම්පාර ටයර් කම්හල සඳහා අවශ්‍ය මාසික අමුද්‍රව්‍ය මිලදී ගැනීම.	2022-11-16
72	2022-12-01	අම්පාර ටයර් කම්හල සඳහා අවශ්‍ය ඉදිරි මාස තුනක (03) අමුද්‍රව්‍ය අවශ්‍යතාවය මිලදී ගැනීම.	2022-12-15
73	2022-12-06	අම්පාර ටයර් කම්හල සඳහා දින 10 ක අවශ්‍ය අමුද්‍රව්‍ය මිලදී ගැනීම.	2022-12-08
74	2022-12-06	අධි සුඛෝපභෝගී සංචාරක ප්‍රවාහන සේවයේ යොදවා ඇති යුටෝන් බස්රථ සඳහා අවශ්‍ය ටයර් 40 ක් මිලදී ගැනීම.	2022-12-14
75	2022-12-06	බාහිර විගණන ආයතනයක සහය ලබාගැනීම.	2022-12-08
76	2022-12-16	බස්බොඩි නිෂ්පාදනය සඳහා අවශ්‍ය විදුරු මිලදී ගැනීම.	2022-12-21
77	2022-12-27	ශ්‍රීලංගම බස්රථ සඳහා අවශ්‍ය ටියුබ් 14106 මිලදී ගැනීම. (2022 වර්ෂය සඳහා)	2023-01-09
78	2022-12-27	මාසික කුලී පදනම මත ශ්‍රී ලංගම වෙත වාහන ලබාගැනීම.	2023-01-13
79	2022-12-30	අම්පාර ටයර් කම්හල සඳහා අවශ්‍ය ඉදිරි දින 10 ක අවශ්‍ය අමුද්‍රව්‍ය අවශ්‍යතාවය මිලදී ගැනීම.	2023-01-03
80	2022-12-30	ප්‍රධාන කාර්යාලීය ආපනශාලාව පවත්වාගෙන යාම.	2023-01-05

සම්පාදක අංශය

අනු අංකය	විෂය ක්ෂේත්‍රය	ව්‍යාපෘතියේ නම	2022 වර්ෂය සඳහා වෙන්කළ මුදල රු. මිලි	මූල්‍ය ප්‍රගතිය	නිමැවුම් ඉලක්කය	භෞතික ප්‍රගතිය 2022.12.31 දිනට
01	සියලු මිලදී ගැනීම් කටයුතු සිදු කිරීම.	මෙහෙයුම් කටයුතු වලට අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීම.	176.50	200.91	බස් රථ ඇණිය පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය නව බැටරි මිලදී ගැනීම.	අවශ්‍යතාවය පරිදි 2022.01.01/ 2022.12.31 දිනට නව බැටරි 4415 ක් මිලදී ගෙන ප්‍රාදේශික හා ඩිපෝවන් වෙත ප්‍රධාන කාර්යාලය මගින් මුදල් ගෙවා ලබා දීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇත. තවද, අවශ්‍යතාවය පරිදි ප්‍රාදේශිකය සහ ඩිපෝවන් වෙත බැටරි ලබා ගැනීමට උපදෙස් ලබා දී ඇත.
02			90.00	31.01	බස්රථ නඩත්තු/ අලුත්වැඩියා සඳහා අවශ්‍ය තීන්ත මිලදී ගැනීම.	ශ්‍රී ලංගම ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය මත ප්‍රාදේශිකය සහ ඩිපෝ සඳහා අවශ්‍ය තීන්ත මිලදී ගැනීම සිදු කරනු ලබයි.

03			833.25	870.61	බස් රථ ඇණිය පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය නව ටයර් කිට් මිලදී ගැනීම.	2021.11.05 දින ටෙන්ඩරය ප්‍රදානය කර ඇත. අමාත්‍ය මණ්ඩලය මගින් පවත්වන ලද ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය මත නව ටයර් මිලදී ගැනීම සිදු කරනු ලබයි. 825x20 ටයර් 450ක්, 900x20 ටයර් 14,140ක්, 1000x20 ටයර් 94 ක් ද අවශ්‍යතාවය පරිදි ප්‍රාදේශිකයන් සහ ඩිපෝවන් වෙත ලබාදී ඇත.
04			72.80	18.40	295/80R 22.5 නව ටයර් 1100 ක් මිලදී ගැනීම.	ප්‍රධාන කාර්යාලය මගින් ටයර් 150 ක් මිලදී ගැනීමට අවශ්‍ය කටයුතු සලසා ඇත. ප්‍රාදේශික සහ ඩිපෝවන්හි අවශ්‍යතාවය අනුව ටයර් ලබාගැනීමට උපදෙස් ලබාදී ඇත. ප්‍රාදේශික සහ ඩිපෝවන් වෙත ලබාගත් ටයර් ප්‍රමාණය සහ මිල ගණන් මෙහි සඳහන් වී නොමැත.
05			5.20	4.18	අවශ්‍යතාවය පරිදි වාර ප්‍රවේශ පත්‍ර මුද්‍රණය කිරීම.	වාර ප්‍රවේශපත්‍ර 4162267 ප්‍රධාන කාර්යාලය මගින් මුදල් ගෙවා මුද්‍රණය කර ප්‍රාදේශිකයන් වෙත ලබා දීමට අවශ්‍ය කටයුතු කර ඇත.
06			259.64	6.25	අවශ්‍යතාවය පරිදි ටිකට් පොත් සහ ටිකට් රෝල් ලබා ගැනීම.	අවශ්‍යතාවය පරිදි ටිකට් පොත් මුද්‍රණය කර ප්‍රාදේශිකයන් සහ ඩිපෝවන් වෙත ලබා දීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇත.
07			267.62	10.64	ශ්‍රී ලංගම මෙහෙයුම් පාලන කටයුතු සඳහා කාර්යාල උපකරණ සහ ලිපි ද්‍රව්‍ය මිලදී ගැනීම.	අවශ්‍යතාවය පරිදි ප්‍රධාන කාර්යාලය වෙත අවශ්‍ය ලිපි ද්‍රව්‍ය සහ ටෝනර් මිලදීගෙන බෙදා දීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇත. තවද, ප්‍රාදේශිකයන් සහ ඩිපෝවන්හි අවශ්‍යතාවය පරිදි ලිපි ද්‍රව්‍ය සහ ටෝනර් මිලදී ගැනීමට ද උපදෙස් ලබා දී ඇත. මෙහි සඳහන් වනුයේ ප්‍රධාන කාර්යාලය මගින් ලබාගත් ලිපි ද්‍රව්‍ය සහ කාර්යාල උපකරණවලට වැය වූ මුදල පමණි.
08			409.12	0.37	පරිපාලන කටයුතු සඳහා පරිගණක සහ අමතර උපාංග මිලදී ගැනීම.	අවශ්‍යතාවය පරිදි ප්‍රින්ටර් 02 ක් සහ ඡායා පිටපත් යන්ත්‍රයක් මිලදී ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇත. පරිගණක යන්ත්‍ර 2022 වර්ෂය ප්‍රධාන කාර්යාලය මගින් ලබාගෙන නොමැත.
09			40.00	23.85	ශ්‍රී ලංගම බස් රථ ඇණිය	අවශ්‍යතාවය පරිදි රෙක්සින් මීටර් 33,000 ක් මිලදී ගෙන

					පවත්වාගෙන යාම සඳහා රෙක්සින් මිලදී ගැනීම.	ප්‍රාදේශිකයන් සහ ඩිපෝවන් වෙත ලබාදීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇත
10			51.77	7.87	ශ්‍රී ලංගම ගොඩනැගිලි සහ අංගනවල විදුලි නඩත්තු සහ නව ව්‍යාපෘති සඳහා ද්‍රව්‍ය මිලදී ගැනීම.	අවශ්‍යතාවය පරිදි විදුලි නඩත්තු කිරීමට අවශ්‍ය භාණ්ඩ මිලදී ගැනීමට කටයුතු සිදුකර ඇත. මෙහි සඳහන් වනුයේ ප්‍රධාන කාර්යාලය මගින් ලබාදුන් අමු ද්‍රව්‍ය වලට වැය වූ මුදල පමණි.
11			164.94	3.62	ශ්‍රී ලංගම ගොඩනැගිලි සහ අංගනවල අලුත්වැඩියාව, නඩත්තුව සහ නව ඉදිකිරීම් සඳහා අමු ද්‍රව්‍ය මිලදී ගැනීම	අවශ්‍යතාවය පරිදි අංගනවල සහ අලුත්වැඩියා කටයුතු සිදු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත. මෙහි සඳහන් වනුයේ ප්‍රධාන කාර්යාලය මගින් ලබාදුන් අමු ද්‍රව්‍යවලට වැය වූ මුදල පමණි
12			120.00	97.83	අම්පාර ටයර් කම්හලේ ටයර් 14,400 ක් පෙරසවි කිරීම සඳහා අවශ්‍ය අමු ද්‍රව්‍ය ලබා ගැනීම.	අවශ්‍යතාවය පරිදි මණ්ඩලීය පිළිවෙත් ප්‍රකාරව අම්පාර ටයර් කම්හලට අමුද්‍රව්‍ය ලබාදීමට කටයුතු සිදුකර ඇත.
13			27.0	1.75	ශ්‍රී ලංගමට අවශ්‍ය ගෘහ උපකරණ මිලදී ගැනීම.	අවශ්‍යතාවය පරිදි ශ්‍රී ලංගම ප්‍රධාන කාර්යාලය සඳහා ගෘහ උපකරණ මිලදී ගැනීමට කටයුතු සිදුකර ඇත. තවද, අවශ්‍යතාවය පරිදි ප්‍රාදේශිකයන් සහ ඩිපෝවන්ට ද ගෘහ උපකරන මිලදී ගැනීමට අවශ්‍ය උපදෙස් ලබාදී ඇත. මෙහි සඳහන් වනුයේ ප්‍රධාන කාර්යාලය මගින් ලබාදුන් ගෘහ උපකරණ වලට වැය වූ මුදල පමණි.

විශේෂ විමර්ශන ඒකකය

අනු අංකය	දිනය	ප්‍රාදේශිකය/ඩිපෝව	විස්තර	විමර්ශනය පිළිබඳ තොරතුරු
01	2022.01.04		ස්ටීල් ඉම්පෙක්ස් ලංකා සමාගමට මුදල් එකතු කිරීමේ බලයලබාදීමට කටයුතු කිරීම සම්බන්ධවයි	සභාපතිතුමා
02	2022.02.04	පේදුරුතුඩුව ඩිපෝව	විනය ලිපිගොනුව භාරදීම කොන්: වී. තනුෂණ් මහතා	සහකාර මානව සම්පත් කළමණාකාර (විනය)
03	2022.02.04	මාතර ඩිපෝව	ලැබිය යුතු මුදල් ලබානොදීම සහ ප්‍රතිපාදන කපා හැරීම සම්බන්ධවයි.	සභාපතිතුමා
04	2022.02.14	ගල්ගමුව ඩිපෝව	නව ටයර් 02ක් සහ ටැග් ටයර් 02ක් සොරකම් කර රැගෙන යාම	ආරක්ෂක හා විශේෂ විමර්ශන අධීක්ෂණ නිලධාරී
05	2022.02.22		කාර්යය පැවරීම ප්‍රතික්ෂේප කිරීම ආර්.එස්.එස්. වික්‍රමරත්න මිය.	නි:සා: (ධාවන)

06	2022.04.28	දෙහිඅත්තකණ්ඩිය ඩිපෝව	රාජකාරී කටයුතු වලට බාධා කිරීම - ඩී.එම්. ගුණසිංහ මහතා	නි:සා: (ධාවන)
07	2022.05.24	**ප්‍රධාන කාර්යාලය**	**මණ්ඩලීය ප්‍රධාන ගබඩාවට ගෙන එන ලද රු:** 6649020/=ක් වටිනා අමතර කොටස් පිළිබඳ වාර්තාව**(කෝප් කමිටු වාර්තා)**	**සභාපතිතුමා**
08	2022.05.25	ප්‍රධාන කාර්යාලය	බ්‍රයිට් ලෑන්ඩ් සිලෝන් ඉංජිනියරින් ආයතනය සම්බන්ධවයි.	සභාපතිතුමා
09	2022.06.01	**ප්‍රධාන කාර්යාලය**	**මණ්ඩලීය පටිපාටි උල්ලංඝනය කරමින් අනුමැතියකින් තොර ටිකට් මැෂින්** 2000ක් මිළදී ගැනීම	**සභාපතිතුමා**
10	2022.07.06	ගාල්ල ඩිපෝව	එන්.බී. 6643 ඒ.සී බස්රථයේ අළුත්වැඩියා කටයුතු වෙනුවෙන් ගෙවිය යුතු බිල්පත දෙවරක් ගෙවීම සම්බන්ධවයි.	නි:සා: (ධාවන)
11	2022.08.29	පොලොන්නරුව ඩිපෝව	එන්.ඩී. 5618දරණ බස්රථය පිළිබඳ පරීක්ෂණය	නි:සා: (ධාවන)
12	2022.08.30	රත්නපුර ඩිපෝව	කුරුවිට-ලස්සකන්ද බසයේ සේවය කරන මහින්ද රත්නතිලක මහතා සම්බන්ධවයි	නි:සා: (ධාවන)
13	2022.09.15	කැස්බෑව ඩිපෝව	ඉන්ධන ගබඩාව අසල සිදුවූ කලහකාරී සිදුවීම සම්බන්ධවයි.	ආරක්ෂක හා විශේෂ විමර්ශන අධීක්ෂණ නිලධාරී
14	2022.11.14	කාත්තාන්කුඩි ඩිපෝව	ඩිපෝ කළමණාකාර තනතුර වෙනස් කර දෙන ලෙස ඉල්ලා සිටීම.	ප්‍රධාන විධායක නිලධාරී
15	2022.11.15	**ප්‍රධාන කාර්යාලය**	ජාතික විගණක කාර්යාල විසින් නිකුත් කර ඇති 2020.01.06 දිනැති 2018.12.31 දිනයෙන් අවසන් වර්ෂය සඳහා **වූ ගණුදෙනු පිළිබඳ වාර්තාව. (කෝප්කමිටු)**	**සභාපතිතුමා**
16	2022.11.16	කළුතර ප්‍රා:කා:	විනය ලිපිකරු බී.සී. දසනායක මහතා වෙත ඉදිරිපත් වූ චෝදනා සම්බන්ධවයි.	නි:සා: (ධාවන)
17	2022.11.21	ඇල්පිටිය ඩිපෝව	දුරකථනයෙන් බැණ තර්ජණය කිරීම ජී.ටී. රසික මහතා	නි:සා: (ධාවන)
18	2022.11.21	මොරටුව ඩිපෝව	දඩුවම් ලිහිල් කිරීම සම්බන්ධවයි කේ.ඒ. විමලසිරි මහතා/ඩබ්.ජී.ටී.රත්නවීර මහතා	නි:සා: (ධාවන)
19	2022.11.24	මහනුවර උතුර ඩිපෝව	විනය නියෝගයක් මත සේවයෙන් පහ කිරීම නිසා නැවත රැකියාව ලබාගැනීම සඳහා කරනු ලබන අභියාචනය රියදුරු ඩබ්.එම්.බණ්ඩා මහතා	සභාපතිතුමා
20	2022.12.01	කැස්බෑව ඩිපෝව	සේවක මහතෙකු විසින් පහරදී තර්ජනය කිරීම ගයාන් වම්න්ද පුෂ්ප කුමාර මහතා	සභාපතිතුමා
21	2022.12.01	ගම්:ප්‍රා:ගබඩාව	භාවිතයට නොගැනෙන රු: 1,851,227/= ක වටිනාකම්න් වූ බස්රථ අමතර කොටස් නිෂ්කාර්යව තිබීම	සභාපතිතුමා
22	2022.12.16	වෙන්නප්පුව ඩිපෝව	ප්‍රවේශ පත්‍ර විෂමාචාර ලිපිගොනුව භාරදීම-කරුණාතිලක ශ්‍රී බාලම් මහතා	නි:සා: (ධාවන)

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය

2022 වසර සඳහා ශ්‍රී ලංගම තොරතුරු තාක්ෂණ ප්‍රවර්ධනය පිණිස සැලසුම් කර තිබූ ප්‍රාග්ධන උපකරණ සහ මෘදුකාංග ව්‍යාපෘතීන් පිලිබඳ පැහැදිලි කිරීමක් මේ හරහා සිදු කිරීමට අපේක්ෂා කරයි.ඒ අනුව ක්‍රියාකාරී සැලැස්ම සඳහා පරිගණක යන්ත්‍ර 642ක් ලැප්ටොප් යන්ත්‍ර 25ක් මුද්‍රණ යන්ත්‍ර 735ක් UPS 681ක් ස්කෑනර් යන්ත්‍ර 140ක් ඇඟිලි සලකුණු යන්ත්‍ර 252ක් මිලදී ගැනීම සඳහා ඇතුලත් කලද රට තුල මතුව ඇති ආර්ථික අර්බුධකාරී තත්ත්වය හේතු කොට ගෙන මුදල් අමාත්‍යාංශය මගින් වියදම් සීමා කිරීම සඳහා ගෙන ඇති පියවරත් සමග අපේක්ෂා කළ අයුරින් ප්‍රසම්පාදන සැලසුම තුල ඇතුලත් කල පරිගණක උපකරණ මිලදී ගැනීමේ හැකියාව නොපැවතුණි.ඒ අනුව මානව සම්පත් කොට්ඨාශය සඳහා අවශ්‍ය කරන මුද්‍රණ යන්ත්‍ර 02ක් පමණක් මිලදි ගැනීම සිදු කරන ලදි.ලැප්ටොප් යන්ත්‍ර 25ක ප්‍රමාණයෙන් 07ක් ශ්‍රී ලංගම නිලධාරීන්ගේ රාජකාරී කටයුතු සඳහා මිලදී ගැනීමට කටයුතු කර තිබේ.තවද සම්පාදක කොට්ඨාශය සඳහා එක් ස්කෑනර් යන්ත්‍රයක් මිලදී ගෙන තිබේ.

පැවති යන්ත්‍ර අලුත්වැඩියාවට ලක් කරමින් 2022 වසර තුල භාවිතා කල අතර පවත්වාගෙන ආ ව්‍යාපෘතීන් සඳහා ඒවා ප්‍රයෝජනයට ගන්නා ලදී.

ඇඟිලි සලකුණු යන්ත්‍ර 250ක් මිලදී ගැනීම සඳහා ක්‍රියාකාරී සැලැස්ම තුල අඩංගු වුවද වසර අවසන් වන විට එම යන්ත්‍ර මිලදි ගැනීමට අදාළ අනුමැතීන් ලබා ගැනීම තාක්ෂණික ඇගයීම් කමිටු පත් කිරීම, පිරිවිතර සැකසීම, සහ අවසන් වාර්ථාව සැකසීම සිදුකර අවසන් කරන ලදී.

මානව සම්පත් කොට්ඨාශයට හා ටෙන්ඩර් හා සම්පාදක කොට්ඨාශයට ජාල පහසුකම් සැපයීම සඳහා අවශ්‍ය මූලික කටයුතු සිදුකර ඇති අතර උපකරණ මිලදි ගැනීම සඳහා ප්‍රසම්පාදන අංශයට මේ වන විට යොමු කර ඇත.

ක්‍රියාකාරී සැලැස්මේ ඇතුලත්කර තිබූ LAN ව්‍යාපෘතිය 2022 වසර තුල පූර්ණ වශයෙන් ක්‍රියාවට නංවා අවසන් කර ඇත.ඒ අනුව ශ්‍රී ලංගම සේවා ස්ථාන 138ක් සඳහා 4G තාක්ෂණය හරහා ජාල පහසුකම් සපයා තිබේ.

මෘදුකාංග සංවර්ධන කටයුතු ලෙස කාර්යය මණ්ඩල වැටුප් සැකසීමේ මෘදුකාංගය සංවර්ධනය කර අවසන් කල අතර, ඒ අනුව කාර්යය මණ්ඩල වැටුප් ඒ හරහා සැකසීම සිදු කරගෙන යනු ලබයි.

ශ්‍රී ලංගම පැවති වෙබ් අඩවිය නව්‍යකරණයට ලක්කර සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ මෘදුකාංගයද වෙබ් අඩවිය හරහා ක්‍රියාවට නංවා ඇත.

තවද, මොරටුව විශ්වවිද්‍යාලය අනුබද්ධිතව වත්කම් කලමනාකරණ මෘදුකාංගය ශ්‍රී ලංගම වෙත ලබා ගැනීම සඳහා අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය සහිතව ව්‍යාපෘතිය ආරම්භ කිරීමට මූලික කටයුතු සිදු කරමින් ඇත.

මෙම අපේක්ෂිත ව්‍යාපෘතින් ඉටු නොවීම සඳහා බලපෑ මූලික කරුණ නම් පවතින ආර්ථික අර්බුධකාරී තත්ත්වය සමග ව්‍යාපෘති සඳහා මුදල් ප්‍රතිපාදන වෙන් කරවා ගැනීම සඳහා ඇති ගැටළුව බව සඳහන් කරමි.

2023 වර්ෂය හා ඉදිරිය සඳහා ශ්‍රී ලංගම සැලසුම් යෝජනා ප්‍රසම්පාදන කොට්ඨාශය වෙත ලබා දී තිබෙන බවකාරුණිකවසඳහන් කරමි.

❖ **ඉංජිනේරු කොට්ඨාශය**

විස්තරය	පුනරුත්ථාපන		බාහිර ආයතන මගින්		ප්‍රාදේශීය වැඩපළ						වියදම
	අලුත්වැඩියා සිදුකරන/ අවසන්		අලුත්වැඩියා සිදුකරන/ අවසන්		එන්ජින් අලුත්වැඩියා		ගියර් පෙට්ටි අලුත්වැඩියා		බස් බොඩි අලුත්වැඩියා		
	නිමකළ බස්රථ ගණන	සම්පූර්ණ වියදම (රු)	නිමකළ එන්ජින් ගණන	සම්පූර්ණ වියදම (රු)	බස්රථ ගණන	වියදම (රු)	බස්රථ ගණන	වියදම (රු)	බස්රථ ගණන	වියදම (රු)	(රු)
ජන	2892	118,524,717.79	0	0.00	30	5,646,658.58	33	3,529,182.50	13	1,878,628.57	12,579,187.44
පෙබ	2420	98,496,306.72	0	0.00	27	6,634,868.67	6	771,128.87	15	2,846,572.42	108,748,876.68
මාර්	3159	137,162,360.76	0	0.00	51	9,139,848.78	54	5,913,041.54	23	3,828,562.64	156,043,813.72
අප්‍රේ	2866	119,996,379.42	0	0.00	3	533,106.04	2	356,995.00	4	629,150.79	121,515,631.25
මැයි	2666	102,015,790.29	0	0.00	9	3,742,409.81	1	59,044.86	11	1,557,698.08	107,374,943.04
ජුනි	2725	112,173,127.04	0	0.00	9	2,405,321.77	7	647,654.71	7	1586,007.48	116,812,111.00
ජූලි	2974	171,119,538.60	0	0.00	11	1,528,039.26	3	199,374.46	11	2,963,624.58	175,810,576.90
අගෝ.	2214	217,887,127.73	0	0.00	11	2,788,289.50	1	55,694.46	13	3,270,403.75	224,001,515.44
සැප්.	2119	213,311,643.71	0	0.00	13	3,506,692.81	3	286,852.24	17	5,734,595.70	222,839,784.46
ඔක්.			0	0.00	23	7,487,767.72	1	146,020.00	13	4,176,843.19	11,810,630.91
නොවැ.			0	0.00	35	14,752,947.94	11	1,091,137.09	13	4,275,975.19	20,120,060.22
දෙසැ.			0	0.00	12	3,532,557.03	14	1,081,973.93	11	3,154,910.27	7,769,441.23
	24035	1,290,686,992.06	0	0.00	234	61,698,507.91	136	14,138,099.66	151	35,902,972.66	1,402,426,572.29

නීති කොට්ඨාශය

<u>2022 වර්ෂයේ නීති කොට්ඨාශය විසින් කරනු ලැබූ කාර්යය භාරය</u>

01. ශ්‍රී ලංගමට අයත් ප්‍රාදේශීය කාර්යාල හා සියලුම ඩිපෝ වලට එරෙහිව බාහිර පාර්ශවයන් විසින් පවරනු ලබනශ්‍රී ලංගම විසින් අනෙකුත් පාර්ශවයන්ට එරෙහිව පවරනු ලබන සියලුම නඩු සඳහා දිවයින පුරා පිහිටි සියලුම අධිකරණවල පවතින නඩු සම්බන්ධව කටයුතු මෙහෙයවීම.

    මේ යටතේ,

    - ශ්‍රී ලංගම නඩු සඳහා නීති නිලධාරීන් හැකි සෑම අවස්ථාවකදීම එම අධිකරණවල පෙනී සිටීම.
    - නඩුවලට අදාල අධිකරණමය ලේඛන සැකසීම.
    - ඩිපෝ හා ප්‍රාදේශීය කාර්යාලවල සිටින උසාවි නිලධාරීන් සඳහා අවශ්‍ය නීති උපදෙස් ලබාදීම.
    - එම නිලධාරීන් සමග බාහිර නීතිඥ මහතුන් හා නීතිපති දෙපාර්තමේන්තුවේ රජයේ නීතිඥ මහතුන් සම්බන්ධීකරණය කිරීම.
    - නීතිපති දෙපාර්තමේන්තුවේ රජයේ නීතිඥ මහතුන් හා සම්බන්ධ වෙමින් නීති සාකච්ඡාවලට සහභාගි වෙමින් නඩු කටයුතු මෙහෙයවීම.

02. ශ්‍රී ලංගමට අයත් ප්‍රාදේශීය කාර්යාල,ඩිපෝ හා ප්‍රධාන කාර්යාලයේ අනෙකුත් අංශවල පවතින නෛතික ගැටළු හා පරිපාලනමය ගැටළු වලට අවශ්‍ය නීතිමය උපදෙස් ලබාදීම.

03. ශ්‍රී ලංගම බාහිර පාර්ශවයන් සමඟ එළඹෙන බදු ගිවිසුම්, සැපයුම් ගිවිසුම්, ආරක්ෂක ගිවිසුම්, පොදු ගිවිසුම් ආදී ගිවිසුම් සකස් කිරීම.

04. ශ්‍රී ලංගම සතු ඉඩම් සම්බන්ධ ගැටළු වලදී ලේකම් කොට්ඨාශයට අවශ්‍ය උපදෙස් ලබාදීම, බාහිර ආයතන සමඟ පැවැත්වෙන සාකච්ඡාවලට සහභාගිවීම සහ වාර්තා සැකසීම. ශ්‍රී ලංගමට අයත් ඉඩම්වල අයිතිය තහවුරුකර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු ඉටුකර දීම.

05. සභාපතිතුමා විසින් යොමුකරනු ලබන ගැටලු සඳහා අවශ්‍ය අවස්ථාවලදී කැබිනට් සංදේශ සැකසීම.

06. නඩුවල ගත යුතු ඉදිරි පියවර සම්බන්ධව අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකා යොමු කිරීම.

කෙසේ වුවද, 2022 වර්ෂය තුලදී නීති කොට්ඨාශයේ තුළ ශ්‍රී ලංගම නීති උපදේශක, ප්‍රධාන නීති නිලධාරී, සහකාර නීති නිලධාරීන් විසින් කාර්යයන් ඉටුකරනු ලබන අතර, 2022 වර්ෂයේ මෙම නිලධාරී මහත්ම මහත්මීන් විසින් ඉටුකරනු ලැබූ ඉහත කී සියලු කාර්යයන් පිළබඳව වාර්තාවක් සැකසීම ඉතා සංකීර්ණ වන අතර, එසේ වුවද,2022 වර්ෂය තුළ නීති කොට්ඨාශය විසින් විශේෂිතව සිදුකරනු ලැබූ කාර්යයන් පහත පරිදි වේ.

1. 2022 වර්ෂය තුළ මහේස්ත්‍රාත් අධිකරණ සඳහා සිතාසි 35 ක් ද, දිසා අධිකරණ සිතාසි 24 ක්ද, කම්කරු විනිශ්චය සභා ඉල්ලුම්පත්‍ර 23 ක් හා බෙරුම්කරණ නඩු 07 ක් ද, වාණිජ මහාධිකරණ නඩු 01 ක් ද, වශයෙන් මුළු සිතාසි 90 ක් ලැබී ඇති අතර, එකී නඩුවල ඉදිරි කටයුතු සිදු කිරීම.

2. 2022 වර්ෂය තුළ නීති කොට්ඨාශය මගින් සකසනු ලැබූ ගිවිසුම් සංඛ්‍යාව 19 ක් වේ.

3. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩල පනත සංශෝධනය කිරීමට අදාල ප්‍රවාහන අමාත්‍යාංශය සමඟ සාකච්ඡා අවසන් කර සකස් කරන ලද කෙටුම්පත් අමාත්‍ය මණ්ඩල සංදේශය ප්‍රවාහන අමාත්‍යාංශය වෙත යොමු කිරීම.

4. පරිපාලන අත්පොත සම්බන්ධව නීති කොට්ඨාශයේ නිර්දේශ ලබාදීම.

5. ශ්‍රී ලංගම පනත යටතේ සිදු කරනු ලබන වැරදි පිළිබඳ විමර්ශන හා අධිකරණ කටයුතු ශ්‍රී ලංගම නිලධාරි/සේවක අක්‍රමිකතාවයන් පිළිබඳ විමර්ශන කටයුතු වෘත්තීය මට්ටමින් ඉටු කරවා ගැනීම පිණිස පොලිස් නිලධාරීන්ගෙන් සමන්විත ස්වාධීන විමර්ශන ඒකකයක් ශ්‍රී ලංගම තුළ පිහිටුවීමට අවශ්‍ය මූලික කටයුතු කිරීම.

6. ප්‍රවේශ පත්‍රයක් නොමැතිව ගමන්ගන්නා මහින්ගෙන් අය කරනු ලබන දඩ මුදල් සම්බන්ධව පාලන පිළිවෙත් අංක 18 සංශෝධනය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීම.

7. 2020 වර්ෂය තුලදී ශ්‍රී ලංගම නඩු සඳහා නීතිපති දෙපාර්තමේන්තුවේ පෙනී සිටීම වෙනුවෙන් එවනු ලැබූ බිල්පත් අතරින් බිල්පත් 61 සඳහා රු. 6,588,546.00 ක මුදලක් නීතිපති දෙපාර්තමේන්තුවට ගෙවීම.

පුහුණු පර්යේෂණ හා සංවර්ධන කොට්ඨාශය

(2022 පුහුණු සැලැස්ම අනුව අවසන් කරන ලද පුහුණුවැඩමුළුවන්)

2022 පුහුණු සැලැස්මෙන් බාහිරව කරන ලද අභ්‍යයන්තර පුහුණු වැඩමුළු (හදිසි පුහුණු අවශ්‍යතා)

- 2022.02.25/26 - මානව සම්පත් තොරතුරු පද්ධතිය (HRIS) හඳුන්වාදීම.
- 2022.09.01-ලිපිගොනු කළමණාකරණ පද්ධතිය (DMS) ක්‍රියාත්මක කිරීම.
- 2022.09.30 - 2022.10.09/14/21/28-ප්‍රසම්පාදන කළමණාකාර පුහුණුව
- 2022.10.19 / 2022.11.01 ලෝක බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක කරනු ලබන ශ්‍රී ලංගම ඩිපෝවන්හි

	පුහුණු වැඩමුළුව	පැවැත් වූ ස්ථානය	පැවැත්වූ දිනය	දින ගණන	වියදම
01	පුද්ගලික ලිපිගොනු නඩත්තුව පිළිබඳ පුහුණුව	ශ්‍රී ලංගම ප්‍රධාන කාර්යාලය	2022.01.27	1	47910
			2022.06.07	1	40290
			2022.10.12	1	42010
02	කම්කරු නීතිය හා කාර්මික සබඳතා	ශ්‍රී ලංගම ප්‍රධාන කාර්යාලය	2022.02.24	1	39280
			2022.03.09	1	34180
03	රිය අනතුරු අවම කිරීම සම්බන්ධ පුහුණුව ශ්‍රී ලංගම ප්‍රධාන කාර්යාලය		2022.09.28	1	48440
			2022.11.23	1	-
04	අභ්‍යයන්තර විගණන පුහුණු වැඩමුළුව	ශ්‍රී ලංගම ප්‍රධාන කාර්යාලය	2022.10.20	1	48195
05	මත්ද්‍රව්‍ය නිවාරණ වැඩමුළුව	ශ්‍රී ලංගම ප්‍රධාන කාර්යාලය	2022.06.17	1	43815
			2022.10.19	1	49805
			2022.11.11	1	49415
06	ඉන්ධන පරිභෝජනය අවම කිරීම සම්බන්ධ පුහුණු වැඩමුළුව	ශ්‍රී ලංගම ප්‍රධාන කාර්යාලය	2022.10.25	1	47840
			2022.10.28	1	48030
			2022.11.14	1	46970
			2022.11.17	1	46435
07	මුදල් පිළිවෙත් රෙගුලාසි හා මූල්‍ය පාලන දැනුම යාවත්කාලීන කිරීම	මාර්ග ගත ක්‍රමය (ONLINE)	2022.09.01/09	2	12000
08	වාහන විදුලි කාර්මික පාඨමාලාව (වැඩමුළු 02)	ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය	2022.09.12/13/14/15/16/19/20/21/22/ 23	10	189722.22
			2022.10.03/04/05/06/07/10/11/12/13/ 14	10	189722.22
09	ගබඩා පාලක පුහුණුව	ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ පුහුණු මධ්‍යස්ථානය	2022.10.21/28 - 2022.11.04/11	5	225000
10	ගිණුම්කරණ ප්‍රමිත හා ගිණුම්කරණ පරිචය	ශ්‍රී ලංගම ප්‍රධාන කාර්යාලය	2022.11.15/18/24	3	105075
			2022.11.25/2022.12.01/05	3	104505
11	Common Rail සම්බන්ධ පුහුණු පාඨමාලාව (වැඩමුළු 01)	ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය	2022.03.07/08/09/10/11/14 සහ 15	7	106944.44
12	Common Rail සම්බන්ධ පුහුණු පාඨමාලාව (වැඩමුළු 02)		2022.07.18/19/20/25/26/27 සහ 2022.08.01	7	129305.56

සනීපාරක්ෂක පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියේ බිල්පත් සහ බිල්පත් සකස් කිරීම සම්බන්ධ පුහුණු වැඩමුළු

- 2022.11.10 මගී ප්‍රවාහන බල පත්‍ර පුහුණුව - වැලිසර /පොතුහැර
- ශ්‍රී ලංගම රියදුරු උපදේශක විභාගය සඳහා එක් දින පුහුණු වැඩමුළුව-2022.11.26
- ඩිපෝවල කාල සටහන් යාවත්කාලීන කර පරිගණකගත කිරීමේ පුහුණු වැඩමුළුව-2022.12.20

2022 වර්ෂයේ බාහිර පුහුණු වැඩමුළු සඳහා යොමු කිරීම්

- 2022.02.21 සිට 2022.02.25 - Training of Assessors (TOA-119) සඳහා ඉංජිනේරු මහතුන් 08ක් වෘත්තීය තාක්ෂණ විශ්ව විද්‍යාලය වෙත යොමු කිරීම.
- 2022.07.18 – 2022.07.22 - Project & Portfolio Management for Managers – Malaysian Technical Cooperation Programme(MTCP) - ප්‍රධාන ප්‍රසම්පාදක කළමණාකාර වානක ජයවර්ධන මහතා යොමු කිරීම.
- 2022.10.10 සිට 2022.10.14 - Training of Assessors (TOA-120) සඳහා එම්.එම්.වී.ඩී.ජේ. ද සිල්වා සහකාර කළමණාකාර ඉංජිනේරු මහතා -(මොණරාගල ඩිපෝව) වෘත්තීය තාක්ෂණ විශ්ව විද්‍යාලය වෙත යොමු කිරීම

- **වෙනත් ව්‍යාපෘතින්**

ලෝක බැංකු ආධාර යටතේ ශ්‍රී ලංගම සේවා ස්ථානයන්හි සනීපාරක්ෂක කටයුතු සංවර්ධනය කිරීම

ශ්‍රී ලංගම සේවා ස්ථානයන්හි සනීපාරක්ෂක කටයුතු සංවර්ධනය කිරීම සඳහා සියලුම ප්‍රාදේශිකයන් ආවරණය වන පරිදි ශ්‍රී ලංගම ඩිපෝවන් වල පුරුෂ පාර්ශවයන් සඳහා වැසිකිලි පද්ධති 16ක්ද, කාන්තා පාර්ශවය සඳහා වැසිකිලි පද්ධති 15 ක්ද , නවීන පහසුකම් වලින් සමන්විතව ඉදිකිරීමට කටයුතු කරමින් පවතී .

- **ශ්‍රී ලංගම කාර්මික අංශයේ සේවයේ නියුතු කාර්මිකයන්හට ජාතික වෘත්තීය NVQ LEVEL 3 සුදුසුකම් ලබා දීම.**

මේ අනුව ශ්‍රී ලංගම සියලුම ඩිපෝවන් ආවරණය වන පරිදි කාර්මික අංශයේ සේවය කරනු ලබන කාර්මිකයන් 563 කු සඳහා ජාතික ආධුනිකත්ව හා පුහුණු කිරීම් අධිකාරිය වෙත හා තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිසන් සභාව වෙත අයදුම් පත් යොමු කර ආදාළ අයවලුන් ලියාපදිංචි කර ඇති අතර අවසන් ඇගයීම් පරීක්ෂණය ලංකා ජර්මානු කාර්මික ආයතනයේ සිදු කරමින් පවති. ඒ අනුව ප්‍රාදේශිකයන් 06 ක අවසන් ඇගයීම් සිදු කර අවසන් කර ඇත.

අ.අ	ප්‍රාදේශිකය	අයදුම්පත් සංඛ්‍යාව	පෙර ඇගයීමට සහභාගීවී		අවසන් ඇගයීමට සහභාගී වී	
			ඇත	නැත	ඇත	නැත
01	කොළඹ	42	30	12	29	13
02	ගම්පහ	25	15	10	11	14
03	කළුතර	22	8	14	6	16
04	රුහුණු	31	20	11	20	11
05	වයඹ	53	16	37	16	37
06	රජරට	49	29	20	29	20
		222	**117**	**104**	**110**	**112**
07	මහනුවර	ඇගයීම් ගාස්තු සම්බන්ධයෙන් උද්ගත වී ඇති ගැටලුවක් හේතුවෙන් පෙර ඇගයීම් සහ අවසන් ඇගයීම සිදු කර නොමැති අතර ඉදිරි කටයුතු සම්බන්ධයෙන් ජාතික ආධුනිකත්ව හා පුහුණු කිරීම් අධිකාරිය සමඟ සාකච්ඡා කරමින් පවති				
08	නුවරඑළිය					
09	ඌව					
10	සබරගමුව					
11	උතුර					
12	නැඟෙනහිර					

- **ශ්‍රී ලංගම සියලුම සේවා ස්ථානයන්හි ඵලදායිතා සංකල්පය ක්‍රියාත්මක කිරීමේ වැඩසටහනට අදාළ අවසන් විගණන කටයුතු සිදු කිරීම**

2021 වර්ෂයේ ආරම්භ කරන ඵලදායිතා සංකල්පය ක්‍රියාත්මක කිරීමේ වැඩසටහන යටතේ සියලුම සේවා ස්ථාන සංවර්ධනයට ලක් කල අතර 2022.01.19 වන දින සිට 2022.02.23 දක්වා සියලුම් සේවා ස්ථාන ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය සහ ශ්‍රී ලංගම එක්ව විගණන කටයුතු සිදු කරනු ලබන අතර ඉන් හොඳම ඩිපෝවන් 03ක් තේරීමට කටයුතු කර ඇත. ඒ අනුව අවසන් ඇගයීම සඳහා පහත සඳහන් ඩිපෝවන් තේරි පත් වී ඇත.

	ප්‍රාදේශිකය	ඩිපෝව		ප්‍රාදේශිකය	ඩිපෝව
01	කොළඹ	මහරගම	07	ඌව	කැප්පෙටිපොළ
		කැස්බෑව			මොණරාගල
02	රුහුණ	උඩුගම	08	සබරගමුව	දැරණියගල
		ගාල්ල			බලංගොඩ
03	මහනුවර	වත්තේගම	09	වයඹ	පුත්තලම
		උඩුදුම්බර			කුලියාපිටිය
04	කළුතර	හොරණ	10	නැගෙනහිර	එරාවූර්
		පානදුර			කල්මුනේ
05	ගම්පහ	කිරිඳිවැල	11	නුවරඑළිය	හඟුරන්කෙත
		නිවිටඹුව			වලපනේ
06	රජරට	අනුරාධපුර	12	උතුර	කරෛයිනගර්
		දඹුල්ල			කිලිනොච්චි

<u>යෝජිත ඉන්ධන පිරවුම්හල්</u>

- ඇඹිලිපිටිය
- මාවනැල්ල
- කොග්ගල
- කින්නියා
- වවුනියා
- උඩහමුල්ල
- යටිනුවර
- කොග්ගල, මාවනැල්ල, ඇඹිලිපිටිය සහ කින්නියා යන පිරවුම්හල් සඳහා ශ්‍රී ලංකා බනිජ තෙල් සංස්ථාව විසින් ඉල්ලුම් කරන ලද සියලුම ලේඛණ ඉදිරිපත් කර අදාළ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර ඇත.
- වවුනියා, උඩහමුල්ල සහ යටිනුවර යන පිරවුම් හල් සඳහා සියලුම ලේඛන ඉදිරිපත් කර ඇති අතර ඒ සඳහා ශ්‍රී ලංකා බනිජ තෙල් සංස්ථාව වෙත ඉදිරිපත් කර අනුමැතිය ලැබීමට නියමිතය.

<u>රියදුරු පුහුණු පාසැල්</u>

2022 වර්ෂය තුල ශ්‍රී ලංගම පහත සඳහන් රියදුරු අභ්‍යාස විද්‍යාලවල අභ්‍යාසලාභීන් බදවා ගැනීමේ මධ්‍යස්ථාන ලෙස නව කාර්යාල ආරම්භ කිරීමට කටයුතු කර ඇත.


රියදුරු අභ්‍යාස විද්‍යාලය	නව බඳවා ගැනීමේ මධ්‍යස්ථානය
කළුතර	පානදුර බස් ගාල
මාතර	අකුරැස්ස ඩිපෝව
උඩහමුල්ල	කැස්බෑව ඩිපෝව
පොතුහැර	වයඹ ප්‍රාදේශීය කාර්යාලය සහ ගල්ගමුව ඩිපෝව


<u>අලෙවි හා ප්‍රවර්ධන අංශය</u>


ශ්‍රී ලංගම 2022 වර්ෂයේ අලෙවි අංශයේ දිගුකාලීන හා කෙටි කාලීන මාර්ග යටතේ ඉපයූ සමස්ත ආදායම


ආදායම් ලද මාර්ග	වර්ෂයේ කාර්තු				මුළු එකතුව
<u>කෙටි කාලීන ආදායම්</u>	පලමු කාර්තුවේ	දෙවන කාර්තුවේ	තුන්වන කාර්තුවේ	හතරවන කාර්තුවේ	
01. බස්රථ ප්‍රචාරණ කටයු සඳහා ලබාදීමෙන්	0	357600	0	40000	397600
02. දොඹකර කුලියට දීමෙන්		137475			137475
03. ඩිපෝ භූමි කුලියට දීමෙන්				24500	24500
04. වෙනත්	7500		25000		3250
<u>දිගුකාලීන ආදායම් මාර්ග</u>					
01. බස් පුස්තකාල ලබාදීම මගින්.	1600000				1600000
02. ප්‍රචාරණ පුවරු ලබාදීම මගින්.	436800	218400	800000	668400	2123600
03. වෙනත් ආදායම් මාර්ග මගින්					0
සමස්ථ ආදායම					<u>4315675.00</u>

Key Performance Indicators






Total Revenue -2022
77%
4%
1%
0%
13%
5%
Waybill Revenue
Season Ticket Sale
Special Hire
Army Special Hire
Total Government Reimbursment & Subsidy
Any Other Revenue


Total Expenditure -2022
29%
5%
52%
1%
5%
8%
Employee Salary, OT, EPF & ETF
Bus Repair & Maintaince (Spare Parts/Battery/Other Maintaince Exp.)
Fuel
Oil & Lubricant
New & Rebuilt Tyre

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය
2022 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය

(සියළු සංඛ්‍යා ශ්‍රී ලංකා රුපියල් වලිනි)

වත්කම්	සටහන්	දෙසැම්බර් 31 2022	දෙසැම්බර් 31 2021
ජංගම නොවන වත්කම්			
දේපල පිරියත හා උපකරණ	01	23,602,151,979.44	4,765,524,410.17
වෙනත් මූල්‍ය වත්කම්	02	21,812,500.00	21,468,750.00
කෙරීගෙන යන වැඩ		35,733,991.00	45,099,046.94
අක්‍රිය ගිණුම	03	1,290,782,781.62	1,290,782,781.62
		24,950,481,252.06	**6,122,874,988.73**
ජංගම වත්කම්			
තොගය	04	2,417,348,038.19	1,777,323,726.22
වෙළඳ සහ වෙනත් ලැබිය යුතු	05	4,332,370,404.08	3,008,877,126.35
වෙනත් මූල්‍ය වත්කම්	06	837,032,646.14	346,363,269.52
මුදල් හා මුදල් වලට සමාන දෑ	07	3,950,774,874.53	2,286,034,569.27
මුළු ජංගම වත්කම්		**11,537,525,962.94**	**7,418,598,691.36**
මුළු වත්කම්		**36,488,007,215.00**	**13,541,473,680.09**
ස්කන්ධය හා වගකීම්			
ස්කන්ධය හා සංචිත			
ස්කන්ධ ප්‍රාග්ධනය		350,000,000.00	350,000,000.00
සමුච්චිත අලාභය	08	(24,993,653,068.88)	(25,142,546,939.25)
භාණ්ඩාගාර කොටස් ප්‍රාග්ධනය		3,944,890,550.00	3,944,890,550.00
සේවක කොටස්		211,320,942.00	227,885,200.00
රජයේ ප්‍රතිදාන	09	248,239,605.31	283,702,406.07
සංචිත	10	31,449,797,228.71	10,524,757,941.77
විකිණීම සඳහා ඇති සංචිත		21,562,500.00	21,218,750.00
මුළු ස්කන්ධය		**11,232,157,757.14**	**(9,790,092,091.41)**
ජංගම නොවන වගකීම්			
පාරිතෝෂික සඳහා වෙන්කිරීම්	11	13,899,606,022.39	13,245,778,078.77
වෙනත් ජංගම නොවන වගකීම්	12	2,735,980,284.12	3,068,771,293.82
		16,635,586,306.51	**16,314,549,372.59**
ජංගම වගකීම්			
වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු	14	7,974,323,302.42	6,954,592,938.75
බැංකු අයිරාව	07	645,939,848.93	62,423,460.16
මුළු ජංගම වගකීම්		**8,620,263,151.35**	**7,017,016,398.91**
මුළු ස්කන්ධ හා වගකීම්		**36,488,007,215.00**	**13,541,473,680.09**

01 සිට 21 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්යය අංගයකි. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතුය. මෙම මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර ඔවුන් වෙනුවෙන් අත්සන් කරන ලදි.

.....
ඉංජි.සමන්.බී.ඩී.එල්.කේ. ද අල්විස්
සභාපති
ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය.

.....
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය),
ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය.

.....
අධ්‍යක්ෂක මණ්ඩල සමාජික,
ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය.

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

		2022	2021
(සියළු සංඛ්‍යා ශ්‍රී ලංකා රුපියල් වලිනි)			
	සටහන්		
ආදායම	15	66,350,197,671.28	20,777,082,656.66
මෙහෙයුම් වියදම්	16	64,025,395,347.03	25,840,676,771.26
ක්ෂයකිරීම්වලට පෙර මෙහෙයුම් ලාභය / (අලාභය)		**2,324,802,324.25**	**(5,063,594,114.60)**
වෙනත් ආදායම්	17	3,852,429,548.52	5,898,040,932.10
වෙනත් ආදායම් ගැලපීමෙන් පසු ලාභය /(අලාභය)		**6,177,231,872.77**	**834,446,817.50**
පරිපාලන වියදම්	18	6,211,058,835.09	4,984,400,554.79
ක්ෂයවලට පසු මෙහෙයුම් ලාභය / (අලාභය)		**(33,826,962.32)**	**(4,149,953,737.29)**
මූල්‍ය හා වෙනත් වියදම්	19	202,830,067.80	218,784,013.93
මූල්‍ය ආදායම්		176,984,864.86	144,232,252.97
ශුද්ධ මූල්‍ය පිරිවැය		**(25,845,202.94)**	**(74,551,760.96)**
නිෂ්පාදන අලාභයට පෙර ලාභය / (අලාභය)		**(59,672,165.26)**	**(4,224,505,498.25)**
නිෂ්පාදන ලාභය/ (අලාභය)	20	(119,708,217.21)	36,655,302.58
රියදුරු පාසල් ලාභය/ (අලාභය)	21	18,258,768.40	8,760,043.68
ඉන්ධන පිරවුම්හල් ලාභය/ (අලාභය)	22	3,568,417.31	1,301,873.33
රාජ්‍ය ප්‍රතිපාදන හා වෙන්කිරීම්වලට පෙර ලාභ / (අලාභ)		**(157,553,196.76)**	**(4,271,222,717.84)**
රාජ්‍ය ප්‍රතිපාදන හා වෙන්කිරීම්	23	641,772,800.76	1,216,680,037.76
වර්ෂයේ ශුද්ධ ලාභ/ (අලාභය)		**484,219,604.00**	**(3,054,542,680.08)**
අනෙකුත් විස්තීරණ ආදායම්			
විකිණීම සඳහා තබා ගෙන ඇති (AFS) මූල්‍ය වත්කම්හි සාධාරණ අගයෙහි ශුද්ධ වෙනස් වීම		343,750.00	(5,437,500.00)
වර්ෂය සඳහා වෙනත් විස්තීරණ ආදායම්		**343,750.00**	**(5,437,500.00)**
වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම		**484,563,354.00**	**(3,059,980,180.08)**

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

(සියළු සංඛ්‍යා ශ්‍රී ලංකා රුපියල් වලිනි)	**2022**	**2021**
මෙහෙයුම් කටයුතු තුලින් ජනිත වූ මුදල් ප්‍රවාහය		
වර්ෂය සඳහා ශුද්ධ ලාභය / (අලාභය)	484,219,604	(3,054,542,680)
ගැලපීම්		
ක්ෂය	2,184,140,293	2,353,924,517
ලාභ/ අලාභ ගැලපුම්	(277,733,205)	22,047,883,364
රජයේ ප්‍රතිදාන - වර්ෂය තුල නිදහස් කරන ලද	(641,772,801)	(1,216,680,038)
පොලී ආදායම	(176,984,865)	(144,232,253)
මූල්‍ය පිරිවැය	202,830,068	218,784,014
තොග ගැලපීම (අතිරික්තය/ඌණතාවය)	(379,975)	-
ඉන්ධන තොග ගැලපීම (අතිරික්තය/ඌණතාවය)	(36,799,884)	-
ලද ලාභාංශ	(312,500)	-
නිශ්චිත ප්‍රතිලාභ සැලැසුම්(පාරිතෝෂික) සඳහා වෙන් කිරීම්	1,353,206,246	914,466,448
මෙහෙයුම් ලාභය/(අලාභය) මෙහෙයුම් ප්‍රාග්ධන වෙනස්වීම් වලට පෙර	**3,090,412,981**	**26,133,890,172**
තොගය වැඩිවීම්/ අඩුවීම්	(640,024,312)	(81,116,407)
වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු ආදායම (වැඩිවීම්)/ අඩුවීම්	(1,323,493,278)	(105,033,859)
කෙරීගෙන යන වැඩ (වැඩිවීම්)/ අඩුවීම්	9,365,056	(2,726,177)
ණයහිමියෝ වැඩිවීම්/ (අඩුවීම්)	1,003,154,314	(4,553,563,554)
උපචිත වියදම් වැඩිවීම්/ (අඩුවීම්)	113,564,999	(6,980,592)
අනෙකුත් ජංගම නොවන වගකීම් වැඩිවීම්/(අඩුවීම්) - අක්‍රීය ගිණුම්	-	(317,500,000)
ජංගම වගකීම් වැඩිවීම්/(අඩුවීම්) - අක්‍රීය ගිණුම්		(18,526,264,783)
මෙහෙයුම් කටයුතුවලින් ජනිත වූ මුදල් ප්‍රවාහය	**2,252,979,759**	**2,540,704,800**
නිශ්චිත ප්‍රතිලාභ සැලැසුම් පිරිවැයට ගෙවීම්(පාරිතෝෂික ගෙවීම්)	(699,378,303)	(1,119,275,929)
මෙහෙයුම් කටයුතුවලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය	**1,553,601,457**	**1,421,428,871**
ආයෝජන කටයුතුවලින් ජනිත වූ මුදල් ප්‍රවාහය		
දේපල පිරියත උපකරණ අත්පත් කර ගැනීම්	(34,751,530)	(36,167,950)
ආයෝජන අත්පත් කර ගැනීම්	(490,669,377)	785,000,705
පොලී ආදායම	176,984,865	144,232,253
තොග ගැලපීම (අතිරික්තය/ඌණතාවය)	379,975	
ඉන්ධන තොග ගැලපීම (අතිරික්තය/ඌණතාවය)	36,799,884	
ලද ලාභාංශ	312,500	
සේවක කොටස් නිදහස් කිරීම	(77,033,188)	(183,259,270)
ආයෝජන කටයුතුවලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය	**(387,976,871)**	**709,805,737**
මූල්‍ය කටයුතුවලින් ජනිත වූ මුදල් ප්‍රවාහය		
මූල්‍ය පිරිවැය ගෙවීම්	(5,011,669)	(7,083,624)
රජයේ ප්‍රතිදාන ලැබීම්	606,310,000	(1,800,175,076)
ශුද්ධ සංවලන කල්බදු ණයහිමි/කල්බදු ගෙවීම්	(685,699,000)	(694,828,000)
මූල්‍ය කටයුතුවලින් ජනිත වූ මුදල් ප්‍රවාහය	**(84,400,669)**	**(2,502,086,700)**
මුදල් හා මුදල්වලට සමාන අයිතමයන් (අඩුවීම/වැඩිවීම)	1,081,223,916	(370,852,092)
වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල්වලට සමාන අයිතම	2,223,611,109	2,594,463,201
වර්ෂය අවසානයේ මුදල් හා මුදල්වලට සමාන අයිතම	**3,304,835,026**	**2,223,611,109**

2022 දෙසැම්බර් 31 දිනට හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය

(සියළු සංඛ්‍යා ශ්‍රී ලංකා රුපියල් වලිනි)

	ස්කන්ධ ප්‍රාග්ධනය	සේවක කොටස්	රජයේ ප්‍රතිදාන	සංචිත	භාණ්ඩාගාර කොටස් ප්‍රාග්ධනය	විකිණීම සඳහා ඇති සංචිත	සමුච්චිත ලාභය/ අලාභය	එකතුව
2020.12.31 දිනට ශේෂය	350,000,000.00	227,885,200.00	283,702,406.07	10,524,757,941.77	3,944,890,550.00	21,218,750.00	(25,142,546,939.25)	(9,790,092,091.41)
ආරම්භක ශේෂයට කල ගැලපුම්								-
වර්ෂයේ එකතු කිරීම්			-					-
වර්ෂයේ ඉවත් කිරීම්			-				(335,325,733.63)	(335,325,733.63)
2021.12.31 දිනට ගැලපුම් කරන ලද ශේෂය	**350,000,000.00**	**227,885,200.00**	**283,702,406.07**	**10,524,757,941.77**	**3,944,890,550.00**	**21,218,750.00**	**(25,477,872,672.88)**	**(10,125,417,825.04)**
ගැලපුම්	-	60,468,930.00						60,468,930.00
සංචිත සඳහා එකතු කිරීම්	-	-	-	20,985,508,216.94	-	-	-	20,985,508,216.94
සංචිත සඳහා අඩු කිරීම්	-	(77,033,188.00)	(35,462,800.76)	(60,468,930.00)	-	-	484,219,604.00	311,254,685.24
විස්තරාත්මක ආදායම් ලාභය/(අලාභය)						343,750.00		343,750.00
2022.12.31 දිනට ශේෂය	**350,000,000.00**	**211,320,942.00**	**248,239,605.31**	**31,449,797,228.71**	**3,944,890,550.00**	**21,562,500.00**	**(24,993,653,068.88)**	**11,232,157,757.14**

<u>වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති</u>

1. සංස්ථාගත තොරතුරු

1.1 වාර්තාකරණ ආයතනය

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය වූ කලී 2005 අංක 27 දරණ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩල පනත යටතේ පාර්ලිමේන්තුව විසින් පනවන ලද ව්‍යවස්ථාපිත මණ්ඩලයකි. මණ්ඩලයේ ලියාපදිංචි කළ කාර්යාලය කොළඹ 05, කිරුල පාරේ අංක 200 දරණ ස්ථානයේ පිහිටා ඇති අතර ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය එම ස්ථානයේම පිහිටා ඇත.

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය (ශ්‍රී ලංගම) වූ කලී ප්‍රවාහන අමාත්‍යාංශයේ විෂය පථය යටතේ පවත්නා ආයතනයකි.

1.2 ප්‍රධාන කාර්යයන්

වර්ෂය තුළදී මණ්ඩලයේ ප්‍රධාන කාර්යය වූයේ ජනතාවට මාර්ග මගී ප්‍රවාහන සේවා ලබාදීමය. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ අරමුණ වනුයේ, ‘‘ජනතාවට සාධාරණ ගාස්තු ක්‍රමයක් යටතේ ආරක්ෂිත විශ්වාස කටයුතු සහ සුවපහසු මාර්ග ප්‍රවාහන සේවාවක් ලබාදීමයි.’’

2. සකස් කිරීමේ පදනම

2.1 පිළිපැදීම පිළිබඳ ප්‍රකාශය

මූල්‍ය ප්‍රකාශ සකස් කරනු ලැබ ඇත්තේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරනු ලැබූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලවය. 2022 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය ඇතුළුව ඒ දක්වා වූ සියළුම කාලපරිච්ඡේද සඳහා ශ්‍රී ලං.ග.ම. විසින් ස්වකීය මූල්‍ය ප්‍රකාශ සකස් කරනු ලැබුවේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (ශ්‍රී.ල.ගි.ප්‍ර.) අනුකූලවය. 2022 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ මෙම මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලං.ග.ම. විසින් සකස් කරනු ලැබ ඇත්තේ නව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලවය.

මූල්‍ය ප්‍රකාශ සමන්විත වන්නේ, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, සම්පූර්ණ ආදායම පිළිබඳ ප්‍රකාශය, සාමාන්‍ය කොටස්වල වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන් වලිනි.

2.2 මැනීමේ පදනම

මූල්‍ය ප්‍රකාශ සකස් කරනු ලැබ ඇත්තේ ඓතිහාසික පිරිවැය පදනම මතය.

2.3 සංසන්දනාත්මක තොරතුරු

පවත්නා කාල පරිච්ඡේදයේ මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අවබෝධය ඉහල නැංවීම සඳහා සහ අන්තර් කාල පරිච්ඡේද සංසන්දනාක්මකභාවය වැඩි දියුණු කිරීම සඳහා මූල්‍ය ප්‍රකාශවල වාර්තා කර ඇති සියලුම වටිනාකම් පිළිබඳව කලින් කාල පරිච්ඡේදයට අදාල ප්‍රමාණාත්මක, කථන සහ විස්තරාත්මක තොරතුරු ඇතුළු සංසන්දනාත්මක තොරතුරු එළිදරව් කරනු ලැබේ.

වෙනත් ආකාරයට දක්වා තිබේ නම් මිස පහත දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති මෙම මූල්‍ය ප්‍රකාශවල ඉදිරිපත් කර ඇති සියලුම කාලපරිච්ඡේදවලට නොවෙනස්වම අදාල කරගනු ලැබ ඇත.

මූල්‍ය ප්‍රකාශවල සඳහන් අයිතමයන්ට අදාල ඉදිරිපත් කිරීම් හෝ වර්ගීකරණය සංශෝධනය කරනු ලැබ ඇති අවස්ථාවලදී, වඩාත් හොඳ ඉදිරිපත් කිරීමක් ලබාදීම පිණිස, පවත්නා වර්ෂයට අනුකූල වන පරිදි සංසන්දනාත්මක මූල්‍යමය වටිනාකම නැවත වර්ගීකරණය කරනු ලැබ ඇත.

2.4 ඇස්තමේන්තු සහ විනිශ්චයන් භාවිතා කිරීම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්ති අදාල කරගැනීම සහ වාර්තා කර ඇති වත්කම්, බැරකම්, ආදායම සහ වියදම් ප්‍රමාණයන් කෙරෙහි බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන කළමණාකාරීත්වය විසින් සිදු කිරීම අවශ්‍ය වන්නේය.

විනිශ්චයන් සහ ඇස්තමේන්තු පදනම් වී ඇත්තේ, අතීත අත්දැකීම් සහ අවස්ථාගත කරුණු යටතේ සාධාරණයයි විශ්වාස කරනු ලබන අපේක්ෂාවන් ඇතුළු වෙනත් සාධක මතය. එමනිසා සත්‍ය අත්දැකීම් සහ ප්‍රතිඵල, මෙම විනිශ්චයන්ට සහ ඇස්තමේන්තුවලට වඩා වෙනස් විය හැකිය.

ඇස්තමේන්තු පාදක වූ උපකල්පන අඛණ්ඩ පදනමක් මත සමාලෝචනය කරනු ලැබේ. ප්‍රතිශෝධනය බලපාන්නේ ඇස්තමේන්තුව ප්‍රතිශෝධනය කළ කාල පරිච්ඡේදයට පමණක් නම් එම කාල පරිච්ඡේදයේදීද ප්‍රතිශෝධනය පවත්නා සහ අනාගත යන කාල පරිච්ඡේද දෙකටම බලපාන්නේ නම්, ප්‍රතිශෝධනය කළ කාල පරිච්ඡේදය සහ අනාගත කාල පරිච්ඡේදයේදීද ගිණුම්කරණ ඇස්තමේන්තු පිළිබඳ ප්‍රතිශෝධන පිළිගනු ලැබේ.

2.5 වත්කම් සහ ඒවා අගය කිරීමේ පදනම

මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කර ඇති වත්කම් වනුයේ මුදල්, බැංකු ශේෂ සහ මණ්ඩලයේ ව්‍යාපාරික කටයුතුවල සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය හෝ වාර්තාකරණ දිනයේ සිට එක් වර්ෂයක් යන දෙකෙන් කෙටි කාලය තුළ මුදල් වශයෙන් උපලබ්ධි කරගනු ලැබීමට අපේක්ෂා කරනු ලබන අයිතමයන්ය. ජංගම වත්කම් හැර සෙසු වත්කම් වනුයේ වාර්තාකරණ දිනයේ සිට එක් වර්ෂයක කාල පරිච්ඡේදයෙන් ඔබ්බට තබා ගැනීමට මණ්ඩලය අපේක්ෂා කරන වත්කම්වේ.

3. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේදී යොදා ගන්නා ලද ප්‍රධාන ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත දක්වා ඇත.

3.1 දේපල, පිරියත හා උපකරණ

දේපල, පිරියත සහ උපකරණ සඳහන් කරනු ලැබ ඇත්තේ සමුච්චිත ක්ෂය සහ සමුච්චිත හානිකාරක අලාභ තිබේ නම් ඒවා කපා හැරීමෙන් පසු පිරිවැය වශයෙනි.

(අ) අයිති වත්කම්

දේපල, පිරියත හා උපකරණ අයිතමයක පිරිවැය සමන්විත වන්නේ, එය මිලට ගත් මිලෙන් සහ එහි අපේක්ෂිත භාවිතය සඳහා එම වත්කම ක්‍රියාකාරක තත්ත්වයට ගෙන ඒමට සෘජුවම ආරෝපණය කළ හැකි යම් පිරිවැයක් තිබේ නම් එයින් ද වේ. තනිව ගොඩනැඟුණු වත්කම්වල පිරිවැයට ද්‍රව්‍යවල සහ සෘජු ශ්‍රමයේ පිරිවැයද අපේක්ෂිත භාවිතය සඳහා එම වත්කම ක්‍රියාකාරී තත්ත්වයට ගෙන ඒමට සෘජුවම ආරෝපණය කළ හැකි යම් පිරිවැයක් තිබේ නම් එම පිරිවැය ද ඇතුළත්වේ. අයිතම ගලවා ඉවත් කිරීමේ සහ ඒවා පිහිටුවන ස්ථානයේ නැවත ගබඩා කිරීමේ පිරිවැය සහ සුදුසුකම් ලබන වත්කම් පිළිබඳ ණය ගැණුම් පිරිවැයද මෙයට ඇතුළත්වේ.

වත්කමක වැදගත් අංශ වෙන් වෙන්ව හඳුනාගනු ලබන අතර, එය වෙන් වෙන්ව ක්ෂය කරනු ලැබේ.

(ආ) තදනත්තර පිරිවැය

දේපල, පිරියත හා උපකරණ අයිතමයක යම් කොටසක් සම්බන්ධයෙන් වන විට එම කොටසේ අන්තර්ගත වී ඇති අනාගත ආර්ථික ප්‍රතිලාභ මණ්ඩලයට ගලා ඒමේ සම්භාවිතාවයක් තිබේ නම් සහ එහි පිරිවැය විශ්වාසදායී ලෙස මැනිය හැකි වන්නේ නම්, එම කොටස ප්‍රසම්පාදනය කිරීමේ පිරිවැය එම අයිතමයේ ධාරක අගය පිළිගනු ලැබේ. ප්‍රසම්පාදනය කරන ලද කොටසේ ධාරක අගය පිළිගැනීමෙන් බැහැර කෙරේ.

දේපල, පිරියත සහ උපකරණ එදිනෙදා අළුත්වැඩියා කිරීමේ පිරිවැය එය දරණ අවස්ථාවේදී ලාභාලාභ ගිණුමෙහි පිළිගනු ලැබේ.

(ඇ) ක්ෂය කිරීම

ක්ෂය ප්‍රමාණය ගණනය කරනු ලබන්නේ වත්කමක පිරිවැයෙන් හෝ පිරිවැය සඳහා ආදේශනය කළ වෙනත් මුදල් ගණනයෙන් එහි ශේෂ වටිනාකම අඩු කළ විට ලැබෙන ක්ෂය කළ හැකි මුදල මත වේ. දේපල,පිරියත සහ උපකරණ අයිතමයක එක් එක් කොටස ප්‍රයෝජනයට ගත හැකි ඇස්තමේන්තු කළ ජීවිත කාල පදනම අනුව සරල රේඛා පදනම මත ලාභ අලාභ ගිණුමේ ක්ෂය කිරීම් පිළිගනු ලබන අතර, ඊට හේතුව වත්කමේ අන්තර්ගත ආර්ථික ප්‍රතිලාභවල අපේක්ෂිත පරිභෝජන රටාව එහි ඉතා සමීපව පිළිබිඹුවීමය. කල්බදු කාල පරිච්ඡේදය අවසාන වන විට සමාගම හිමිකාරීත්වය ලබාගැනීම සාධාරණව නිසැක වන්නේ නම් මිස කල්බදු කාල පරිච්ඡේදය සහ කල්බදු දෙන ලද වත්කම් ප්‍රයෝජනයට ගත හැකි ජීවිත කාල පරිච්ඡේදය යන දෙකෙන් කෙටි කාල පරිච්ඡේදය සඳහා කල්බදු දෙන ලද වත්කම් ක්ෂය කරනු ලැබේ. ඉඩම් ක්ෂය කරනු නොලැබේ.

ඇස්තමේන්තු කළ ප්‍රයෝජනවත් ජීව කාල පහත දැක්වේ.

වත්කම් ගණය	ප්‍රයෝජනවත් ජීවිත කාලය (අවුරුදු)	ක්ෂය කරනු ලබන ප්‍රමාණය (%)
ගොඩනැඟිලි	40	2.5%
බස්රථ සහ වෙනත් වාහන	8	12.5%
පිරියත සහ උපකරණ	10	10%
ගෘහ භාණ්ඩ සහ සවිකුරු	10	10%
පරිගණක	4	25%
බස් එන්ජින්	5	20%

වත්කම් ක්ෂය කිරීම ආරම්භ වන්නේ එය ප්‍රයෝජනයට ගත හැකිව තිබෙන අවස්ථාවේදී වන අතර, වත්කම් ක්ෂය කිරීම අවසාන වන්නේ වත්කම්, වත්කම විකිණීමට තිබෙන ලෙස වර්ගීකරණය කරනු ලබන දිනය සහ වත්කම පිළිගැනීමෙන් ඉවත් කරනු ලබන දිනය යන දින දෙකෙන් කලින් එළඹෙන දිනයේ දීය.

ක්ෂය කිරීමේ ක්‍රමය, ප්‍රයෝජනයට ගත හැකි ජීවිත කාල වටිනාකම් එක් එක් මුදල් වර්ෂය අවසානයේදී සමාලෝචනය කරනු ලබන අතර, අවශ්‍ය නම් නැවත ගලපනු ලැබේ.

(ඈ) පිළිගැනීම ඉවත් කිරීම

දේපල, පිරියත සහ උපකරණ අයිතමයන් අපහරණය කරනු ලැබූ විට හෝ එය ප්‍රයෝජනයට ගැනීමෙන් හෝ අපහරණය කිරීමෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා කරනු නොලබන විට එම අයිකමයේ ධාරක මුදල පිළිගැනීම ඉවත් කරනු ලැබේ. එම පිළිගැනීම ඉවත් කිරීමෙන් හටගන්නා වාසි හෝ පාඩු ලාභාලාභ ගිණුමේ වෙනත් ආදායම් තුළ පිළිගනු ලැබේ.

3.2 කල්බදු දෙනු ලැබූ වත්කම්

හිමිකාරීත්වයේ සියලුම අවදානම් සහ ප්‍රතිලාභ සැලකිය යුතු තරමින් මණ්ඩලය භාරගන්නා කල්බදු, මූල්‍ය කල්බදු වශයෙන් වර්ගීකරණය කරනු ලැබේ. ආරම්භක පිළිගැනීම සිදු කරනු ලැබූ විට, කල්බදු දෙන ලද වත්කමේ සාධාරණ වටිනාකම සහ අවම කල්බදු ගෙවීම්වල වර්තමාන වටිනාකම යන දෙකෙන් අඩු වටිනාකමට සමාන මුදලකට වත්කම් මැන ප්‍රාග්ධනගත කරනු ලැබේ. ආරම්භක පිළිගැනීමට අනතුරුව, එම වත්කමට අදාල වන ගිණුම්කරණ ප්‍රතිපත්තියට අනුකූලව වත්කම් ගිණුම්ගත කරනු ලැබේ.

සෙසු කල්බදු වනුයේ ක්‍රියාත්මක වන කල්බදු වන අතර, ආයෝජන දේපල සම්බන්ධයෙන් හැරුනු විට කල්බදු දෙනු ලබන වත්කම්, මූල්‍ය තත්ත්වය පිළිබඳ මණ්ඩලයේ ප්‍රකාශයේ පිළිගනු නොලැබේ.

3.3 ආයෝජන දේපල

ආයෝජන දේපල යනු බදු ආදායමක් උපයා ගැනීමට හෝ ප්‍රාග්ධනය වර්ධනය කර ගැනීමට හෝ ඒ දෙකම සඳහා බලපානු ලබන, එනමුත් භාණ්ඩ හෝ සේවා නිෂ්පාදනය භාවිතා කරමින් සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවලදී විකිණීම හෝ පරිපාලන කාර්යයන් සඳහා තබා ගනු නොලබන දේපල වන්නේය. ආයෝජන දේපල මනිනු ලබන්නේ පිරිවැයට අනුවය.

දේපල භාවිතය ආයෝජන දේපලවල සිට හිමිකරු පදිංචි දේපලවලට මාරු වූ විට, එම දේපල, පිරියත සහ උපකරණ වශයෙන් වර්ගීකරණය කරනු ලැබේ.

3.4 කරගෙන යනු ලබන ප්‍රාග්ධන වැඩ

ශේෂ පත්‍රයේ දිනයේදී ප්‍රාග්ධනගත කරනු නොලැබූ, වර්ෂය තුළදී දරණ ලද ප්‍රාග්ධන වියදම්, කරගෙන යනු ලබන ප්‍රාග්ධන වැඩ ලෙස දක්වා ඇති අතර, වර්ෂය තුළ ප්‍රාග්ධනගත කරනු ලැබ ඇති සහ භාවිතයට යොදා ගෙන ඇති වත්කම් දේපල, පිරියත සහ උපකරණ විෂයට මාරු කරනු ලැබ ඇත.

3.5 අස්පෘශ්‍යනීය වත්කම්

වත්කම්වලට ආරෝපණය කළ හැකි ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ගලා ඒමේ සම්භාවිතාවයක් තිබේ නම් සහ වත්කම්වල පිරිවැය අස්පෘශ්‍ය වත්කම් - 38 වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව විශ්වාසදායක ලෙස මැනිය හැකි වන්නේ නම් සහ පිරිවැයෙන් සමුච්චිත ක්‍රමක්ෂය සහ සමුච්චිත හානි අලාභ අඩු කොට ඉදිරියට ගෙන යනු ලබන්නේ නම් යම් වත්කමක් අස්පෘශ්‍යනීය වත්කමක් ලෙස පිළිගනු ලැබේ.

නියත ජීවිත කාල ඇති අස්පෘශ්‍යනීය වත්කම් ප්‍රයෝජනවත් ආර්ථික ජීවිත කාලය පුරා ක්‍රමක්ෂය කරනු ලබන අතර, අස්පෘශ්‍යනීය වත්කම් හානියට පත්විය හැකි බවට ඇඟවීමක් තිබෙන ඕනෑම අවස්ථාවකදී හානියට පත්වීම පිළිබඳ තක්සේරුවක් කරනු ලැබේ. නියත ප්‍රයෝජනවත් ජීවිත කාලයක් තිබෙන අස්පෘශ්‍යනීය වත්කමකට අදාල ක්‍රමක්ෂය කාලච්ඡේදය සහ ක්‍රමක්ෂ ක්‍රමය යටත් පිරිසෙන් එක් එක් මූල්‍ය වර්ෂය අවසානයේදී සමාලෝචනය කරනු ලැබේ.

නිශ්චිත නොවන ප්‍රයෝජනවත් ජීවිත කාල ඇති අස්පෘශ්‍යනීය වත්කම් තනි තනිව හෝ මුදල් ජනනය වන ඒකක මට්ටමේදී හානියට පත්වීම සම්බන්ධයෙන් වාර්ෂිකව පරීක්ෂා කරනු ලැබේ.

3.6 මූල්‍ය නොවන වත්කම් හානියට පත්වීම

හානියට පත්වන බවට යම් හැඟීමක් තිබේද යන බව නිශ්චය කිරීම සඳහා වත්කම්වල ධාරක ප්‍රමාණය, වාර්තා කරන එක් එක් දිනයේදී සමාලෝචනය කරනු ලැබේ. එබඳු යම් හැඟවීමක් තිබේ නම් එවිට වත්කම වෙනුවෙන් අය කරගත හැකි මුදල ඇස්තමේන්තු කරනු ලැබේ. වත්කමක ධාරක මුදල හෝ මුදල් ජනනය වන ඒකකය එහි අයකර ගත හැකි මුදලට වැඩි වන්නේ නම් හානියට පත්වීමේ අලාභයක් පිළිගනු ලැබේ. අයකර ගත හැකි මුදල නිශ්චය කිරීම සඳහා භාවිතා කරනු ලබන ඇස්තමේන්තුවල වෙනසක් තිබුණේ වී නම් හානියට පත්වීමේ අලාභය ප්‍රතිශෝධනය කරනු ලැබේ.

3.7 වට්ටෝරු බඩු

වට්ටෝරු බඩු මනිනු ලබන්නේ පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි කළ හැකි වටිනාකම යන දෙකෙන් අඩු මුදලට අනුවය.

වට්ටෝරු බඩුවල පිරිවැය සමන්විත වන්නේ මිලට ගැනීම්වල සියලුම පිරිවැය පරිවර්තනය කිරීමට සහ බඩු වට්ටෝරු අයිතමයන් දැනට බඩු පවත්නා ස්ථානවලට සහ තත්ත්වයට ගෙන ඒමට දැරීමට සිදුවන වෙනත් පිරිවැය වලිනි.

උපලබ්ධි කරගත හැකි ශුද්ධ වටිනාකම වනුයේ සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු කරගෙන යන අතරතුරේදී තක්සේරු කරන ලද විකුණුම් මිලෙන් ඇස්තමේන්තු කළ සම්පූර්ණ කිරීමේ පිරිවැය සහ විකිණීම සඳහා අවශ්‍ය ඇස්තමේන්තුවල පිරිවැය අඩු කිරීමෙන් ලැබෙන වටිනාකමයි.

වට්ටෝරු බඩුවල පිරිවැය නියම කරනු ලබන්නේ ඒවා එකිනෙකෙහි පිරිවැය නිශ්චිතව හඳුනාගැනීම සහ පළමුව ඇතුළු කළ දෙය පළමුව බැහැර කිරීමේ සූත්‍ර භාවිතා කිරීම මඟිනි.

3.8 මූල්‍ය වත්කම්

3.8.1 ආරම්භක පිළිගැනීම සහ ගණනය කිරීම

39 වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවල විෂය පථය තුළ මූල්‍ය වත්කම් අදාල පරිදි ලාභ හෝ අලාභ මඟින් දැක්වෙන සාධාරණ මූල්‍ය වටිනාකමෙන් යුත් මූල්‍ය වත්කම්, ණය සහ ලැබිය යුතු දෑ කල් පිරීම තෙක් තබාගනු ලබන ආයෝජන විකිණීමට තිබෙන මූල්‍ය වත්කම් යනුවෙන් වර්ගීකරණය නිශ්චය කරනු ලැබේ.

සියලුම මූල්‍ය වත්කම් ආරම්භයේදී පිළිගනු ලබන්නේ එහි සාධාරණ වටිනාකමට සාධාරණ වටිනාකම නොවන වත්කම් සම්බන්ධයෙන් වන විට ලාභාලාභ ගිණුම මඟින් සෘජුව ආරෝපණය කළ හැකි ගනුදෙනු කිරීමේ පිරිවැයද එකතු කිරීම මඟිනි.

ශ්‍රී ලංගමයේ මූල්‍ය වත්කම්වලට, මුදල් සහ කෙටි කාලීන ආයෝජනද, වෙළෙඳ සහ වෙනත් ලැබිය යුතු දේවල්ද, කාර්යය මණ්ඩල ණය සහ වෙනත් ලැබිය යුතු දේවල්ද ඇතුළත්වේ.

3.8.2 තදනන්තර මැනීම

මූල්‍ය වත්කම් තදනන්තරව මැනීම ඒවායේ වර්ගීකරණය මත රඳා පවතියි.

(අ) ලාභාලාභ හිණුම් මඟින් සාධාරණ වටිනාකම මත මූල්‍ය වත්කම්

ලාභාලාභ හිණුම් මඟින් සාධාරණ වටිනාකම මත මූල්‍ය වත්කම්වලට වෙෙළඳාම සඳහා තබාගනු ලබන මූල්‍ය වත්කම් සහ ලාභාලාභ හිණුම් මඟින් සාධාරණ වටිනාකම මත ආරම්භක පිළිගැනීම මත නම් කරන ලද මූල්‍ය වත්කම් ඇතුළත් වේ. මූල්‍ය වත්කම් ලබාගෙන ඇත්තේ විකිණීම සඳහා හෝ නුදුරු කාලයේදී නැවත මිලට ගැනීම සඳහා නම්, එම වත්කම් වෙළෙඳාම සඳහා ලබා ගනු ලබන වත්කම් වශයෙන් වර්ගීකරණය කරනු ලැබේ.

(ආ) ණය සහ ලැබිය යුතු දෑ

ණය සහ ලැබිය යුතු දෑ වූ කලී සක්‍රීය වෙළෙඳපලක මිල ඉදිරිපත් නොකළ ස්ථාවර හෝ නිශ්චය කළ හැකි ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වන්නේය. ආරම්භක ගණනයෙන් අනතුරුව එබඳු මූල්‍ය වත්කම් හානියට පත්වීම අඩු කළ ඵලදායී පොළී ප්‍රමාණ ක්‍රමය භාවිතා කරමින් ක්‍රමක්ෂ පිරිවැය මත තදනන්තරව ගණනය කරනු ලැබේ. ක්‍රමක්ෂය කළ පිරිවැය ගණන් බලනු ලබන්නේ අත්පත් කර ගැනීමේ යම් වට්ටමක් හෝ පරිතෝෂිතයක් සහ ඵලදායී පොළී ප්‍රමාණයේ අත්‍යාවශ්‍ය කොටසක් වන ගාස්තු හෝ පිරිවැය ගැනද සැලකිල්ලට ගනිමින්ය. ඵලදායී පොළී ප්‍රමාණයේ ක්‍රමක්ෂය, ආදායම් ප්‍රතිශතයෙහි මූල්‍ය ආදායමෙහි ඇතුළත් කර තිබේ.

හානියට පත්වීමෙන් පැන නඟින අලාභ, ආදායම් ප්‍රකාශයෙහි මූල්‍ය පිරිවැයෙහි පිළිගනු ලැබේ.

(ඇ) කල්පිරීම දක්වා තබාගනු ලබන ආයෝජන

නියමිත හෝ නිශ්චය කරනු ලැබීමට හැකි ගෙවීම් සහ නියමිත කල් පිරීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් ඒවා කල්පිරීම දක්වා තබා ගැනීමේ ධනාත්මක චේතනාවක් සහ හැකියාවක් ශ්‍රී ලංගමයට තිබෙන විට කල්පිරීම දක්වා ලබා ගනු ලබන වත්කම් ලෙස වර්ගීකරණය කරනු ලැබේ. ආරම්භක ගණනයෙන් අනතුරුව කල්පිරීම දක්වා ලබා ගනු ලබන ආයෝජන ඵලදායී පොළී ක්‍රමය භාවිතා කරමින් හානිය අඩු කොට ක්‍රමක්ෂ පිරිවැයට අනුව ගණනය කරනු ලැබේ. ක්‍රමක්ෂ පිරිවැය ගණන් බලනු ලබන්නේ අත්කර ගැනීමට අදාල යම් වට්ටමක් හෝ පාරිතෝෂිතයක් සහ ඵලදායී පොළී ප්‍රමාණයේ අවශ්‍ය කොටසක් සහ ගාස්තු සහ පිරිවැය සැලකිල්ලට ගනිමින්ය. ඵලදායී පොළී ප්‍රමාණයේ ක්‍රමක්ෂයන්ට ආදායම් ප්‍රකාශයේ සඳහන් මූල්‍ය ආදායමද ඇතුළත්වේ. හානියට පත්වීමෙන් පැන නඟින අලාභ ආදායම් ප්‍රකාශයෙහි මූල්‍ය පිරිවැයක් ලෙස පිළිගනු ලැබේ.

(ඈ) විකිණීමට තිබෙන මූල්‍ය ආයෝජන

විකිණීමට තිබෙන මූල්‍ය ආයෝජනවලට සාධාරණත්ව කොටස් සහ ණය සුරකුම් ඇතුළත්වේ. විකිණීමට ඇති ආකාරය අනුව වර්ගීකරණය කරන ලද සාධාරණත්ව කොටස් ආයෝජන වනුයේ වෙළෙඳාම සඳහා තබා ඇති ලෙස වර්ගීකරණය කරනු ලැබුණේවත්, ලාභ අලාභ හිණුම මඟින් සාධාරණ වටිනාකමක් ලෙස නම් කරනු ලැබුණේවත් නොමැති ආයෝජනයන්ය. මෙම ගණයට අයත් ණය සුරකුම් වනුයේ අනිශ්චිත කාලපරිච්ඡේදයක් සඳහා තබාගැනීමට අපේක්ෂා කරනු ලබන්නාවූද, ද්‍රවශීලතා අවශ්‍යතාවයන්ට ප්‍රතිචාර වශයෙන් හෝ වෙළෙඳපොල තත්ත්වයන්ගේ වෙනස්වීම්වලට ප්‍රතිචාර වශයෙන් හෝ විකුණනු ලැබිය හැකි සුරකුම්ය.

ආරම්භක ගණනය කිරීමෙන් අනතුරුව විකිණීමට තිබෙන මූල්‍ය ආයෝජනයන් ආයෝජනය පිළිගැනීම ඉවත් කර ගනු ලබන තෙක් විකිණීමට තිබෙන සංචිතයේ සෙසු පූර්ණ ආදායම් ලෙස පිළිගන්නා ලද උපලබ්ධි නොවූ ලැබීම් හෝ අලාභ සමඟ සාධාරණ වටිනාකමකට පසුව ගණනය කරනු ලැබේ.

3.8.3 පිළිගැනීම ඉවත් කිරීම

i. වත්කමෙන් මුදල් ප්‍රවාහ ලැබීමේ අයිතිවාසිකම් කල් ඉකුත් වී ඇති විට,

ii. වත්කමෙන් මුදල් ප්‍රවාහ ලැබීමට තමන්ට තිබෙන අයිතිවාසිකම් ශ්‍රී ලංගම විසින් පවරා දී ඇති විට හෝ ලැබුණු මුදල් ප්‍රවාහ සම්පූර්ණයෙන්ම සැලකිය යුතු තරමේ ප්‍රමාණයකින් තොරව එතෙරවීමේ වැඩ පිළිවෙලක් යටතේ තුන්වන පාර්ශවයකට ගෙවීමේ බැඳීමකට එළඹී ඇතිවිට සහ

(අ) වත්කමෙහි සියලුම අවදානම් සහ ප්‍රතිලාභ සැලකිය යුතු තරමින් ශ්‍රී ලංගම විසින් පවරාදී ඇත්තාවූ හෝ

(ආ) වත්කමෙහි සියලුම අවදානම් සහ ප්‍රතිලාභ සැලකිය යුතු තරමින් ශ්‍රී ලංගම පවරාදී හෝ රඳවාගෙන නොමැති, එහෙත් වත්කමෙහි පාලනය පවරා දී ඇති අවස්ථාවකදී

මූල්‍ය වත්කමක් හෝ (අදාල අවස්තාවකදී මූල්‍ය වත්කමෙන් කොටසක් හෝ එක සමාන මූල්‍ය වත්කම් සමූහයකින් කොටසක්) පිළිගැනීමෙන් ඉවත් කරනු ලැබේ.

3.8.4 මූල්‍ය වත්කම් හානියට පත්වීම

මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් හානියට පත් වී ඇති බවට යම් විෂය මූල සාක්ෂියක් තිබේද යන බව වාර්තා කරන එක් එක් දිනයකදී ශ්‍රී ලංගම විසින් තක්සේරු කරනු ලැබේ. වත්කමේ ආරම්භක පිළිගැනීමට පසුව සිදු වූ සිද්ධි එකක හෝ වැඩි ගණනක ප්‍රතිඵලයක් ලෙස හානියට පත් වූ බවට විෂය මූලික සාක්ෂි තිබේ නම් පමණක් සහ අලාභ සිද්ධිය මඟින් විශ්වාසවන්ත ලෙස ඇස්තමේන්තු කළ හැකි මූල්‍ය වත්කමේ හෝ මූල්‍ය වත්කම් සමූහයේ ඇස්තමේන්තු කළ හැකි අනාගත මුදල් ප්‍රවාහ කෙරෙහි බලපෑමක් ඇති කෙරේ නම් යම් මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් හානියට පත් වූ ලෙස සලකනු ලැබේ. ණයකරු හෝ ණයකරුවන් කණ්ඩායම සැලකිය යුතු තරමේ මූල්‍ය දුෂ්කරතාවයන් පැහැරහැරීම් හෝ අපචාරවලට යටත්වීමේ සහ ඔවුන් වස්තු භංගත්වයට පත්වීමේ හෝ වෙනත් මූල්‍ය ප්‍රතිසංවිධානයකට යටත්වීමේ සම්භාවිතාවය අත්දැකීම් සහ පැහැරගැනීම්වලට සම්බන්ධ ආර්ථික තත්ත්වයක් පිළිබඳ වෙනස්වීම් වැනි ඇස්තමේන්තු කළ හැකි අනාගත මුදල් ප්‍රවාහයන්හි ගණනය කළ හැකි තරම් පහත වැටීමක් තිබෙන බව නිරීක්ෂණය කළ හැකි දත්තවලින් දැක්වෙන බවට ඇඟවීම්ද, හානියට පත්වීම් පිලිබඳ සාක්ෂිවලට ඇතුළත්ව විය හැකිය.

3.9 මුදල් සහ මුදල් සමානයන්

මුදල් සහ මුදල් සමානයන් සමන්විත වන්නේ මුදල් ශේෂ, ඉල්ලුම් තැන්පතු, මුදල්වලට පහසුවෙන් පරිවර්තනය කළ හැකි කරනු ලැබිය හැකි සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ කාර්යය සඳහා ඉල්ලූවිට ආපසු ගෙවිය යුතු බැංකු අයිරා අඩු කළ විට වටිනාකම වෙනස්වීමේ නොවැදගත් අවදානමට යටත් අධික ද්‍රවශීලතාවයෙන් යුත් කෙටි කාලීන ආයෝජන වලිනි.

3.10 මූල්‍ය බැරකම්

අංක 39 දරණ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ විෂය පථය තුළ මූල්‍ය බැරකම්වල ආරම්භක පිළිගැනීම සහ ගණනය කිරීම ලාභාලාභ ගිණුම මඟින් ක්‍රමක්ෂ පිරිවැය මත සාධාරණ වටිනාකමෙන් යුත් මූල්‍ය බැරකම් ලෙස හෝ අදාල පරිදි ඵලදායක රැකවරණයකදී රැකවරණ සාධාරණ පත්‍ර ලෙස නම් කරන ලද ව්‍යුත්පන්න ලෙස වර්ගීකරණය කරනු ලැබේ. ස්වකීය මූල්‍ය බැරකම් ආරම්භයේදී පිළිගැනීම පිළිබඳ වර්ගීකරණය ශ්‍රී ලංගම විසින් නිශ්චය කරනු ලැබේ.

සියලුම මූල්‍ය බැරකම් ආරම්භයේදී සාධාරණ වටිනාකම මත පිළිගනු ලබන අතර, ණය සහ ඉල්ලා ගත් මුදල් ක්‍රමක්ෂ පිරිවැය මත ඉදිරියට ගෙන යනු ලැබේ. සෘජුව ආරෝපණය කළ හැකි ගනුදෙනු පිරිවැය මෙයට ඇතුළත් වේ. වෙළෙඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ ශ්‍රී ලංගමයේ මූල්‍ය බැරකම්වලට ඇතුළත් වේ.

3.10.1 තදනන්තර ගණනය කිරීම

මූල්‍ය බැරකම් පිළිබඳ තදනන්තර ගණනය කිරීම් කරනු ලබන්නේ ක්‍රමක්ෂ පිරිවැය මතය.

3.10.2 පිළිගැනීම ඉවත් කිරීම

බැරකම් යටතට වැටෙන බැඳීමක් බේරුම් කරනු ලබන හෝ අවලංගු කරනු ලබන හෝ අවසන් වන අවස්ථාවේදී මූල්‍ය බැරකම් පිළිගැනීම ඉවත් කෙරෙන්නේය.

3.11 මූල්‍ය සාධන හිලව් කිරීම

මූල්‍ය වත්කම් සහ මූල්‍ය බැරකම් හිලව් කරනු ලබන්නේ සහ ශුද්ධ මුදල මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වාර්තා කරනු ලබන්නේ පිළිගන්නා ලද මුදල් ගණන් හිලව් කිරීමට වර්තමානයේ ක්‍රියාත්මක කළ හැකි නෛතික අයිතිවාසිකමක් සහ ශුද්ධ පදනමක් මත නිරවුල් කිරීමට හෝ සමගාමීව වත්කම් උපලබ්ධි කරගැනීමට සහ බැරකම් නිරවුල් කිරීමට චේතනාවක් තිබෙන්නේ නම් පමණකි.

3.12 පශ්චාත් රැකියා ප්‍රතිලාභ

3.12.1 නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් සමාගම

ඉන්ධන පිරවුම්හල්

ලාභාලාභ වාර්තාව

		රත්මලාන සහ ඔරුගොඩවත්ත ඉන්ධන පිරවුම්හල්		
	විකුණුම්			585,274,996.70
	ආරම්භක ශේෂය - ඩීසල්	2,123,191.84		
	ආරම්භක ශේෂය - පෙට්‍රල්	1,363,597.38		
	ආරම්භක ශේෂය - ලිහිසි	294,485.00		
			3,781,274.22	
	එකතු කළා			
	මිලදී ගැණුම් - ඩීසල්	339,948,282.00		
	මිලදී ගැණුම් - පෙට්‍රල්	241,407,451.19		
	මිලදී ගැණුම් - ලිහිසි	134,220.00		
			581,489,953.19	
			585,271,227.41	
	අවසන් ශේෂය - ඩීසල්	6,070,066.80		
	අවසන් ශේෂය - පෙට්‍රල්	2,905,454.60		
	අවසන් ශේෂය - ලිහිසි	540,324.00		
			(9,515,845.40)	
				(575,755,382.01)
	ශුද්ධ ලාභය			9,519,614.69
303-7	පොළී ආදායම	25,000.00		
			25,000.00	25,000.00
				9,544,614.69
	පරිපාලන වියදම්			
402-1-1-C	වැටුප් හා වේතන - ඉංජිනේරු කාර්යය මණ්ඩල	2,105,617.91		
402-1-2-C	අතිකාල හා නිවාඩු දීමනා - ඉංජිනේරු කාර්යය මණ්ඩල	1,488,649.72		
402-1-3-C	ජීවනාංක දීමනාව - ඉංජිනේරු කාර්යය මණ්ඩල	748,800.00		
402-1-5-C	වෙනත් විශේෂ දීමනාව - ඉංජිනේරු කාර්යය මණ්ඩල	1,083,673.04		
402-2-1	අළුත්වැඩියා හා නඩත්තු (ගරාජ් ගොඩනැඟිලි)	17,690.00		
402-2-4	අළුත්වැඩියා හා නඩත්තු-යන්ත්‍ර	23,109.00		
402-2-5	මුද්‍රණ හා ලිපිද්‍රව්‍ය	64,805.00		
402-2-6	වරිපනම් සහ බදු කුලී	3,125.00		
402-2-7	දුරකතන	89,652.01		
402-2-8	විදුලිය	309,191.70		
402-2-14	සුභසාධන වියදම්	15,274.00		
402-2-21	වෙනත් වියදම්	17,600.00		
			5,967,187.38	
	මූල්‍ය වියදම්			
402-4-2	බැංකු ගාස්තු	9,010.00		
402-4-5	වෙනත් මූල්‍ය වියදම්	-	9,010.00	
	මුළු පිරිවැය		5,976,197.38	(5,976,197.38)
	ශුද්ධ ලාභය			3,568,417.31

23. රජයේ ප්‍රතිපාදන

ගිණුම් සංකේත	විස්තරය	31.12.2022 රු.	31.12.2021 රු.
302-2-B	පුනරුත්ථාපන ප්‍රතිපාදන	606,310,000.00	1,181,217,237.00
302-6-F	වර්ෂය සඳහා රජයේ ප්‍රතිපාදන	35,462,800.76	35,462,800.76
	එකතුව	**641,772,800.76**	**1,216,680,037.76**

මගේ අංකය
எனது இல.
My No. } සීඕටී/ඒ/එස්එල්ටීබී/එෆ්ඒ/2022/02

මබේ අංකය
உமது இல.
Your No. }

දිනය
திகதி
Date } 2023 ජූනි 09 දින

සභාපති
ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය ව්‍යාවනය

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය ව්‍යාවනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

1.2 මතය ව්‍යාවනය සඳහා පදනම

(අ) 2021 දෙසැම්බර් 31 දිනට මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ප්‍රත්‍යාගණන සංචිතය ලෙස ගිණුම් ගත කර තිබූ රු.5,054,000,000 ක වටිනාකම සහ බොල් ණය සඳහා වෙන් කිරීම් ලෙස සටහන් කර තිබූ රු.39,713,200 ක වටිනාකමෙහි ශුද්ධ වටිනාකම වූ රු.5,014,286,800 ක වටිනාකම මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙන් අත්හැර තිබීම හේතුවෙන් 2021 දෙසැම්බර් 31 දිනට ශුද්ධ මුදල් හා

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34
+94 11 2 88 72 23
ag@auditorgeneral.gov.lk
www.naosl.gov.lk

මුදල් සමාන දෑවල ශේෂය රු.2,790,675,691 ක අයිරාවක් බවට පත්ව තිබුණි. ඒ අනුව 2022 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන ශේෂය ද රු.1,709,451,775 ක අයිරාවක් විය. එබැවින් 2022 දෙසැම්බර් 31 දිනට මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මුදල් හා මුදල් සමාන දෑවල වටිනාකම රු.5,014,286,800 කින් අධිගනණය වී තිබූ බව නිරීක්ෂණය විය.

(ආ) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ බස් රථ පුනරුත්ථාපනය සඳහා මහා භාණ්ඩාගාර වැය ශීර්ෂ 436-02-03-01-2201-12 යටතේ 2022 වර්ෂය සඳහා වෙන් කර තිබූ රු.මි.750 ක මුදලින් මණ්ඩලය විසින් බස් රථ පුනරුත්ථාපනය සඳහා වැය කරන ලද රු.606,310,000 ක මුදල ප්‍රාග්ධනගත කර වාර්ෂිකව ක්ෂය කිරීමකින් තොරව මුළු මුදල වාර්ෂික පාඩුව වූ රු.157,553,197 ට දීමනා හා සහනාධාර යටතේ ගැලපීම තුළින් 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා රු.484,219,604 ක ලාභයක් පෙන්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ නැගෙනහිර කලාපයේ අමතර කොටස් තොගයට අදාලව පමණක් රු.15,639,972 ක යල්පැන හා භාවිතයට ගත නොහැකි තොග පැවතිණි.

(ඈ) ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත අංක 16 (**LKAS** 16) දේපල, පිරියත හා උපකරණ ගිණුම් ප්‍රමිතයේ 37 වන ඡේදයට අනුව මණ්ඩලයේ දේපල, පිරියත හා උපකරණ කාණ්ඩ ගත කළ යුතු වුවත් 2022 දෙසැම්බර් 31 දිනට රු.75,842,984 ක්වූ හඳුනා නොගත් ස්ථාවර වත්කම්, වෙනත් වත්කම් යටතේ පෙන්වා තිබුණි. .

(ඉ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 38 හි 77 වගන්තිය අනුව පරිගණක මෘදුකාංග අස්පෘශ්‍ය වත්කමක් ලෙස වෙනම ගිණුම්ගත කල යුතු වුවත්, රු.36,426,972 ක් වටිනා පරිගණක මෘදුකාංග දේපල, පිරියත හා උපකරණ යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ඊ) ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත අංක 16 (**LKAS** 16) ට අනුව වත්කමක ක්ෂය කළ හැකි අගය එලදායී ජීව කාලය තුළ ක්‍රමානුකූලව ක්ෂය කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය තුළදී පරිගණක යන්ත්‍ර, බස් රථ එන්ජින්, ප්‍රවේශ පත්‍ර යන්ත්‍ර හා පරිගණක මෘදුකාංග රු.110,968,183 ක් වැඩියෙන් ක්ෂය කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ලාභය එම ප්‍රමාණයෙන් අඩු වී තිබුණි.

(උ) ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත අංක 07 (**LKAS – 07**) අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශ පිළියෙල කිරීමේදී මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ වාර්තා කළ යුතු සේවක කොටස් නිදහස් කිරීමට අදාළව ගෙවා තිබූ රු.77,033,188 ක් ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබුණි.

(උ) 2021 වර්ෂයට පෙර මිලදීගෙන තිබූ පරිගණක යන්ත්‍ර වලට අදාලව 2021 වර්ෂයේදී රු.1,077,778 ක් වැඩියෙන් ක්ෂය කර තිබුණද එම දෝෂය 2022 මූල්‍ය ප්‍රකාශන තුලින් නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

(එ) 2021 වර්ෂයේදී ප්‍රවේශපත්‍ර යන්ත්‍ර රු. 5,393,206 කින් වැඩියෙන් ක්ෂය කර තිබූ අතර, එම දෝෂය නිවැරදි කිරීම සඳහා 2022 මූල්‍ය ප්‍රකාශන වල එයින් රු. 52,850 ක් පමණක් ගැළපීම් කර තිබූ අතර, ඉතිරි වටිනාකම වූ රු.5,340,356 ක් සඳහා ගැළපීම් සිදු නොකිරීම හේතුවෙන් සමුච්චිත පාඩුව එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඒ) 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ කෙරීගෙන යන වැඩ යටතේ ගිණුම්ගත කර තිබූ ප්‍රමාණය රු.410,710 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශනය තුළ කාරක ප්‍රාග්ධනයට ගැලපීම් ලෙස රු.9,365,056 ක් දක්වා තිබුණි. ජංගම නොවන වත්කම් යටතේ ගිණුම්ගත කර තිබූ කෙරීගෙන යන වැඩ කාරක ප්‍රාග්ධන වෙනසට ගැලපීම තුළ කාරක ප්‍රාග්ධන ශේෂය ඉහත අගයෙන් වැඩි වී තිබුණි. එමෙන්ම වර්ෂයේ ප්‍රාග්ධන කාර්යය සඳහා වැය කරන ලද රු.410,710 ක මුදල ආයෝජන ක්‍රියාකාරකම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

(ඔ) 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ මුදල් හා මුදල් සමාන දෑ යටතේ ගිණුම්ගත කර තිබූ රු.2,311,836,019 ක ඉතිරි කිරීමේ ගිණුම් ශේෂය කටුබැද්ද, මහරගම, මට්ටක්කුලිය හා ගාල්ල යන ඩිපෝවන්හි ඉතිරි කිරීම් ගිණුම්වල ශේෂ හා සංසන්දනය කිරීමේදී සමුච්චිත ශේෂය ලෙස රු.1,236,332 ක මුදලක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඕ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉඩම් හා ගොඩනැගිලි වල ප්‍රත්‍යාගණිත වටිනාකම් පිළිවෙලින් රු.18,894,925,500 ක් හා රු.2,292,972,501 ක් වශයෙන් එකතුව රු.21,187,898,001 ක් වී තිබුණි. නමුත් දේපල පිරියත හා උපකරණ සටහනෙහි ගොඩනැගිලි යටතේ පෙන්වා තිබූ ප්‍රත්‍යාගණන වටිනාකම වූ රු.2,300,199,459 ක අගය සමාලෝචිත වර්ෂයේ එකතු කිරීමක් ලෙස ගිණුම්ගත කර තිබූ අතර සමාලෝචිත වර්ෂය තුළදී ගොඩනැගිලි නව එකතු කිරීම් වටිනාකම වූ රු.7,226,958 ක වටිනාකම දේපල, පිරියත හා උපකරණ සටහනෙහි ගොඩනැගිලි යටතේ දක්වා නොතිබුණි.

(ක) ඉඩම් හා ගොඩනැගිලි ප්‍රත්‍යගණන ලාභය ගණනය කිරීමේදී 2022 දෙසැම්බර් 31 දිනට සමුච්චිත ක්ෂය වටිනාකමට ප්‍රවර්ථන වර්ෂයේ ගොඩනැගිලි ශේෂයට අදාළ ක්ෂය වටිනාකම වූ රු.9,705,106 ක අගය එකතු කර ප්‍රත්‍යගණන ලාභය ගණනය කර නොතිබූ අතර, 2022 දෙසැම්බර් 31 දිනට ගණනය කරන ලද ප්‍රත්‍යාගණන ලාභය රු.20,976,927,250 ක් විය යුතු වූවත් 2022 දෙසැම්බර් 31 දිනට හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනයෙහි සංචිත යටතේ පෙන්වා

තිබූ ප්‍රත්‍යාගණන ලාභය රු.20,985,508,217 ක් විය. ඒ අනුව ප්‍රත්‍යාගණන ලාභය රු.8,580,967 කින් වැඩියෙන් පෙන්වා තිබුණි.

(ඛ) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ වේරහැර මධ්‍යම වැඩපලට අයත්ව තිබූ ශ්‍රී ලංකා යුධ හමුදාවේ කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලීය ශික්ෂණ රෝහල හා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව පිහිටි ඉඩම්වල වටිනාකම රු.මිලියන 6,226 කට තක්සේරු කර තිබූ අතර, එම වටිනාකම සඳහා ආරක්ෂක අමාත්‍යාංශය විසින් රු.මිලියන 5,054 ක් ගෙවීමට එකඟ වී තිබුණි. එම මුදලින් රුපියල් මිලියන 4,954 ක් 2021 දෙසැම්බර් 31 වන විට කොටස් වශයෙන් මහා භාණ්ඩාගාරය මගින් ශ්‍රී ලංගම වෙත ගෙවා තිබුණි. ඒ අනුව මෙම වත්කමේ තක්සේරු වටිනාකම වන රු. මිලියන 6,226 හා වත්කම් පැවරීමෙන් සිදු වූ පාඩුව වන රු.මිලියන 1,172 ක වටිනාකම ගිණුම්වල අනාවරණය කර නොතිබුණි.

(ග) රත්මලාන ඉන්ධන පිරවුම්හලේ දෛනික විකුණුම් වාර්තා අනුව සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ඩීසල් විකුණුම් ආදායම රු.1,554,296 ක් වැඩියෙන් හා පෙට්‍රල් විකුණුම් ආදායම රු.12,338,750 ක් අඩුවෙන් පෙන්වා තිබීම හේතුවෙන් ඉන්ධන අලෙවියෙන් ලද මුළු ශුද්ධ ආදායම රු.10,784,454 කින් අඩුවෙන් පෙන්වා තිබුණි.

(ඝ) රත්මලාන ඉන්ධන පිරවුම්හලේ මාසිකව සකස් කරනු ලබන දෛනික විකුණුම් විස්තරයට අනුව මාසය අවසානයේ ඉතිරි ඉන්ධන තොගය, සත්‍ය ඉන්ධන තොගය හා සංසන්දනය කිරීමේදී රු.4,876,320 ක වටිනාකමින් යුත් ඩීසල් ලීටර් 15,421.96 ක හා රු.2,647,897 ක වටිනාකමින් යුත් පෙට්‍රල් ලීටර් 8,349.46 ක ඌණතාවය හේතුවෙන් එකතුව රු.7,524,217 ක වටිනාකමින් යුත් වාර්ෂික අවසන් තොගය අඩුවෙන් පෙන්වීම තුළ සමාලෝචිත වර්ෂයේ ලාභය එම ප්‍රමාණයෙන් අඩුවෙන් නිරූපණය වන බව නිරීක්ෂණය විය.

(ච) 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ එකතු වටිනාකම රු.11,384,538,382 ක් වූ වත්කම්, බැරකම් හා බැංකු ශේෂ වල ඇතුළත් රු.1,290,782,782 ක වටිනාකමින් යුත් ක්‍රියාත්මක නොවන ගිණුම් ශේෂ සඳහා ශේෂ තහවුරු කිරීම් සහ විස්තරාත්මක උප ලේඛන ද, රු.4,156,211,492 ක වටිනාකමින් යුත් කොටස් ප්‍රාග්ධනය සඳහා කොටස් සහතික සහ ශේෂ සනාථ කිරීම් ද, රු.156,195,337 ක වටිනාකමින් යුත්, ස්ථාවර වත්කම් සඳහා වත්කම් වර්ගය හා විස්තරාත්මක උප ලේඛන ද, රු.753,363,548 ක වටිනාකමින් යුත් ස්ථාවර තැන්පතු සහ ආයෝජන වල ස්ථාවර තැන්පත් සහතික පත් ද, රු.4,571,242,599 ක වටිනාකමින් යුත් වෙළඳ ණයහිමියන් පිළිබඳ විස්තරාත්මක උප ලේඛන හා ශේෂ සනාථ කිරීම් ද, රු.89,191,198 ක වටිනාකමින් යුත් වෙළඳ ණයගැතියන් හා මාර්ගස්ථ මුදල් සඳහා ශේෂ සනාථ කිරීම් හා විස්තරාත්මක උප ලේඛන ද, රු.267,951,474 ක වටිනාකමින් යුත් ඉදිරියට

ගෙවූ වියදම් සඳහා කාල විග්‍රහයන් හා සබරගමුව හා නැගෙනහිර ප්‍රාදේශික වලට අයත් ජංගම ගිණුම් 23 කට අදාළ රු.7,551,643 ක හර ශේෂ සහ රු.92,048,309 ක බැර ශේෂ සඳහා බැංකු සැසඳුම්, බැංකු ප්‍රකාශ හා ශේෂ සනාථ කිරීමේ ලිපි ද විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඡ) 2022 දෙසැම්බර් 31 දිනට වෙළඳ ණයහිමි ශේෂය තුළ හා වෙනත් ණයහිමි ශේෂය තුළ වසර 02 ක කාලය ඉක්ම වූ පිළිවෙලින් රු.1,495,204,034 හා රු.90,864,377 ක් වශයෙන් එකතුව රු.1,586,068,411 ක් වූ නොපිය වූ ණය ශේෂයක් තිබුණි.

(ට) 2022 දෙසැම්බර් 31 දිනට රු.3,522,347,457 ක් වූ වෙළඳ ණයහිමි ශේෂය තුළ ඉන්ධන පිරවුම්හල් වල පැවති රු.21,698,022 ක හර ශේෂයක් ඇතුළත් කිරීම හේතුවෙන් ගිණුම්ගත කර තිබූ ණයහිමි ශේෂය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඨ) සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට දේශීය මිලදී ගැනීම් අත්තිකාරම් ගිණුමෙහි රු.1,378,085,248 ක ශේෂයක් පැවති අතර, ඒ සඳහා උප ලේඛන ලබා නොදීම හේතුවෙන් එහි නිරවද්‍යතාවය තහවුරු කර ගැනීමට නොහැකි වූ අතර, ඉන් රු.1,373,773,207 ක ශේෂයක් වසර 02 ත් 10 ත් අතර කාලයක සිට පැවත එන බව අනාවරණය විය.

(ඩ) මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ පෙර වර්ෂ ගැලපීම් ලෙස රු.277,733,205 ක් පෙන්වා තිබූ අතර ගිණුම් සටහන් වල සහ ඒකාබද්ධ ශේෂ පිරික්සුමේ මෙම ශේෂය රු.335,325,734 ක් ලෙස සටහන් කර තිබුණි. ඒ අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ පෙර වර්ෂ ගැලපීම් ලෙස රු.57,592,529 ක් අඩුවෙන් සටහන් වී තිබූ බව නිරීක්ෂණය විය.

(ඪ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වෙනත් ජංගම නොවන බැරකම් යටතේ රු.1,860,824,837 ක නිරවුල් නොකළ ශ්‍රී ලංගම සේවක අර්ථ සාධක අරමුදල් ලෙස ගෙවිය යුතු ගිණුම් ශේෂයක් පෙන්වා තිබූ අතර, එම ශේෂය වසර 06 කට වැඩි කාලයක සිට පැවත එන ශේෂයක් බව නිරීක්ෂණය විය. කෙසේ වෙතත් එවැනි සේවක අර්ථසාධක මුදලක් ගමනාගමන මණ්ඩලය විසින් සේවක අර්ථසාධක අරමුදලට සත්‍යවශයෙන්ම ගෙවිය යුතු ශේෂයක් බව සනාථ කර ගැනීම සඳහා වූ කිසිදු සාක්ෂියක් විගණනය වෙත ඉදිරිපත් නොවිය.

(ත) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ සේවක අර්ථසාධක අරමුදලට දායක වීම් ලෙස ගෙවීම් නොකළ ශේෂය රු.256,503,445 ක් වූ අතර එම ශේෂය තුළ වසර 10 ට වැඩි රු.37,041,436 ක් ද, වසර 05 ත් 10 ත් අතර රු.191,712,461 ක ශේෂයක් සහ වසර 02 ත් 05 ත් අතර රු.7,850,445 ක ශේෂයක් ද තිබූ බව නිරීක්ෂණය විය. කෙසේ වෙතත් මණ්ඩලය විසින් පවත්වාගෙන යන සේවක අර්ථසාධක අරමුදල සඳහා දායක මුදල් ගෙවූ දත්ත අනුව

තවදුරටත් හඳුනා නොගත් බැර ශේෂය ගෙවීම් කළ යුතු සත්‍ය බැර ශේෂයක් ද යන්න පිළිබඳව විගණනයේදී තහවුරු කර ගත නොහැකි විය.

(ඵ) 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශනයේ වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු වියදම් යටතේ පෙන්වා තිබූ මෙහෙයුම් නොවන ගිණුම් 13 කට අදාලව රු.1,084,753,124 ක වටිනාකමින් යුත් ශේෂයක් පැවති බව නිරීක්ෂණය විය.

(ද) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සතු ඩිපෝ 36 ක තිබූ රු.23,348,867 ක හර ශේෂ සහ රු.165,336,690 ක අයිරා ශේෂ සහිත ජංගම ගිණුම් 40 ක් වෙනුවෙන් බැංකු ප්‍රකාශන විගණනයට ඉදිරිපත් නොකෙරුණි. ඒ හේතුවෙන් එකී ජංගම ගිණුම් වලට අදාළව සකස් කර තිබූ බැංකු සැසඳුම් ප්‍රකාශන වල නිරවද්‍යතාවය පිළිබඳව විගණනයේදී සෑහීමකට පත්විය නොහැකි විය.

(ධ) ගිංතොට පෙට්ටිගලවත්ත ප්‍රාදේශීය වැඩපල විසින් මහජන බැංකුවේ පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුමට අදාලව රු.10,889,598 ක තැන්පත් කළ නමුත් නිෂ්කාශණය නොවූ ශේෂයක් හා රු.11,419,020 ක නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ ශේෂයක් තිබූ අතර, එම ශේෂයන් 2021 වර්ෂයේ සිට පැවත එන අතර, එම අගයන් හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

(න) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සතු රත්මලාන හා ඔරුගොඩවත්ත ඉන්ධන පිරවුම්හල් දෙකෙහි ජංගම ගිණුම් තුළ 2022 දෙසැම්බර් 31 දිනට රු. 5,737,177 ක හා රු. 42,547,041 ක හර ශේෂයන් පැවතියද, එම ගිණුම්වලට අදාළ 2022 වර්ෂය සඳහා වූ කිසිදු තොරතුරක් විගණනය සඳහා ඉදිරිපත් නොවීය. එසේම 2018 වර්ෂයේ සිට කිසිදු මෙහෙයුම් කටයුත්තක් සිදු නොවන ඔරුගොඩවත්ත ඉන්ධන පිරවුම්හල විසින් ලංකා බැංකුවෙහි පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුමෙහි රු.මිලියන 42 කට අධික මුදලක් කිසිදු පොලී ආදායමක් නොලබා ජංගම ගිණුමක් තුළ තබා ගැනීම හේතුවෙන් මණ්ඩලයට ලබා ගත හැකිව තිබූ පොලී ආදායමක් අහිමි වී තිබූ බව නිරීක්ෂණය විය.

(ප) මට්ටක්කුලිය ඩිපෝව විසින් මහජන බැංකුවේ පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුමට අදාලව 2022 දෙසැම්බර් 31 දිනට සකස් කරන ලද බැංකු සැසඳුමට අනුව මුදල් පොතෙහි බැංකු ශේෂය ලෙස රු.20,109,442 ක අයිරාවක් පෙන්නුම් කළද එය අවසන් ගිණුම්වල රු.9,184,280 ක අයිරා ශේෂයක් ලෙස පෙන්වා තිබුණි. එම නිසා අවසන් ගිණුම්වල බැංකු අයිරා ශේෂය රු. 10,925,162 ක් අඩුවෙන් දක්වා තිබූ බව නිරීක්ෂණය විය.

(එ) සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට යන්ත්‍ර උපකරණ, මෝටර් වාහන, කාර්යාල උපකරණ, පරිගණක යන්ත්‍ර, බස් රථ, ප්‍රවේශ පත්‍ර යන්ත්‍ර හා වෙනත් වත්කම් වලට අදාලව අවසන් ගිණුමේ දක්වා තිබූ ශේෂය රු.13,615,181,245 ක් වූ අතර උප ලේඛනයන්ට අනුව ශේෂය රු.10,926,969,902 ක් වූයෙන් ශේෂ අතර රු.2,688,211,342 ක වෙනසක් පැවතිය ද එය නිවැරදි කිරීමට පියවර ගෙන නොතිබුණි.

(බ) හැටන් ඩිපෝවේ රු.14,969,516 ක වටිනාකමින් යුත් ටයර් 533 ක බින්කාඩ් පත් යාවත්කාලීන නොකිරීම සහ ටයර් පිළිවෙලකට ගබඩා නොකිරීම නිසා 2022 දෙසැම්බර් 31 දිනට පැවති තොග ශේෂය භෞතිකව පරීක්ෂා කිරීමට නොහැකි විය.

(භ) 2021 වර්ෂය තුළදී රිය අනතුරු සම්බන්ධයෙන් ගොනු කර තිබූ නඩු 297 කින් 77 ක් සඳහා වන්දි වශයෙන් රු.11,832,191 ක මුදලක් ද, කාර්මික ආරවුල් සම්බන්ධ නඩු 22 ක් සඳහා නිසි පරිදි පෙනී නොසිටීම හේතුවෙන් හා පවරන නඩු වල තාක්ෂණික හා කළමනාකරණ දෝෂ හේතුවෙන් රු.1,830,747 ක මුදලක් වන්දි වශයෙන් ගෙවීමට ද, මණ්ඩලයේ සේවකයන් සේවයෙන් පහ කිරීම සම්බන්ධ අවසන් වූ නඩු වෙනුවෙන් රු.2,439,370 ක් වන්දි වශයෙන් එකතුව රු.16,102,308 ක් ගෙවීමට නියම වී තිබුණි. නමුත් මේ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ගිණුම්වල සලසා නොතිබුණි.

ඉහත විස්තර කර ඇති පරිදි, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ඇතුලත් ප්‍රමාණාත්මක අයිතම විකල්ප ක්‍රම මගින් තහවුරු කිරීමට හෝ සත්‍යාපනය කිරීමට මට නොහැකි විය. මේ හේතුවෙන්, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සැකසෙන වටිනාකම් හෝ අයිතමයන් වල වාර්තාගත හෝ වාර්තා නොකළ වටිනාකම් හෝ ගනුදෙනු සම්බන්ධයෙන් කිසියම් ගැලපීමක් කිරීමට අවශ්‍ය දැයි මට නිශ්චය කිරීමට නොහැකි විය.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම්

නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය ප්‍රකාශනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍යයැයි සැලකෙන සියළු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා ලබාගෙන නොමැති අතර නිසි ගිණුම් වාර්තා මණ්ඩලය තබා තිබේද යන්න තීරණය කිරීමට මට නොහැකි විය.

2.1.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ මතය ප්‍රකාශනය සඳහා පදනම් කොටසේ (අ), (ඊ), (ක) සහ (ට) නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට මණ්ඩලය සම්බන්ධ වී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

ඇල්මේ ස්වාභාවය	නිරීක්ෂණ
සම්බන්ධිත පාර්ශවයන්	ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවය කරන නිලධාරියෙකු විසින් මණ්ඩලයට, වෙන් කළ වාහන කුලියට ලබා දුන් ආයතනය හරහා තම පෞද්ගලික වාහනය මණ්ඩලයට ලබා දී ඒ සඳහා මාසික කුලිය ලෙස රු.39,850 බැගින් 2020 ජනවාරි 22 දින සිට 2022 මැයි 31 දින දක්වා රු.1,116,331 ක මුදලක් ලබා ගෙන තිබූ බව නිරීක්ෂණය විය.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධිවිධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීති,රීති රෙගුලාසි හා විධානයට යොමුව	නිරීක්ෂණ
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
i. මුදල් රෙගුලාසි 105	පිරිවැය රු.1,041,195 ක් වූ හානි වූ මෝටර් වාහන සම්බන්ධයෙන් හා 2022 මැයි 09 දින සිදු වූ කලබලකාරී සිද්ධියේදී හානියට පත් බස් රථ හා වාහන වල වටිනාකම් වූ රු.12,136,724 ක මුදල සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාර කටයුතු කර නොතිබුණි.
ii. මුදල් රෙගුලාසි 225	සියළුම ගෙවීම් සඳහා අවශ්‍ය වවුචර් නියමිත ආකෘති පත්‍රවල නිවැරදි ලෙසත්, සම්පූර්ණ ලෙසත්, පුරවා ගෙවීම් සඳහා ඉදිරිපත් කළ යුතුවේ. නමුත් 2022 ජූලි මස 07 දින සිට 15 දින දක්වා අමතර කොටස් හා ඉන්ධන මිලදී ගැනීම සඳහා මට්ටක්කුලිය ඩිපෝව මගින් වෙක්පත් 14 කට ගෙවීම් කරන ලද රු.25,588,202 ක මුදලක්

සනාථ කිරීම සඳහා වූ ගෙවීම් වවුචර් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

iii. මුදල් රෙගුලාසි 387 — කිසිම රජයේ බැංකු ගිණුමකින් අයිරා ලබා ගැනීම තහනම් වුවත් මණ්ඩලය විසින් 2022 දෙසැම්බර් 31 දිනට රු.645,939,849 ක අයිරාවක් පවත්වාගෙන ගොස් තිබූ අතර, ඒ සඳහා අයිරා පොලිය ලෙස සමාලෝචිත වර්ෂයේදී රු.400,171 ක මුදලක් ගෙවා තිබුණි.

iv. මුදල් රෙගුලාසි 395 (ඇ) — බැංකු ගිණුමක් ඇති සෑම ආයතනයක් විසින්ම එක් එක් මාසය අවසානයේදී දී ඇති ගණුදෙනු තත්වය සම්බන්ධයෙන් ඊළඟ මාසයේ 15 වන දිනට පෙර බැංකු සැසඳුම් ප්‍රකාශන පිළියෙල කළ යුතු වුවත්, ප්‍රාදේශීය කාර්යාල 03 ක හා ඩිපෝ 03 ක මහජන බැංකුවේ හා ලංකා බැංකුවේ පවත්වාගෙන යන ගිණුම් 07 කට අදාළ බැංකු සැසඳුම් ප්‍රකාශන විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

v. මුදල් රෙගුලසි 395 (ඈ) — 2022 දෙසැම්බර් මස සකසන ලද බැංකු සැසඳුම් ප්‍රකාශන අනුව නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ රු.57,942,422 කට අදාළ ඩිපෝ 12 ක මුදල් නොවූ වෙක්පත් පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

vi. මුදල් රෙගුලාසි 396 (අ) **(i)** හා **(iii)** — වටිනාකම රු.5,407,762 ක් වූ පහත සඳහන් ඩිපෝ සහ ආයතනවල ගෙවීම් සිදුකළ වෙක්පත් 163 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

2022 දෙසැම්බර් 31 දින වන විට වලංගු කාලය මාස 06 ඉක්මවූ ඩිපෝව/ආයතනය	**වෙක්පත් සංඛ්‍යාව**	**වටිනාකම (රු.)**
නුවරඑළිය	05	37,114
කුලියාපිටිය	04	187,672
මට්ටක්කුලිය	02	525,012
ප්‍රාදේශීය කාර්යාල හා ඩිපෝවන්	139	1,906,117
මහනුවර දකුණ	01	2,237,831
ඌව සහ කොළඹ ප්‍රාදේශීය කාර්යාල හා ඩිපෝවන්	12	514,016
එකතුව	**163**	**5,407,762**

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතනය සංග්‍රහය

(i) XXV වැනි පරිච්ඡේදයේ 5.2 හා 5.3 වගන්තිය

වෘත්තීය සමිති කටයුතු සඳහා නිදහස් කරන ලද නිලධාරියෙකුගේ වැටුප් හා ජීවන වියදම් දීමනාව රජය විසින් ගෙවනු ලබන අතර, ඔහු රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවන්නෙක් නම් රජයේ දායක මුදල් කොටස සංගමය විසින් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවිය යුතුවේ. නමුත් එම මුදල් වෘත්තීය සමිති විසින් නොව මණ්ඩලය විසින් ගෙවනු ලබන බව නිරීක්ෂණය විය. එවැනි නිලධාරියෙකුට වැටුප් හා දීමනා වලට අමතර සේවය වෙනුවෙන් වෙනත් කිසිදු දීමනාවකට හිමිකම් නොමැති වුවත් 2022 දෙසැම්බර් දක්වා වෘත්තීය සමිති 07 ක නිලධාරීන් 28 දෙනෙකුට ප්‍රසාද දීමනා හා දිරි දීමනා ලෙස පිළිවෙලින් රු.1,053,100 හා 10,661,547 ක් වශයෙන් එකතුව රු.11,714,647 ක මුදලක් ගෙවා තිබුණි.

(ii) XXV පරිඡේදයේ 4.2. වගන්තිය

යථෝක්ත වගන්තියේ විධිවිධාන වලට පටහැනිව මණ්ඩලයේ වෘත්තීය සමිති 05 ක් වෙනුවෙන් වැඩිපුර සේවකයින් 12 දෙනෙකු වෘත්තීය සමිති කටයුතු සඳහා මුදාහැර තිබූ අතර, සමස්ථ ලංකා එක්සත් මෝටර් කම්කරු සමිතියේ සාමාජිකයෙකුට 2006 වර්ෂයේ සිට වැටුප් හා ප්‍රසාද දීමනා වශයෙන් රු.3,190,410 ක් මුදලක් ගෙවා තිබූ අතර, එම සමිතියේම තවත් නිලධාරියෙකු ද නිදහස් කර තිබූ අතර, ඔහුටද වැටුප් හා ප්‍රසාද දීමනා වශයෙන් රු.772,938 ක මුදලක් ගෙවා තිබුණි.

(iii) XXV පරිච්ඡේදයේ 6.1 වගන්තිය

වෘත්තීය සමිති කටයුතු සඳහා මුදාහරිනු ලබන නිලධරයන්ට තම වෘත්තීය සමිති කටයුතු සඳහා දිවයිනේ ඕනෑම ස්ථානයකට ගමන් කිරීම සඳහා හිමිකම පවතිනුයේ නිදහස් දුම්රිය ගමන් බලපත්‍ර හා මධ්‍යම ගමනාගමන මණ්ඩලයේ නිදහස් ප්‍රවේශ පත්‍ර පමණි. එසේ වුවද ආයතන සංග්‍රහයේ ප්‍රතිපාදන වලට පටහැනිව මණ්ඩලයෙන් වෙන් කර තිබූ වාහන 03 කට හා පෞද්ගලික වාහන 03 කට 2022 වර්ෂයේදී ඉන්ධන හා අළුත්වැඩියා වියදම් ලෙස මණ්ඩලයේ මුදලින් රු.4,782,305 ක මුදලක් වැය කර තිබුණි.

(ඇ) 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය

රාජකාරී සඳහා සේවයට වාර්තා කරන නිලධාරීන්ගේ පැමිණීම හා පිටවීම තහවුරු කිරීම සඳහා, ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා කළ යුතු අතර, තම රාජකාරියට අමතරව ඇමතුම් රාජකාරී වැනි නිශ්චිත රාජකාරී සඳහා කාර්යාලයට වාර්තා කරන නිලධාරීන් ද, ඔවුන්ගේ පැමිණීම ඇඟිලි සලකුණු යන්ත්‍ර මගින් සනාථ කළ යුතු වේ. නමුත් ප්‍රධාන කාර්යාලය, ප්‍රාදේශීය කාර්යාල හා ඩිපෝවන්හි 2019 වර්ෂයේ සිට පැමිණීම හා පිටවීම සටහන් කිරීම සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා කර නොතිබුණි. මේ හේතුවෙන් අතිකාල හා නිවාඩු දින වැටුප් ගෙවීම්වල නිරවද්‍යතාවය පිළිබඳව විගණනයේදී සෑහීමකට පත්විය නොහැකි විය. තවද ප්‍රධාන කාර්යාලයෙහි ඇති ඇඟිලි සලකුණු යන්ත්‍ර අළුත්වැඩියා කිරීම සඳහා 2022 වර්ෂයේදී රු.369,600 ක මුදලක් ද වැයකර ඇතත් ඒවා තවදුරටත් ක්‍රියාත්මක තත්වයට පත්කර නොමැති බව නිරීක්ෂණය විය.

(ඈ) රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED 1/2015

යටෝක්ත චක්‍රලේඛයේ 3.1 වගන්තියෙහි ඇතුළත් වගුවේ 4 වගන්තිය අනුව, 2006 වසරේ නිකුත් කරන ලද කළමණාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක MSD 30 ප්‍රකාරව HM 1-1 ගණයේ හෝ ඊට ඉහළ එම දෙපාර්තමේන්තුවෙන් අනුමත කරන ලද තනතුරක් දරණ වෙනත් ඕනෑම නිලධාරියෙකුට වර්තමාන සංශෝධනයට අනුව නිල වාහන සඳහා භාවිතා කිරීමට හිමිකම් ඇති ඉන්ධන ප්‍රමාණය ලීටර් 115 ක් වුවද පහත සඳහන් ඩිපෝ වල ඩිපෝ අධිකාරී ඇතුළු නිලධාරීන් භාවිතා කරන වාහන වලට 2022 වර්ෂයේ එම සීමාව ඉක්මවා ඉන්ධන ලබා ගෙන තිබූ අතර ඒ සඳහා වැය කර තිබූ මුදල රු.2,747,405 ක් විය.

තනතුර	ලබාගත් ඉන්ධන ප්‍රමාණය (ලීටර්)	සීමාව ඉක්මවා ලබාගත් ඉන්ධන ප්‍රමාණය (ලීටර්)	වටිනාකම (රු.)
ඩිපෝ අධිකාරී (හැටන්)	3,152	1,887	643,693
මූල්‍ය කළමණාකාර (කුරුණෑගල)	3,090	1,825	614,224
ඩිපෝ අධිකාරී (ගම්පහ)	4,535	3,155	1,042,464
ඩිපෝ අධිකාරී (නාවලපිටිය)	2,688	1,423	447,024
එකතුව	**13,465**	**8,290**	2,747,405

(ඉ)	1997 සැප්තැම්බර් 29 දිනැති අංක 15/97 දරණ පරිපාලන චක්‍රලේඛය	වෘත්තීය සමිති කටයුතු සඳහා පූර්ණ කාලීනව නිදහස් කරන සේවකයන් වසර 04 ක කාලයකින් පසු නැවත පූර්ණ කාලීනව නිදහස් කරනු ලබන්නේ නම් ඒ සඳහා ගරු අමාත්‍යවරයාගේ නිර්දේශය ලබා ගත යුතු වූවත්, වෘත්තීය සමිති 06 ක වසර 04 ක කාලය ඉක්ම වූ නිලධාරීන් 13 දෙනෙකු තවදුරටත් එම නීතියට පටහැනිව පූර්ණ කාලීනව නිදහස් කර තිබූ බව නිරීක්ෂණය විය.
(ඊ)	1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීම් පනත 6 (2) (අ)	මාසික වැටුප් ලබන සේවකයකු ඔහු විසින් අන්තිමට ලබා ගන්නා ලද මාසික වැටුපේ අනු ප්‍රමාණයට අනුව ආගණනය කරන ලද මාසික වැටුපෙන් අඩක් පාරිතෝෂික ලෙස ගෙවිය යුතු වුවත් 2005 වර්ෂයට පෙර සේවයට බඳවා ගත් සේවකයින් සඳහා පාරිතෝෂික ගෙවීමේදී ඔහු විසින් අවසන් වරට උපයා ගත් සම්පූර්ණ වැටුප වර්ෂ ගණනින් ගුණකර පාරිතෝෂික ගෙවා තිබූ අතර, පාරිතෝෂික ගෙවීමේදී සේවකයා විසින් අවසන් දිනට උපයා ගත් මාසික වැටුප සේවය කළ වසර ගණනින් ගුණකර ගෙවීම් කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී රු.319,689,152 ක මුදලක් පාරිතෝෂික වශයෙන් වැඩියෙන් ගෙවා තිබුණි.
(උ)	2006 සැප්තැම්බර් 22 දිනැති කළමනාකරණ චක්‍රලේඛ අංක 30/2006	ශ්‍රී ලංගම ප්‍රාථමික, මධ්‍යම හා ඉහළ කළමනාකාරිත්වය තුළ සේවය කරනු ලබන I ශ්‍රේණියේ සිට VIII ශ්‍රේණිය දක්වා වන නිලධාරීන්ගේ වැටුප් කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 2/2016 චක්‍රලේඛයේ වැටුප් කාණ්ඩ අනුව 2018.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි සංශෝධනය කිරීමට නියම කර ඇතත් 2022 දෙසැම්බර් 31 දින තෙක් I ශ්‍රේණියේ සිට VIII ශ්‍රේණිය දක්වා වූ නිලධාරීන් 3,050 කගේ වැටුප් අදාළ පියවරේ තබා සංශෝධනය කර නොනිබීම හේතුවෙන් වැටුප් හා දීමනා වශයෙන් ගෙවන ලද රු.1,077,109,440 ක මුදලෙහි නිරවද්‍යතාව විගණනයේදී තහවුරු කර ගත නොහැකි වේ.

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර මණ්ඩලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස හා

ඵලදායී ලෙස කාල සීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

(අ) ඔරුගොඩවත්ත ඉන්ධන පිරවුම්හල ඉදිකිරීම සඳහා මණ්ඩලය 2018 මාර්තු 20 වන දින පුද්ගලික සමාගමක් සමඟ රු.61,014,316 ක වටිනාකමට ගිවිසුමකට එළඹ තිබුණි. ගිවිසුම ප්‍රකාරව ඉදිකිරීම් කටයුතු 2018 ජුනි 30 දින නිම කළ යුතු වූවද 2023 මාර්තු වන විටද ඉදිකිරීම් කටයුතු අවසන් කර ඉන්ධන පිරවුම්හල භාවිතයට ගෙන නොතිබුණු අතර 2022 දෙසැම්බර් 31 දිනට කොන්ත්‍රාත්කරුට රු.32,118,352 ක මුදලක් ගෙවා තිබුණි. කෙසේ වෙතත් කොන්ත්‍රාත්කරු විසින් නියමිත පරිදි වැඩ නිම නොකිරීම හේතුවෙන් කොන්ත්‍රාත් ගිවිසුම අවලංගු කර කළ වැඩ පිළිබඳ තක්සේරු වාර්තාවක් සහ ඉදිරි වැඩ සඳහා ඇස්තමේන්තුවක් සකස් කරන ලෙස මධ්‍යම ඉංජිනේරු පිළිබඳ කාර්යංශයට (CECB) දන්වා ඇතත්, මේ දක්වා මෙම තක්සේරු වාර්තාව හා ඇස්තමේන්තුව ලබා දී නොතිබුණි. තව ද සිදුකරන ලද ස්ථානීය පරීක්ෂණයේදී ඉන්ධන පිරවුම්හලේ වහල මුළුමනින්ම දිරාපත් වීම ඇතුළු, කළ වැඩවල ප්‍රමිතිය පිළිබඳ සැලකිල්ලකින් තොරව හා සැලසුම්වලට අනනුකූල ලෙස කළ වැඩ සඳහා ගෙවීම් නිර්දේශ කර ගෙවීම් කිරීම හේතුවෙන් මේ වන විට මණ්ඩලයට රු.8,978,845 ක අලාභයක් දැරීමට සිදුව තිබුණි. එසේම 2022 දෙසැම්බර් 31 දිනට රු.11,565,320 ක් ගෙවා ගෙන්වන ලද ඩීසල් හා පෙට්‍රල් පොම්ප 07 ක් හා ජෙනරේටරයක් අනාරක්ෂිතව ගබඩා කර තිබූ අතර, ජෙනරේටරයේ වගකීම් කාලයද ඉක්මවා ගොස් තිබුණි.

(ආ) ගම්පහ ඩිපෝව මගින් 2022 අගෝස්තු මාසය තුළදී එකතු වටිනාකම රු.83,862,900 ක් වූ ලීටර් 13,200 ක බවුසර් 12 කින් සහ ලීටර් 6,600 බැගින් වූ බවුසර් 06 කින් ඩීසල් මිලදී ගැනීම සිදු කර තිබුණි. මෙම මිලදී ගැනීම්වලට අදාළව නිකුත් කළ ගෙවීම් වවුචර් වලට අදාළ ඉන්වොයිස් හෝ එහි පිටපත් අමුණා නොතිබූ අතර, එම වවුචර් පත්වලට සිදු කරන ලද ගෙවීම් පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් නොවීය.

(ඇ) පෙර ගෙවුම් කාඩ්පත් භාවිතය සම්බන්ධයෙන් වූ තාක්ෂණික අන්තවල දෙවන අන්තය එනම් Back End (මුදල් ගණුදෙනු හා ප්‍රවේශ හා සම්බන්ධවීමේ පද්ධතිය) හඳුන්වා දීම සඳහා 2022 වර්ෂය සඳහා රු.මිලියන 250 ක් වෙන් කර තිබූ අතර, මණ්ඩලය විසින් ගමනාගමන මණ්ඩල අවශ්‍යතාවය අනුව තාක්ෂණික පිරිවිතර සකස් කර විධිමත් පරිදි ටෙන්ඩර් කැඳවා ඒ සඳහා සැපයුම්කරුවකු තෝරා ගෙන නොතිබූ අතර, ගමනාගමන කොමිෂන් සභාව මගින් ටෙන්ඩර් කැඳවා තෝරාගත් සැපයුම්කරුවකු සමඟ 2021 ජුනි 29 දින කොන්ත්‍රාත්තුව සඳහා ගිවිසුම් ගත වී තිබුණි. ඒ අනුව මුළු කොන්ත්‍රාත් වටිනාකම රු.3,900,000 ක් විය. නමුත් එම මුදලින් රු.1,500,000 ක් පද්ධතිය මිලදී ගැනීමට සහ වසරක වගකීම් කාලයෙන් පසු එළඹෙන වසරකට රු.800,000 බැගින් වූ සේවා ගිවිසුම් 03 කට යොමු වීමට තීරණය කර තිබුණි. නමුත්

ව්‍යාපෘතිය අවසන් කිරීමට පෙරම මෘදුකාංග ව්‍යාපෘති මුදල වන රු.1,500,000 ක් සඳහා ගැණුම් ඇණවුමක් නිකුත් කර එකී මුදල 2022 වර්ෂයේ වෙන් කිරීමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. කෙසේ වෙතත් මෙම ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීම සඳහා අවශ්‍ය ඉලෙක්ට්‍රොනික ටිකට් යන්ත්‍ර මිලදී ගැනීම සඳහා ප්‍රතිපාදන නොමැති වීම, භාවිතා කරන කාඩ්පත් භාවිතයේ පවතින ප්‍රායෝගික ගැටළු හා ව්‍යාපෘතිය තුළ මතු වූ තාක්ෂණික ගැටළු මත මෙම මෘදුකාංගය ශ්‍රී ලංගම වෙත ලබා ගැනීම තාවකාලිකව නවතා තිබූ බව නිරීක්ෂණය විය.

2.3 වෙනත් කරුණු

(අ) සි/ස අර්ථසාධක වත්කම් ලංකා සමාගම (Provident Property Lanka LTD) වෙත පවරා තිබූ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් රු.10,250,500,000 ක් වූ ඉඩම් වටිනාකම් සේවක අර්ථසාධක අරමුදලෙහි ආයෝජනය කර ශ්‍රී ලංගම වෙත මුදල් ලබා දීමට 2016 ජුනි මස 07 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතිය අනුව තීරණය කර තිබූ නමුත් එම සමාගම විසින් ඒ සඳහා මුදල් ගෙවා නොතිබුණි. ශ්‍රී ලංගම විසින් සමාගම වෙත පවරා දී තිබූ එම ඉඩම් ශ්‍රී ලංගම වෙත ආපසු පවරා ගැනීමට 2022 දෙසැම්බර් 31 දින දක්වා කටයුතු කර නොතිබුණි. මෙම ඉඩම් කට්ටි අතර, මණ්ඩලයේ ගමනාගමන මෙහෙයුම් සඳහා අත්‍යාවශ්‍ය කැස්බෑව, හෝමාගම, මහරගම, මොරටුව හා කටුබැද්ද ඩිපෝවලට අයත් වූ හෙක්ටයාර් 12.1566 ක් හා පිලියන්දල බස් නැවතුම්පලට අයත් හෙක්ටයාර් 0.3306 ක ඉඩමක්ද තිබූ බව නිරීක්ෂණය විය. දැනටමත් මෙම සමාගම අක්‍රිය සමාගමක් බවට සමාගම් රෙජිස්ට්‍රාර් මගින් ලබාගත් තොරතුරු අනුව තහවුරු විය. එසේ තිබියදී 2023 ජනවාරි 23 අමාත්‍ය මණ්ඩලය විසින් ගත් තීරණයකට අනුව එම සමාගම වෙත පවරා තිබූ ඉඩම් ඉල්ලුම්කාර පාර්ශව වෙත පවරා දී එම ඉඩම් වල වටිනාකම ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය වෙත ගෙවීමට තීරණය කිරීම හේතුවෙන් එම ඉඩම් කට්ටි නැවත ශ්‍රී ලංගම වෙත පවරා ගැනීම පිළිබඳ අවිනිශ්චිතතාවයක් නිර්මාණය වී ඇති බව නිරීක්ෂණය විය.

(ආ) 2022 වර්ෂයේ සේවකයින්ගේ රාජකාරී චක්‍ර අනුව වවුනියා ඩිපෝව මගින් මාර්ග 53 ක ධාවනය කිරීමට සැලසුම් කර තිබූ බස් රථ වලින් දෛනිකව ධාවනය කර තිබූ බස් රථ ප්‍රමාණය 34 ක් විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස මාර්ග 19 ක සේවා අඩාලව තිබුණි. ප්‍රමාණවත් රියදුරු සහ කොන්දොස්තර මහතුන් සිටියදී හා අවශ්‍ය ප්‍රමාණයට බස් රථ තිබියදී දෛනිකව රු.200,000 ක පමණ ආදායමක් උපයන වවුනියා සිට කොළඹ දක්වා ගමන් වාර 08 ක්, පොතුවිල් දක්වා ගමන්වාර 02 ක් සහ වවුනියා සිට මහනුවර දක්වා ගමන්වාර 02 ක් සඳහා බස් රථ යොදවා ධාවනයට එක් නොකිරීම හේතුවෙන් 2022 වර්ෂයේ රු.මිලියන 576 ක පමණ ඇස්තමේන්තුගත ආදායමක් අහිමි වී තිබූ බව නිරීක්ෂණය විය.

(ඇ) මණ්ඩලය විසින් 2022 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව දෛනිකව බස් රථ 5,794 ක් ධාවනය කරවීමට සැලසුම් කර තිබුණි. එම කාර්යය ඉටු කිරීම සඳහා අවශ්‍ය එන්ජින් කට්ටල 840 ක් වාර්ෂිකව අළුත්වැඩියා කර ධාවනයට යෙදවීමට සැලසුම් කර තිබූ අතර, ඒ සඳහා භාණ්ඩාගාර හා ශ්‍රී ලංගම ප්‍රතිපාදන රු.මිලියන 661.50 ක් වෙන් කර තිබුණි. නමුත් මණ්ඩලය විසින් අළුත්වැඩියා කර තිබූ බස් රථ ප්‍රමාණය 254 ක් වන අතර, ඒ සඳහා වැය කර තිබූ මුදල රුපියල් මිලියන 77.13 ක් විය. ඒ අනුව අපේක්ෂිත නිමැවුම් ඉලක්කය 70% කින් පමණ පහළ යෑම තුළ ඉලක්කගත පරිදි බස් රථ ධාවනයට එකතු කර ගැනීමට නොහැකි වී තිබූ බව නිරීක්ෂණය විය.

(ඈ) පරණ බස් රථ අළුත්වැඩියා කර ධාවනයට එක් කිරීම අරමුණු කර ගෙන කුරුණෑගල, යටිනුවර, ගම්පහ හා මල්ලාකම් ප්‍රාදේශීය වැඩපොලවල් කේන්ද්‍ර කරගෙන පැරණි ගියර් පෙට්ටි 740 ක් අළුත්වැඩියා කර රථ ඇණිය ධාවන තත්වයේ පවත්වා ගැනීම සඳහා, නිෂ්පාදන ඒකකයට පිරිවැය හා පිරිවැයට 50% ක ලාභ ආන්තිකයක් සහිතව රුපියල් මිලියන 140.4 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණි. නමුත් 2022 වර්ෂය තුළ අළුත්වැඩියා කර තිබූ ගියර් පෙට්ටි ප්‍රමාණය 139 ක් වන අතර, ඒ සඳහා වැය කර තිබූ මුදල රුපියල් මිලියන 18.12 ක් විය. ඒ අනුව අපේක්ෂිත ඉලක්කයන් සපුරා තිබූ ප්‍රමාණය සියයට 19 ක් විය.

(ඉ) රථ ඇණිය ධාවන තත්වයේ පවත්වා ගැනීම සඳහා භාණ්ඩාගාර හා ශ්‍රී ලංගම ප්‍රතිපාදන යොදා ගනිමින් ප්‍රාදේශීය වැඩපල හා ඩිපෝ මගින් බස් බොඩි 300 ක් අළුත්වැඩියා කිරීම සඳහා 2022 වර්ෂයට රුපියල් මිලියන 238.5 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණද, සමාලෝචිත වර්ෂය තුළ අළුත්වැඩියා කර ධාවනයට එක් කර තිබූ බස් රථ ප්‍රමාණය 180 ක් පමණ විය.

(ඊ) බස් රථ ධාවනයට අවශ්‍ය ටයර් අවශ්‍යතා සපුරා ගැනීම සඳහා අම්පාර පිහිටුවා ඇති පෙරසවි ටයර් කර්මාන්ත ශාලාව මගින් වාර්ෂිකව පෙරසවි ටයර් 14,400 ක් රු.7,861ක ටයරයක ඇස්තමේන්තුගත ඒකක පිරිවැයකින් නිෂ්පාදනය කිරීමට සමාලෝචිත වර්ෂයේදී භාණ්ඩාගාර හා ශ්‍රී ලංගම රු.මිලියන 113.20 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණද රු. මිලියන 107.64 ක් වැය කර ටයර් 8,997 ක් පමණක් නිෂ්පාදනය කර තිබූ අතර ටයරයක් නිෂ්පාදනයට වැය වී තිබූ තත්‍ය පිරිවැය රු.11,964 වූයෙන් නිෂ්පාදිත ටයර් සඳහා ඇස්තමේන්තුගත පිරිවැය ඉක්මවා රු.36,914,691 ක් වැඩියෙන් වැය කර තිබුණි.

(උ) 2022 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව පැරණි බස් රථ අළුත්වැඩියා කර ධාවනයට එක් කිරීම අරමුණු කර පැරණි ස්ටාටර් මෝටර් 2040 ක්, පැරණි ඩිල්ටනේටර් 1200 ක්, පැරණි ඉන්ධන පොම්ප 1080 ක් හා පැරණි ඉන්ධන විදින 3000 ක් අළුත්වැඩියා කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 180 ක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබුණද

රු.මිලියන 10.36 ක් වැය කර 2022 වර්ෂයේදී ස්ටාටර් මෝටර් 14 ක්, ඉන්ධන පොම්ප 409 ක් හා ඉන්ධන විදින 1760 ක් පමණක් නිෂ්පාදනය කර තිබූ අතර මෙම අමතර කොටස් අළුත්වැඩියා කර භාවිතයට ගැනීමේ හැකියාව මණ්ඩලය සතුව තිබියදී ඒවා අළුත්වැඩියා කිරීමේ කටයුතු සිදු නොකර බාහිරින් මිලදී ගෙන තිබුණි. මේ සඳහා සමාලෝචිත වර්ෂය තුළ මණ්ඩලයේ කලාප 04 කින් පමණක් වැය කර තිබූ මුදල රු.1,205,210 ක් බව නිරීක්ෂණය විය.

(ඌ) 2022 වර්ෂය තුළ ශ්‍රී ලංගම අභ්‍යන්තර සේවක ශ්‍රමයෙන් හෝ බාහිර ආයතන මගින් ප්‍රධාන කාර්යාලය ඇතුළු ඩිපෝ 106 ක විවිධ කාර්යයන් 160 ක් සඳහා රු.මිලියන 142.04 ක් වෙන් කර තිබූ නමුත් එම කාර්යයන් ඉටු කර නොතිබූ බව නිරීක්ෂණය විය.

(එ) බස් රථ වලට අවශ්‍ය ඉන්ධන නිකුත් කිරීමේදී රියදුරු විසින් ඉදිරිපත් කරන ලොග් සටහන් පත්වල අදාළ ගනමනාන්තය සහිතව ඒ සඳහා අවශ්‍ය ඉන්ධන ප්‍රමාණය සටහන් කළ යුතු අතර. ඉන්ධන නිකුත් කරන නිලධාරියා විසින් අදාල ලොග් සටහන් පත්‍රිකාවේ සඳහන් ප්‍රමාණයට අනුව ඉර - 08 පත්‍රිකාවේ බස් රථයට යොදන ඉන්ධන ප්‍රමාණය හා බස් රථ අංකය සටහන් කළ යුතුය. නමුත් මහරගම හා ගම්පහ ඩිපෝවල 2022 අගෝස්තු මාසය තුල ලොග් සටහන්වල සටහන් නොකරන ලද රු.11,752,880 ක වටිනාකමින් යුත් ඉන්ධන ලීටර් 27,318 ක් ඉර - 08 පත්‍රිකාවේ සටහන් කර බස් රථවලට නිකුත් කලා සේ ගිණුම්ගත කර තිබුණි.

(ඒ) මහරගම ඩිපෝවේ 2022 වර්ෂයේ අගෝස්තු මාසයේ අවසන් දිනට පැවතිය යුතු ඉන්ධන තොග ප්‍රමාණය ලීටර් 326,772 ක් විය. නමුත් එදිනට ටැංකිවල තිබූ සත්‍ය ඉන්ධන තොගය ලීටර් 48,598 ක් ලෙස සටහන් කර තිබුණි. ඒ අනුව රු.119,614,820 ක් වටිනා ඉන්ධන ලීටර් 278,174 ක ඌණතාවයක් නිරීක්ෂණය වූ අතර, එම ඌණතාවය සඳහා හේතු විගණනයට ඉදිරිපත් නොවීය. මෙලෙස පවත්නා ඉන්ධන තොග ඌණතාවය වෙනුවෙන් මණ්ඩලය විසින්ද සමාලෝචිත වර්ෂයේ ගිණුම්වල රු.36,799,884 ක වෙන් කිරීමක් කර තිබුණි. එසේම මහරගම ඩිපෝවේ 2023 පෙබරවාරි 28 දිනට දෛනික එකතු මුදල් සේප්පුවේ තැන්පත් කර තිබූ අතර, 2023 මාර්තු 01 දින සිදු කරන ලද භෞතික මුදල් පරීක්ෂාවේදී සේප්පුවේ රඳවා තිබූ මුදලින් රු.63,510 ක ඌණතාවයක් අනාවරණය විය.

(ඔ) සමාලෝචිත වර්ෂයේ දී නුවරඑළිය ඩිපෝවේ ආපදා රථයක් සඳහා අසාමාන්‍ය ලෙස රු.1,756,902 ක් වටිනා ඉන්ධන ලීටර් 4,841 ක් සපයා තිබුණද අදාල ආපදා රථයේ මයිලෝ මීටරය ක්‍රියා විරහිත වීම නිසා සහ P-II ලේඛණය නිසි පරිදි නඩත්තු නොකිරීම නිසා කළ වැඩ හා ගමන් කළ ස්ථාන පිළිබඳවත්, ඉන්ධන පාරිභෝජනය සම්බන්ධව විස්තර විගණනට

ඉදිරිපත් නොවීම හේතුවෙන් ඉහත ඉන්ධන භාවිතය විගණනයේදී පිළිගැනීමට නොහැකි විය.

(ඕ) අවිස්සාවේල්ල ඩිපෝවෙන් දිගින් දිගටම ඉන්ධන ණයට ලබා දීම නිසා ඩිපෝ 13 කින්, ප්‍රාදේශීය කාර්යාල 05 කින්, ප්‍රධාන කාර්යාලයෙන් හා රුහුණු බස් සමාගමේ ප්‍රධාන කාර්යාලයෙන් රු.16,758,304 ක මුදලක් අයවීමට තිබූ බව නිරීක්ෂණය විය. හිඟ මුදල් අයවීමට නියමිතව තිබියදී දිගින් දිගටම ණයට ඉන්ධන නිකුත් කිරීම සිදු කර තිබූ අතර, අදාළ ණය මුදල් අයකර ගැනීම සඳහා කිසිදු ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණි.

(ක) කටුබැද්ද අධි සුඛෝපභෝගී සංචාරක ප්‍රවාහන සේවයට අයත් වටිනාකම රු.10,800,000 ක් වූ අධි සුඛෝපභෝගී බස් රථයක් අධිවේගී මාර්ගයේදී අනතුරකට ලක් වී අලුත්වැඩියාවන් සිදුනොකර ධාවන තත්වයෙන් ඉවත් කර තිබුණි. ඒ සඳහා පූර්ණ රක්ෂණාවරණයක් ලබාගෙන තිබුණද රක්ෂණ සංස්ථාවෙන් ලබාදී තිබූ කාලය තුළ බස් රථයෙහි අලුත්වැඩියාවන් සිදුකිරීමට ඩිපෝ අධිකාරි විසින් අපොහොසත්වීම නිසා හානි පූර්ණය කිරීම රක්ෂණ සංස්ථාව විසින් ප්‍රතික්ෂේප කර තිබුණි.

(ඛ) සෑම ඩිපෝවක් මගින්ම පාරිතෝෂික ගෙවීම් සඳහා දෛනිකව ලැබෙන මාර්ග ලේඛණ ආදායමෙන් රු.20,000 ක් හෝ රු.30,000 ක් වන ලෙස වෙන් කිරීමක් සිදු කරන බව නිරීක්ෂණය විය. ඒ අනුව පරීක්ෂාවට භාජනය කළ කළුතර ප්‍රාදේශීය කාර්යාලයේ එලෙස රඳවා ගත් රු.50,065,000 ක මුදලක් 2022 දෙසැම්බර් 31 දිනට ඔවුන්ගේ ජංගම ගිණුමේ රඳවා ගෙන තිබූ බව නිරීක්ෂණය විය.

(ග) 2018 වර්ෂයේ ධාවනය කරන ලද කිලෝමීටර් මිලියන 446 කට අදාලව ගෙවා ඇති මුළු අතිකාල වියදම රු.මිලියන 283 ක්වූ අතර ඒ අනුව 2018 වර්ෂයේ ධාවන කිලෝමීටරයකට අතිකාල වියදම සත 60 ක් විය. 2018 සිට 2022 වර්ෂය දක්වා වැටුප් අගය 100% කින් වැඩි වීම හේතුවෙන් ඊට සාපේක්ෂව අතිකාල වියදම ධාවන කිලෝමීටරයකට රු.1.20 ක් විය යුතු අතර ඒ අනුව 2022 වර්ෂයේ අතිකාල වියදම රු. මිලියන 566 කට වැඩි නොවිය යුතුවේ. නමුත් 2022 වර්ෂයේ අතිකාල වියදම රු. මිලියන 3,074 ක් වූයෙන් වැඩියෙන් ගෙවා ඇති අතිකාල මුදල රු. මිලියන 2,508 ක් වන බව නිරීක්ෂණය විය. ඒ අනුව අතිකාල ගෙවීම් විනිවිදභාවයෙන් තොර බවත්, අතිකාල පාලනය සම්බන්ධයෙන් කළමනාකරණය තම වගකීම නිසි පරිදි ඉටු කර නොමැති බවත්, ඇඟිලි සලකුණු යන්ත්‍ර අක්‍රිය වීමට ඉඩහැරීම අතිකාල පාලනයට සෘජුව බලපා ඇති බවත් නිරීක්ෂණය විය.

(ඝ) 2022 දෙසැම්බර් 31 දිනට වෙනත් ලැබිය යුතු ආදායමක් ලෙස පෙන්වා තිබූ රු.1,549,623,472 ක පොලිස් බලපත්‍ර ශේෂය තුළ වසර 10 ඉක්මවූ රු.44,957,258 ක් ද වසර 05 ත් 10 ත් අතර රු.91,395,964 ක ශේෂයක් ද වසර 02 ත් 05 අතර රු.120,493,842 ක ශේෂයක් පැවතිය ද එම ශේෂ අයකර ගැනීම සඳහා විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ච) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සතු රු.2,063,693,707 ක් වටිනා කල්බදු බස් රථ 433 ක් සමාලෝචිත වර්ෂය අවසාන දිනට දේපල, පිරියත හා උපකරණ තුළ ඇතුළත් ව තිබූ අතර, ඉන් රු.1,952,651,849 ක් පිරිවැය වූ බස් රථ 409 ක් බස් රථය අයත් ප්‍රාදේශිකය හා ඩිපෝවද හඳුනාගෙන නොමැති බවත් රු.96,896,702 ක් පිරිවැය වූ තවත් බස් රථ 21 ක් කුමන ඩිපෝවට අයත් ද යන්න හඳුනාගෙන නොමැති බව නිරීක්ෂණය විය. මෙම බස් රථ මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් යටතේ ලියාපදිංචි කර තිබුණද ඒවායේ ලියාපදිංචි අංක ස්ථාවර වත්කම් උප ලේඛනයේ දක්වා නොතිබුණි.

(ඡ) පහසුකම් හා තත්වය උසස් කිරීම තුළින් පිරිවැය පාලනය අරමුණු කර වැඩි ධාරිතාවයෙන් යුත් නවීන යන්ත්‍ර උපකරණ වලින් සමන්විත ටයර් පෙරසවි කිරීමේ කර්මාන්ත ශාලාව නවීකරණය සඳහා 2022 වර්ෂයට රු. මිලියන 50 ක් වෙන් කර තිබූ අතර, ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 69.4 ක් වී තිබුණි.. ඒ තුළින් දැනට පවතින නිෂ්පාදනාගාරයේ ධාරිතාවය වන ඒකක 15,000 ක් දක්වා දෙගුණ කිරීමට සැලසුම්කර තිබූ නමුත් එම කාර්යය ඉටු නොවීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී මණ්ඩලයේ කලාප 06 ක් මගින් පමණක් රු. 786,866,930 ක වටිනාකමින් යුත් පෙරසවි ටයර් 53,706 ක් මිලදී ගෙන තිබූ බව නිරීක්ෂණය විය. තවද කර්මාන්ත ශාලාවේ පවතින නිෂ්පාදන ධාරිතාවය උපරිම ලෙස උපයෝගී කරගෙන ටයර් පෙරසවි කිරීම කළ හැකි වූවත් අදාළ ප්‍රාදේශික හා ඩිපෝ වලින් පෙරසවි කිරීම සඳහා අවශ්‍ය ටයර් කර්මාන්ත ශාලාව වෙත එවීමට කටයුතු කර නොතිබුණි.

(ජ) පාරිතෝෂික පනත අනුව සේවයෙන් ඉවත් වූ සේවකයින් හට ඔවුනට හිමි පාරිතෝෂික මුදල ගණනය කර ඉවත් වූ දිනයේ සිට මසක් ඉකුත් වීමට පෙර ගෙවීම් කළ යුතු වේ. නමුත් එලෙස මසක් තුළ නිසි පරිදි ගෙවීම් සිදු නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී පාරිතෝෂික අධිභාර ලෙස රු.8,081,797 ක් ගෙවා තිබුණි.

(ඣ) සමාලෝචිත වර්ෂය අවසන් දිනට රු.මිලියන 10 ඉක්මවූ බැංකු ජංගම ගිණුම් 04 ක් විගණනයට නිරීක්ෂණය වූ අතර, කිසිදු පොලී ආදායමක් නොලබා ජංගම ගිණුම්වල රු.624,588,024 ක වටිනාකමක් පවත්වාගෙන යන බව නිරීක්ෂණය විය.

(ට) මණ්ඩලය විසින් පළාත් මට්ටමින් වායු විමෝචන මධ්‍යස්ථාන 09 ක් ඉදි කිරීම සඳහා අදාළ උපකරණ කට්ටල 2018 අප්‍රේල් 26 දින මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙහි වායු විමෝචන භාරකාර අරමුදල වෙතින් භාරගෙන තිබූ අතර, ඒ සඳහා එකී අරමුදල වෙතින් රු. මිලියන 22 ක් වැය කර තිබුණි. මෙම වායු විමෝචන මධ්‍යස්ථානවලට අදාළ සිවිල් වැඩ ඉදිකිරීම වෙනුවෙන් රු. මිලියන 89.84 ක ඇස්තමේන්තු මුදලින් 2022 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 27.96 ක මුදලක් වැය කර තිබුණි. මෙම වායු විමෝචන මධ්‍යස්ථාන 09 හි භූමිය ඇස්පෝල්ට් යොදා කාපට් කිරීම සඳහා 2018 අගෝස්තු 16 දින රු. මිලියන 49.9 කට මග නැහුම මාර්ග ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ සමාගම හා ගමනාගමන මණ්ඩලය ගිවිසුමකට එළඹ තිබූ නමුත් ඒ සඳහා දරණ ලද වියදම් විගණනය සඳහා ඉදිරිපත් නොවීය. දැනට මෙම වායු විමෝචන මධ්‍යස්ථාන ක්‍රියාත්මක නොවන අතර, වායු විමෝචන භාරකාර අරමුදල මගින් ලබා දී තිබූ රු. මිලියන 22 ක උපකරණ දිරාපත් වෙමින් පවතින බව නිරීක්ෂණය විය. තවද මෙම වායු විමෝචන මධ්‍යස්ථාන සඳහා ඉදි කරන ලද ගොඩනැගිලි වෙනත් කාර්යයන් සඳහා භාවිතා කර තිබූ අතර, උපකරණ කට්ටල සමඟ ලබාදුන් පරිගණක වෙනත් කාර්යයන් සඳහා යොදා ගෙන තිබුණි. ඒ අනුව වැය කරන ලද රු. මිලියන 49.96 ක මුදල සහ දරණ ලද අනෙකුත් වියදම් නිෂ්කාර්යය වියදමක් වී තිබුණි.

ඩබ්ලිව්.ජී.සී.වික්‍රමරත්න
විගණකාධිපති